# අධ්‍යාපන කළමනා

## கல்வி முகாமைத்துவம்

## EDUCATION MANAGEMENT


| | | |
|---|---|---|
| 15 වන කලාපය | இதழ் - 15 | Vol. 15 |
| දෙසැම්බර් 2005 | ஜுன்-டிசம்பர் | 2005 December |


ජාතික අධ්‍යාපන ආයතනය தேசிய கல்வி நிறுவகம் NIE Publications

2005 - දෙසැම්බර්
පහළොස් වන කලාපය
ஜுன்-டிசம்பர் இதழ் - 15
Vol. 15 - December

# අධ්‍යාපන කළමනා

## கல்வி முகாமைத்துவம்

## EDUCATION MANAGEMENT

අර්ධ වාර්ෂික ප්‍රකාශනය
அரை ஆண்டு வெளியீடு
BI ANNUAL

පාසල් කළමනාකරණ හා අධ්‍යාපන පරිපාලන දෙපාර්තමේන්තුව
අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා ගුරු අධ්‍යාපන පීඨය

අර්ධ වාර්ෂික ප්‍රකාශනය

ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

## ලේඛක වතගොත
## (ලිපි අනුපිළිවෙල අනුවය)

### 1. ආචාර්ය ඉන්දිරා ලීලාමණී ගිනිගේ

බී. එස්. සී. (ශ්‍රී ලංකා වි.වි.) අධ්‍යාපන දර්ශනපති (කොළඹ) අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා (එක්සත් රාජධානිය) පී. එච්. ඩී. (අධ්‍යාපන පරිපාලනය-කැනඩාව). දැනට ජාතික අධ්‍යාපන ආයතනයේ විද්‍යාව හා තාක්ෂණ පීඨයේ සහකාර අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කරයි.

### 2. ගොඩ්වින් කොඩිතුවක්කු

ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාය. ගුරුවරයකු මෙන් ම ගුරු උපදේශකවරයකු ලෙස ද සේවය කර ඇති මොහු, දැනට දර්ශනපති උපාධිය සඳහා අධි ප්‍රජානන මනෝ විද්‍යාව හා ලිවීම පිළිබඳ සුවිශේෂ පර්යේෂණයක නියැළී සිටියි.

### 3. ඩබ්ලිව්. එම්. සෝමරත්න

අධ්‍යාපනපති හා ශාස්ත්‍රපති උපාධිධාරියෙකි. දැනට ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ හා මාධ්‍ය දෙපාර්තමේන්තුවලට අනුයුක්ත උප ගුරුවරයෙක් ලෙස සේවය කරයි.

### 4. N. A. U. C. Munasinghe

Alumini of the Peradeniya University in B.A. Trained Certificate (Special), PGDE, PGDEM, M.Ed, M.A. (UK), School Based Management Training in Australia. He has functioned as a Master Teacher, SLPS Grade -I Principal and at present Chief Project Officer in Department of School Management, NIE at Meepe Campus. He is the Editor of Adyapana Kalamana.

### 5. Dr. Cesar M. Mercado

Dr. Cesar M. Mercado is Founding President of the Manila-based Development Consultants for Asia Pacific (DCAAP) a global training, research, development and consulting firm specializing in human development management (HDM)

### 6. එච්. ඒ. ගයානි ප්‍රින්ස්ලි

විද්‍යාවේදි උපාධිධාරිනියකි. කොළඹ දේවි බාලිකා විද්‍යාලයේ උසස් පෙළ විද්‍යා ගුරුවරියක් වන ඇය දැනට ජාතික අධ්‍යාපන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව හදාරන්නීය. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාධාරියක් වන ඇය අධ්‍යාපනපති උපාධි ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින්නීය.

### 7. වී. ආර්. එස්. මීටියාගොඩ

මහනුවර ශාන්ත සිල්වෙස්තර විදුහලේ විදුහල්පතිවරයාය. බී.ඒ., අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ට සාමාර්ථය) විද්‍යා විශේෂ පුහුණු සහතිකධාරියෙකි. දැනට ජාතික අධ්‍යාපන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (සති අන්ත) හදාරමින් සිටී.

### 8. උපාලි ගුණසේකර

කොළඹ රාජකීය විද්‍යාලයේ විදුහල්පතිවරයාය. අධ්‍යාපන පරිපාලන සේවය III පන්තියේ නිලධාරියෙකි. දැනට ජාතික අධ්‍යාපන ආයතනයේ පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා (සති අන්ත) පාඨමාලාව හදාරමින් සිටී.

### 9. විල්ෆ්‍රඩ් ජේ පෙරේරා

බී. ඒ. (පේරාදෙණිය), එම්. එස්. සී. (එඩින්බරෝ), පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා, පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණය හා පරිපාලන ඩිප්ලෝමා, විශේෂ අධ්‍යාපන පුහුණු, අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ ප්‍රමුඛ පෙළේ උපදේශකවරයෙකි. දැනට ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා ගුරු අධ්‍යාපන පීඨයේ සහකාර අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කරයි.

## අධ්‍යාපන කළමනා - 15 කලාපය

**පටුන** **පිටු**


1. පාසල් අධ්‍යාපන සැලසුම්කරණයට නව දැක්මක් 1-10
ආචාර්ය. අයි. එල්. ගිනිගේ

2. දරුවන්ටත්, දෙමාපියන්ටත් පාසල බරක් නොවිය යුතුය. (පාසල් පාදක කළමනාකරණ දර්ශනය හා ක්‍රියාකාරි සැලැස්ම පිළිබඳ ප්‍රත්‍යෙක අධ්‍යයනය) 11-42
ගොඩ්වින් කොඩිතුවක්කු - ඩබ්. එම්. සෝමරත්න

3. Rapid Monitoring : The KFIQ Approach : 60-69
Dr. Cesar M. Mercado

4. පාසල තුළ ඵලදායි හා කාර්යක්ෂම ගුරුවරයකුගේ කාර්ය භාරය 70-78
ටී. ආර්. එස්. මීටියාගොඩ

5. කළමනාකරුවා හා භාවමය බුද්ධිය 79-86
එච්. ඒ. ගයානි ප්‍රින්ස්ලි

6. සිසුන්ගේ සාර්ධර්ම සංවර්ධනයට විදුහල්පතිවරයෙකුගේ වැයමක් 87-92
උපාලි ගුණසේකර

7. පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා - 1994-95 පර්යේෂණ මාතෘකා 93-106
විල්ෆ්‍රඩ් ජේ. පෙරේරා

## උපදේශක මණ්ඩලය

මහාචාර්ය ජේ. ඩබ්ලිව්. වික්‍රමසිංහ මයා
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

විල්ෆ්‍රඩ් ජේ පෙරේරා මයා
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා ගුරු අධ්‍යාපන පීඨය

හේමසිරි රණසිංහ මයා
අධ්‍යක්ෂ (පාසල් කළමනාකරණ)
අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා ගුරු අධ්‍යාපන පීඨය

ඩී. අයි. එස්. විජේතුංග මිය
අධ්‍යක්ෂ (අධ්‍යාපන පරිපාලන)
අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා ගුරු අධ්‍යාපන පීඨය

## ADVISORY BOARD

Prof. J. W. Wickramasinghe
Director General
National Institute of Education

Wilfred J. Perera
Assitant Director General
Faculty of Leadership Development and Teacher Education

අධ්‍යාපන කළමනා ප්‍රකාශනයෙහි සෑම ලිපියක ම ඇත්තේ අදාළ කර්තෘවරුන්ගේ ස්වාධීන අදහස් වේ. කිසියම් ශාස්ත්‍රීය කාර්යයක් සඳහා මෙහි සඳහන් කරුණු ලබා ගැනීමේ දී මෙම කෘතියෙහි උද්ධෘතයක් බව සඳහන් කර උපුටා ගැනීමට අවසර ඇති බව සලකන්න.

අධ්‍යාපන කළමනා ආර්ධ වාර්ෂික ප්‍රකාශනයෙහි පළ කරවීම සඳහා එවන ලිපි හා මෙහි පළවන ලිපි පිළිබඳ ඔබේ අදහස් පහත දැක්වෙන ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක
අධ්‍යාපන කළමනා
පාසල් කළමනාකරණ හා අධ්‍යාපන පරිපාලන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මීපේ හන්දිය
පාදුක්ක.

**eMagazine**
Developed by,
Prithi Vidanagamachchi,
Chief Project Officer (Electronic Dissemination),
National Institute of Education,
Sri Lanka

මුද්‍රණය :
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම.

**අධ්‍යාපන කළමනා**

**අර්ධවාර්ෂිකය**

පහළොස්වන කලාපය

2005 - දෙසැම්බර්

# සටහන

දිගු නිහැඩියාවකින් පසු අධ්‍යාපන කළමනා 2004 වසරේ දී යළිත් නිකුත් කිරීමට හැකිවීම අප ලද භාග්‍යයකි. එසේ ගමන් ඇරඹූ අධ්‍යාපන කළමනා 2005 වසර පහළොස්වන කලාපය ද නිකුත් කරමින් ඉදිරියට ගමන් කිරීමට හැකිවීම පිළිබඳ අපට ඇත්තේ මහත් සතුටකි. කෙසේ වුව ද තවදුරටත් සඟරාවේ ගුණාත්මකබව හා ඵලදායිතාවය උපරිමය කරා ගෙන ඒම අපේ අදිටනයි. ඒ සඳහා නැවත නැවතත් ඔබගේ අගනා සහාය නිරතුරුව අපට ලැබිය යුතුය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ නායකත්ව සංවර්ධනය උදෙසා ඔබට ඉදිරිපත් කළ හැකි නව අදහස්, යෝජනා හා පර්යේෂණ සොයා ගැනීම් ආදිය මෙහි පළ කිරීමට ඔබට සළසා ඇති මහඟු අවස්ථාව ඔබ මඟ නොහරිනු ඇතැයි අප උදක්ම බලාපොරොත්තු වෙමු. මීළඟ කලාපයේ සිට තවදුරටත් සංවර්ධනාත්මක වෙනස්කම් සහිතව අධ්‍යාපන කළමනා නව මුහුණුවරකින් එළි දැක්වීම අපේ අදිටනයි.

සංස්කාරක.

# 1 පාසල් අධ්‍යාපනය සැලසුම්කරණයට නව දැක්මක්

ආචාර්ය අයි. එල්. ගිනිගේ

නව සහශ්‍රකය තුළ අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ වැඩසටහන් මාලාවේ පළමු පියවර ජාතික අරමුණු අටක් පදනම් කොට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. මෙම ජාතික අරමුණු පහත සඳහන් ආකාරයට කෙටියෙන් හඳුන්වා දිය හැකි ය.

බහුවාර්ගික සමාජයක් තුළ ශ්‍රී ලාංකීය අනන්‍යතාව ගොඩ නැංවීම.

ජාතික උරුමයේ යහපත් ලක්ෂණ ආරක්ෂා කර ගනිමින් වෙනස්වන ලෝකයේ අභියෝගවලට මුහුණ දීම.

සමාජ සාධාරණත්වය, ප්‍රජාතන්ත්‍රවාදී දිවි පැවැත්ම වැනි ප්‍රතිමාන සුරැකෙන පරිසරයක් නිර්මාණයකර පවත්වා ගෙන යාම.

පුරවැසි ප්‍රජාවගේ කායික හා මානසික යහපැවැත්ම තහවුරු කිරීම.

සමබර පෞරුෂයක අත්‍යවශ්‍ය අංග වශයෙන් නිර්මාණශීලීත්වය, ආරම්භක හැකියාව, විචාරාත්මක චින්තනය, වගකීම හා වගවීම වැඩිදියුණු කිරීම.

වැඩ ලෝකයේ සාර්ථකත්වය මගින් පුද්ගල හා ජාතික සංවර්ධනයට උරදිය හැකි මානව සම්පත් සංවර්ධනය කිරීම.

සංකීර්ණ වූ ද පෙරකීම අසීරු වූ ද තත්ත්ව යටතේ වෙනස්වීම් කළමනාකරණය කළ හැකි පිරිසක් ඇති කිරීම.

අන්තර් ජාතික ප්‍රජාව තුළ ගෞරවනීය ස්ථානයක් අත්පත්කර ගැනීම.

මෙම ජාතික අධ්‍යාපනික අරමුණු සාක්ෂාත්කර ගැනීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ විශාල වෙනසක් ඇති කළ හැකි නව අධ්‍යාපනික දර්ශනයක් පදනම් කර ගනිමින් පාසල් අධ්‍යාපනය යළි සැළසුම් කිරීම අවශ්‍ය වී තිබේ. අද අප සිටින්නේ කොතැන ද ? අනාගතයේ දී අප යා යුත්තේ කොතැනකට ද? යන කාරණා පැහැදිලි කර ගැනීමෙන් මෙය ආරම්භ කළ හැකි වේ. වර්තමාන අධ්‍යාපන ක්‍රමය යොමු වී තිබෙන්නේ පවත්නා තත්ත්වයන් සංරක්ෂණය සඳහායි. මෙතෙක් සොයා ගෙන ඇති දේ හැදෑරීමත්, ඒවා මතකයේ රඳවා ගැනීමත් මෙවැනි අධ්‍යාපනික ක්‍රමයක අත්‍යවශ්‍ය අංග වේ. එහෙත් ඉදිරියේ දී අපට අවශ්‍යවන්නේ අනාගතයට අවශ්‍ය තත්ත්වයන් ගොඩ නැගිය හැකි තරුණ පරපුරක් බිහිකිරීමයි. මෙවැනි අධ්‍යාපනික ක්‍රමයක් මුල් තැන දෙන්නේ දන්නා දේ සංස්කරණයට නැත්නම් වෙනස් කිරීමටයි. එසේම දැනටමත් සොයාගෙන ඇති දේ ඒ ආකාරයෙන් ම ඉගෙනීමට වඩා නොදන්නා දේ ගවේෂණයට උනන්දු වන පිරිස් ඇති කිරීමටයි.

කලක් තිස්සේ ක්‍රියාත්මක වූ විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක අහිතකර ප්‍රතිඵල එක්වරම බැහැර කිරීම ශ්‍රී ලාංකීය අධ්‍යාපනඥයින්ට පහසු කාර්යයක් නොවේ. යාන්ත්‍රික ව ඉගෙනීමටත්, විෂය කරුණු මතකයේ රඳවා ගැනීමටත්, එසේ මතක තබාගත් විෂය කොටස් විභාග ශාලාවේ දී වමාරා විභාග ජය ගැනීමටත් අද සිසුහු පුරුදුව සිටිති. විභාග මත



පදනම් වෙමින් සාර්ථක වන සිසුන් සතුව ඇත්තේ දැනුම, අවබෝධය වැනි ප්‍රජානන ක්ෂේත්‍රයට අදාළ පහළ මට්ටමේ මානසික කුසලතා කිහිපයක් පමණි. භාවිතය ගැන කථා කිරීමට මේ අය සමත් වුවත් උගත් දේ සැබැවින්ම යොදා ගැනීමේ හැකියාව ඔවුන් සංවර්ධනය කර ගෙන ඇත්තේ සීමිත වශයෙනි. වැඩ ලෝකයේ දී තබා එදිනෙදා ජීවිතයේදීවත් සාර්ථකවීමට මේ තත්ත්වය මොවුන්ට ඉඩ ලබා නොදේ. ගතික සමාජයක අභියෝග ජය ගැනීමට නම් පදනම් දැනුම් කොටස් මැනවින් ග්‍රහණය කර ගනිමින් නිපුණතා සංවර්ධනය කර ගැනීම බාල පරපුරට අත්‍යවශ්‍ය වේ. මේ ආකාරයෙන් සාක්ෂාත් කර ගන්නා විෂය නිපුණතා, චින්තන හැකියා හා සමාජ හැකියා සංවර්ධනය කර ගැනීමටත් ඒ මගින් ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දායකවීමටත් ඔවුන්ට ඉඩ සලසා දේ.

මේ සියලු කාරණා සලකා බලා නිපුණතා පාදක ප්‍රවේශයක් යටතේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීමට නව සහශ්‍රකයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යොමු වී තිබේ. මේ අනුව මුලින් ම නිපුණතා යනු මොනවා දැයි හඳුනා ගැනීම අවශ්‍ය වේ. දනුම, ආකල්ප, කුසලතා හා අන්තර් පුද්ගල හැකියා සමෝධානය කරමින් කාලයක් තුළ ඉගෙනුම් ලාභියෙකු සංවර්ධනය කර ගන්නා පුරුදු නැත්නම් ගති පැවතුම් නිපුණතා ලෙස අර්ථ දැක්විය හැකිය. යම් හැකියාවක් තනි ව ප්‍රදර්ශනය කළ හැකි පුද්ගලයෙකුට වඩා එම හැකියාව වෙනත් අය සමග කණ්ඩායමක් තුළ ප්‍රදර්ශනය කළ හැකි පුද්ගලයෙකු නිපුණයකු ලෙස දැක්වීම අර්ථවත් බව අද පෙනී ගොස් තිබේ. මේ අනුව සමාජ හැකියා ගණයට වැටෙන අන්තර්පුද්ගල හැකියා `නිපුණතා` යන පදය අර්ථ ගැන්වීමට යොදා ගැනේ.

විෂය ක්ෂේත්‍ර කිහිපයකට අදාළ නිපුණතා කිහිපයක් සලකා බලමින් නිපුණතා සංකල්පය තේරුම් ගැනීමට දැන් අපි උත්සාහ ගනිමු. අද

නිතර කථාබහට ලක්වන HIV / AIDS රෝගය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙයවන්නකු සංවර්ධනය කර ගත යුතු නිපුණතා තුනක් පහත සඳහන් ය.

HIV / AIDS රෝග ආසාදනයට ලක්විය හැකි පුද්ගලයින් හඳුනා ගනියි.

ආරම්භයේ සිට මේ දක්වා HIV / AIDS රෝගය ශ්‍රී ලංකාව තුළ විකාශය වූ ආකාර ගවේෂණය කරයි.

HIV / AIDS රෝගයට හේතුවන සාධක හා එහි ප්‍රතිවිපාක මහජනතාවට හඳුන්වා දීමට රෝගීන් පිළිබඳ සිද්ධි සකස් කරයි.

ඉහත සඳහන් වගන්තිවලට අනුව පෙනී යන්නේ නිපුණතාවක් යනු වර්තමානයට පමණක් සීමා වී යමෙකු නිරත වන කාර්යයක් නොවන බවයි. ජීවිත කාලය පුරා හෝ වෘත්තීය ජීවිතය පුරා උනන්දුවෙන් යුතු ව කෙනෙකු ප්‍රදර්ශනය කරන චර්යා රටා නිපුණතා නම් වේ. ඒ සඳහා දැනුම, ආකල්ප හා කුසලතා යන ක්ෂේත්‍ර තුන සමෝධානය විය යුතු ය. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට HIV / AIDS රෝගියෙකු හමු වූයේ කිනම් වර්ෂයක දී ද? මොහු කිනම් ජාතිකයෙකු ද? ඉන් අනතුරුව වර්ෂයෙන් වර්ෂය මේ රෝගයට ලක් වූ පුද්ගල සංඛ්‍යා වැඩි වූයේ කෙසේ ද? රෝග ආසාදිතයින් ශ්‍රී ලංකාවේ විවිධ පළාත් ඔස්සේ පැතිර ගොස් තිබෙන්නේ කවර ආකාරයෙන් ද? ලෝකයේ වෙනත් රටවල් සමග සන්සන්දනය කරන කළ මේ රෝගය සම්බන්ධ ව ශ්‍රී ලංකාවේ තත්ත්වය කෙබඳු ද? අනාගතයේ දී මේ රෝගය පිළිබඳ තත්ත්වය කෙසේ වෙනස් විය හැකි ද? යන ප්‍රශ්නවලට පිළිතුරු සොයන්නෙකු ඉහත දෙවන නිපුණතාව සංවර්ධනයට අවශ්‍ය පදනම් දැනුම ලබා ගනියි. දැනුම හිසට ආහාරයකි. හිස පෝෂණය කරන්නෙකි. හිසේ ඇතිවන වෙනස්කම් හදවතේ වෙනස්කම්වලට මුල පුරන බව රහසක් නොවේ. තමා ඉගෙන ගන්නා දේ අගය කිරීමට, ඒ පිළිබඳ විශ්වාසයන් ගොඩනගා ගැනීමට, එම අදහස් පිළිගැනීමට මෙවැන්නකු නිතැතින් ම යොමු වේ. ලද දැනුම හා සම්බන්ධ මනා ආකල්ප මේ වන විට ඉගෙනුම්ලාභියා තුළ ගොඩනැගී තිබේ. මෙසේ හදවත වෙනස්වීම නිසා ස්වේච්ඡාවෙන් කුසලතා ප්‍රගුණ කර ගැනීමට මොහු යොමුවෙයි. විවිධ ක්‍රමවලින් දැනුම් රැස් කරමින් HIV/AIDS රෝගය පිළිබඳ අනාගත තත්ත්ව සොයා බලයි. මෙසේ කාලයක් තුළ ගවේෂණාත්මකව සංවර්ධනය කරනු ලබන කුසලතා පසුකාලීනව එක් වී ජීවිත පුරුද්දක් ඔහු තුළ ගොඩ නැගේ. මේ ආකාරයට පුරුදු ඇතිකර ගත්තෙකු ජීවිත කාලය පුරා විෂයානු බද්ධ දැනුම ගවේෂණයට පෙළඹේ. එම දැනුම පරිහරණය කරමින් ශ්‍රී ලංකාවේ HIV/AIDS රෝග තත්ත්වය පිළිබඳ ව යාවත්කාලීන වේ. දැන් ඔහු යම්කිසි හැකියාවක් වර්ධනයකර ගෙන ඇත. මෙවැන්නකු රෝග තත්ත්වයන් සෙවීමට යොමුවන්නේ තනි ව නොවේ. කණ්ඩායමක වෙනත් අය ඇසුරු කරමින් අදාළ කාර්යය සාර්ථකව ඉටු කර ගැනීමට වෙහෙසේ. මේ වන විට වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම ඔහු නිපුණයෙකු බවට පත් වී තිබේ.

මීළඟට භාෂා විෂය ක්ෂේත්‍රය යටතට වැටෙන ` අවධානයෙන් සවන් දෙයි `යන නිපුණතාව සලකා බලමු. මෙයට ඇතුළත් වන දැනුම් කොටස් හඳුනා ගනිමු. අවධානයෙන් සවන්දීම යනු කුමක් ද? අවධානයෙන් සවන්දිය යුත්තේ කිනම් අවස්ථාවල දී ද ? අවධානයෙන් සවන් දෙන්නේ කෙසේ ද? අවධානය බිඳ වැටීමට හේතුවන සාධක මොනවා ද? අවධානය පවත්වා ගැනීමෙන් අත්පත් වන වාසි මොනවා ද? යනුවෙන් මෙම දැනුම් කොටස් විග්‍රහ කළ හැකි වේ. මේ ආකාරයෙන් කෙනෙකුගේ හිස පෝෂණය වන විට පුරුදු ඇති කිරීම පිළිබඳ ආකෘතියේ ‘K’ අකුරෙන් සංකේතවත් වන

දැනුම (Knowledge) නම් වූ පියවර සම්පූර්ණ වේ. ඊළඟට ඉගෙනුම්ලාභියා ලඟා වන්නේ 'A' අකුරෙන් සංකේතවත් වන ආකල්ප (Attitudes) නම් වූ දෙවන අවස්ථාවටයි. මේ පියවර ද සම්පූර්ණ වන විට ˳Sරු අකුරෙන් සංකේතවත් වන කුසලතා (Skills) නම් වූ තෙවැනි පියවරට යොමුවන ඔහු අවසාන වශයෙන් 'P' අකුරෙන් සංකේතවත් වන පුරුදු (Practices) වර්ධනය කර ගනී. KASP ආකෘතිය මෙසේ ක්‍රියාත්මක වන විට කලින් විද්‍යමාන නොවූ පුරුද්දක් ඉගෙනුම්ලාභියා තුළින් දෘශ්‍යමාන වේ. වෙනත් වචනයෙන් කියතහොත් KASP ආකෘතිය මතින් ඉගෙනුම්ලාභියා සක්‍රිය පුද්ගලයෙකු බවට පත් වී තිබේ.

ඔබ මෙතෙක් අධ්‍යයනය කළ KASP ආකෘතියට අනුව පුරුදු ඇතිකර ගන්නා තවත් අවස්ථා දෙකක් සඳහා නිදසුන් විද්‍යා හා ගණිත විෂයයන් ආශ්‍රයෙන් ද පෙන්වා දිය හැකි වේ. ` වියළීමෙන් ආහාර කල් තබා ගනියි ` යන්න විද්‍යා ක්ෂේත්‍රය ආශ්‍රයෙන් ගොඩනගා ගත හැකි නිපුණතාවකි. ˳ලාභ අලාභ විශ්ලේෂණය කරමින් තීරණ ගනියි˳ යන්න ගණිත විෂය ක්ෂේත්‍රය ආශ්‍රයෙන් ලියා දැක්විය හැකි නිපුණතාවකි. පරිරක්ෂණය කළ හැකි ආහාර වර්ග මොනවාද? එම ආහාර සුලභ වන්නේ කිනම් කාල වකවානුවල ද? එම ආහාර කල් තබා ගත යුත්තේ ඇයි? ඒ සඳහා වියළීමේ ක්‍රමය යොදා ගන්නේ කෙසේ ද? යන දැනුම් කොටස් මෙම නිපුණතාව සංවර්ධනය සඳහා ශිෂ්‍යයා ලබා ගත යුතු වේ. ලාභ හා අලාභ ප්‍රතිශත ලෙස ඉදිරිපත් කිරීමේ ක්‍රම, වට්ටම් හා කොමිස් පිළිබඳ දැනුම ගණිත නිපුණතාව සංවර්ධනය සඳහා දායක වෙයි. මේ දක්වා අප සලකා බැලූ KASP ආකෘතිය දැනුම මඟින් නිපුණතා ගොඩ නැංවීමේ ආකෘතියක් ලෙස හඳුන්වා දිය හැකි ය. වෙනත් වචනයෙන් කියතහොත් එය ඒත්තු ගැන්වීමේ ආකෘතියකි. (Persuasion Model). මෙහි ඒත්තු ගැන්වීම්



කාරකයා දැනුමයි. ලැබෙන දැනුම විචාරශීලීව සලකා බලා නිගමනවලට එළඹීමට මේ ආකෘතිය ඉගෙනුම්ලාභීන්ට ඉඩ ලබා දේ.

කුඩා ළමුන් තුළ නිපුණතා සංවර්ධනයට යොදා ගත හැකි මෙයට වෙනස් ආකෘතියක් ද හඳුන්වා දිය හැකි ය. බලකිරීමේ ආකෘතිය (Compulsion Model) නම් වූ මෙය අප කා තුළත් පුරුදු ඇති කිරීමට යම් යම් ප්‍රමාණවලින් දායක වී තිබේ. දිනපතා උදේ හවස අපි අපේ දත් පිරිසිදු කරමු. මේ පුරුද්ද අප වැඩිදෙනෙකු ගොඩ නගාගෙන තිබෙන්නේ වැඩිහිටියන්ගේ බලකිරීම නිසා නොවේ දැයි මදකට සිතා බලන්න. කුඩා කළ වැඩිහිටියන්ගේ ඕනෑ එපාකම් මත අපි දත් මැද්දෙමු. කාලයක් තුළ මෙසේ කටයුතු කරන විට එහි වාසි අපට ම අවබෝධ වන්නට ඇත. නොඑසේ නම් ගුරුවරුන්ගෙන් අසා හෝ පොත්පත් කියවා හෝ අප ඉගෙන ගන්නට ඇත. ඒ නිසා අදත් අපි දත් මදිමු. ජීවිත කාලය පුරා ඉදිරියට ද මේ චර්යාව ප්‍රදර්ශනය කරමු.

එහෙත් බලකිරීමේ ආකෘතිය වැඩිහිටියන් තුළ පුරුදු ඇති කිරීමේ දී සාර්ථක වන්නේ කලාතුරකිනි. පාඩම් සටහන් ලිවීම සඳහා යම් පාසල් ප්‍රධානියකු ස්වකීය ගුරු මණ්ඩලයට බලකරනවා යයි සිතමු. විදුහල්පතිගේ බලපෑම නිසා ගුරුවරුන් වැඩි පිරිසක් පාඩම් සටහන් ලිවීමට යොමුවනු ඇත. එහෙත් බලපෑම් ඇතිකරන පුද්ගලයාගේ මාරුවීම හෝ විශ්‍රාම යාම සමග මේ තත්ත්වය කෙමෙන් අභාවයට යාමට ඉඩ තිබේ. ආකල්ප සංවර්ධනයක් නොමැතිව බලකිරීම නිසා යම් කාර්යයකට හුරුවන පුද්ගලයින්, එම කාර්යය අතරමග අතහැර දැමීමට යොමුවීම සාමාන්‍ය තත්ත්වයකි. බාහිර බලපෑම ඉවත්වීමත් සමග එම චර්යාව පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නැති වී යාම මෙයට හේතු වේ. එහෙත් දැනුම මඟින් සංවර්ධනය වන යහපත් ආකල්ප නිසා ගොඩනැගෙන පුරුදු ජීවිත කාලය පුරාම පවත්වා ගෙන යාමට පුද්ගලයින් යොමුවන්නේ නිරායාසයෙනි.

අකමැත්තෙන් පාඩම් සටහන් ලිවීම අරඹන ගුරුවරයෙකුගේ හැසිරීම් රටාව මීළඟට සලකා බලමු. තමා විසින් ලියනු ලබන පාඩම් සටහන් නිසා ස්වකීය පාඩම් සාර්ථක වන බව යම් කලක දී මොහුට පසක්වීමට ඉඩ තිබේ. මේ නිසා දිගින් දිගට ම පාඩම් සටහන් ලිවීමට යොමුවන මොහු අවසානයේ දී ඒ පිළිබඳ නිපුණයකු බවට පත්වේ. බාහිරව ලද දැනුම නිසා ඒත්තු ගැන්වීම පළමු ආකෘතියේ මුල සිට ම ක්‍රියාත්මක වුවත් ඉගෙනුම්ලාභියාගේ අත්දැකීම් මත දෙවන ආකෘතියේ දී මෙය ක්‍රියාත්මක වී ඇත්තේ පසුකාලීනව බව පැහැදිලි වේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ අත්තිවාරම ලෙස නිපුණතා යොදා ගැනීම ගුරු වෘත්තිකයින්ගෙන් අද බලාපොරොත්තු වේ. තෝරාගනු ලබන නිපුණතාවේ ස්වභාවය අනුව එම නිපුණතාව, නිපුණතා මට්ටම් කිහිපයකට බෙදා ගැනීම බොහෝ විට අවශ්‍ය වේ. `සෞඛ්‍යවත් සමාජයක් සඳහා දායක වෙයි ` යන නිපුණතාව මේ සඳහා විමසා බලමු. පෞද්ගලික පිරිසිදුකම ගැන සැලකිලිමත්වීම මෙහි පළමු අදියර බව ඔබ තේරුම් ගනු ඇත. මෙසේ හඳුනා ගනු ලබන නිපුණතා මට්ටම් පහත සඳහන් ආකාරයට පෙළ ගැස්විය හැකිය.

පෞද්ගලික ස්වස්ථතාව ගැන සැලකිලිමත් වෙමින් සෞඛ්‍යවත්
සමාජයකට දායක වෙයි.

ගේ දොර, පාසල වැනි සමීප ස්ථානවල සෞඛ්‍ය ගැන සැලකිලිමත් වෙමින් සෞඛ්‍යමත් සමාජයකට දායක වෙයි.

බාහිර ප්‍රජාවේ පොදු ස්ථානවල සෞඛ්‍ය ගැන සැලකිලිමත් වෙමින් සෞඛ්‍යවත් සමාජයකට දායක වෙයි.

පාසල් විෂයමාලාවක් දෙස බලන කල මෙබඳු නිපුණතා මට්ටම් බොහෝ විට එක් ශ්‍රේණියක දී සංවර්ධනය කරනු වෙනුවට ශ්‍රේණි කිහිපයක්



ඔස්සේ සංවර්ධනය කිරීම අර්ථවත් බව පෙනේ. ප්‍රාථමික මට්ටම (ශ්‍රේණි 1-5) හා කණිෂ්ඨ ද්විතීයික මට්ටම (ශ්‍රේණි 6-9) පිළිබඳ මෙය විශේෂයෙන්ම සත්‍ය වේ. මෙබඳු විෂයමාලා සර්පිල ක්‍රමයට සකස්කර ඇති විෂයමාලා ලෙස නම් කෙරේ.

සෞඛ්‍යය, භාෂාව, විද්‍යාව, ගණිතය වැනි විෂයයන් මගින් ගොඩනැගෙන නිපුණතා කිහිපයක් මේ ලිපිය මගින් ඔබේ අවධානයට ලක් වුණි. මේවා විෂය මත රඳන නිපුණතා (Subject Dependent Competencies) ලෙස හඳුන්වා දිය හැකිය. කිසියම් විෂයයකට බද්ධ නොවූ, විෂයමාලාවේ විෂය රාශියක් මගින් සංවර්ධනය කළ හැකි නිපුණතා ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සැලකිල්ලට ගත යුතු වේ. මේවා විෂය ස්වායත්ත නිපුණතා (Subject Independent Competencies) නමින් හැඳින් වේ. අනුව දශකයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දුන් පොදු නිපුණතා පහ ඉහත දෙවන වර්ගයට අයත් වේ. විෂය ස්වායත්ත නිපුණතා රාශියක් පිළිබඳ ව වර්තමාන ලෝකයේ රටවල් අවධානය දක්වන අතර විවිධ ක්‍රමවලින් මෙම නිපුණතා අද වර්ගීකරණය කර තිබේ.

මෙම ලිපියේ අවසාන අංගය වශයෙන් විෂය නිපුණතා වලංගුකරණය සඳහා යොදා ගත හැකි නිර්ණායක පෙළක් හඳුන්වා දීම අපේක්ෂා කෙරේ. පහත සඳහන් ලක්ෂණ ඔබ විසින් හඳුනාගනු ලබන විෂය නිපුණතාවල තිබේදැයි නිරතුරුව සොයා බැලීමෙන් විෂය නිපුණතා ලිවීමේ ප්‍රවීණතාව ඔබටත් පියවරෙන් පියවර වර්ධනය කර ගත හැකි වේ.

ජීවිත කාලය පුරා ප්‍රදර්ශනය කළ හැකි පුරුද්දක් ද?

දැනුම, ආකල්ප හා කුසලතා සමෝධානය වී ගොඩ නැගී තිබේ ද?

ඉගෙනුම්ලාභියාට වැදගත් වූ ද අභියෝගාත්මක වූ ද කාර්යයක් පදනම් කර ගනී ද ?

උනන්දුවෙන් හා පෙලඹවීමෙන් යුතුව කාලයක් තුළ ප්‍රදර්ශනය කළ හැකි දෙයක් ද?

ජීවිත කාලය පුරා පවතින ආදරයක්, ඇල්මක් විෂයය සඳහා ඇති කිරීමට සමත් වේ ද?

යාවජීව අධ්‍යාපනය සඳහා මං පෙත් විවර කර දෙනවා ද?

නිපුණතා මට්ටම් කිහිපයක් මතුකර ගත හැකි ආකාරයේ පුළුල් බවක් තිබේ ද?

මෙසේ වලංගුතාව තහවුරුකර ගන්නා නිපුණතා ඇසුරෙන් විෂය කරුණු හඳුනා ගැනීමටත්, සහයෝගී ඉගෙනුමේ යෙදෙමින් එම විෂය කරුණු ග්‍රහණය කර ගැනීමට සිසුන්ට ඉඩ සලසන පැවරුම් සකසා ගැනීමටත්, සිත් ගන්නා සුළු ප්‍රවේශ යොදා ගනිමින් සිසුන් ගවේෂණයට යොමුකර වීමටත්, සිසුන් ගවේෂණයේ යෙදෙන අවස්ථාවල දී තක්සේරුකරණයේ හා අනාවරණ ඉදිරිපත් කරන අවස්ථාවල දී ඇගයීමේ යෙදීමටත් හුරු පුරුදු වූ 21 වන සියවසට ගැලපෙන ගුරු පිරිසක් ඔබේ පාසල තුළ සංවර්ධනය කර ගැනීමට අවශ්‍ය මූලික දැනුම මේ ලිපිය කියවීමෙන් ඔබ ලබා ගන්නට ඇතැයි යන්න මගේ විශ්වාසයයි.



# 2 දරුවන්ටත් දෙමාපියන්ටත් පාසල බරක් නොවියයුතුය:

**ගොඩ්වින් කොඩිතුවක්කු සහ ඩබ්. එම්. සෝමරත්න**

ඩබ්. පී. පියතිලක මහතාගේ පාසල් පාදක කළමනාකරණ දර්ශනය සහ ක්‍රියාකාරි සැලැස්ම පිළිබඳ හේතු තුලනාත්මක ප්‍රත්‍යයක අධ්‍යයනයක්

විනය පිරිහීම නිසා ජන අප්‍රසාදයට පත්, සොහොනක් අසල වූයෙන් සොහොනේ පාසල ය යි අන්වර්ථ නම් ලත්, ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ කලකිරීම ඇති කළ පාසලක්, විදුහල්පති කළමනාකරණ ශෛලියේ බලපෑමෙන් වසර තුන හතරකින් රසවත් ගුණවත් අහරින් ද නැණ ගුණ දහමින් ද ගත සිත සැනසුණු සිසු පිරිසකින් සුසැදුණු,එහෙයින් සාමය රජ කරන, ප්‍රජා ප්‍රභූන්ට අභිමානයෙන් ප්‍රවේශ විය හැකි, පාසලක් බවට පෙරළීමේ කතාන්තරය.

## හැඳින්වීම

මහනුවර දිස්ත්‍රික්කයේ, මහ / දෙනු /ර්රියගම ශ්‍රී පුෂ්පදාන ආදර්ශ මහා විද්‍යාලය දර්ශනීය භූමි භාගයක පිහිටියේ ය. පාසල් භූමියේ සිටින විට එක් පසෙකින් මහවැලි නදී තෙර ද තවත් පැත්තකින් පේරාදෙණිය උද්භිද උද්‍යානය ද ඉදිරිපසින් ශ්‍රී ලංකා පේරාදෙණිය විශ්ව විද්‍යාලය ද දර්ශනය වේ. 1925 දී දහම් පාසලක් ලෙසට, වර්තමාන භූමි භාගයට ආසන්න බිමක, ආරම්භ වී 1927 දී පාසලක් බවට පත් ව දැනට පවතින ස්ථානයට ගෙන එන ලදි. එවකට ප්‍රදේශයේ තිබූ එක ම බෞද්ධ පාසල ද මේ විය. 1927 වන විට පොල් අතු සෙවිලි කළ එක් ගොඩනැගිල්ලක් පමණක් පාසලට අයත් වූ අතර ගුරු භවතකු හා සිසුන් 15 දෙනකුගෙන් ඒ සමන්විත විය. ක්‍රමයෙන් වැඩි දියුණු වූ පාසල ජනප්‍රිය වූයේ ඉන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ලා ඉතා ඉහළ කාර්යභාරයක් සිදු වූ නිසා ය. 1960 දී මෙය රජයේ පාසලක් බවට පත් විය.

පාසල් සිසුන්ගේ දෙමාපියන්ගේ ජීවනෝපාය වනුයේ කෘෂිකර්මය, වෙළෙඳාම හා රජයේ රැකියා ය. ඒ අතර විදේශගත රැකියාවල නියුතු සුළු පිරිසක් ද දෙමාපියන් අතර සිටිති. පාසල් ඉතිහාසයේ මුල් කාලයේ දී පවා ප්‍රජාවේ සමහර පවුල් ආර්ථික වශයෙන් අසරණභාවයට පත් වී සිටියහ. නාගරීකරණයත් සමඟ ම පාසලේ පෝෂක ප්‍රදේශයේ සිසුහු නගරයේ පාසල් කරා යන්නට වූ හ. පාසලේ සිසුන් සංඛ්‍යාව අඩු වීම මෙන් ම විනය හා ආචාර - සදාචාර අංශයේ ද පිරිහීමක් ඇති විය. පාසල, 1996/1997 යන වර්ෂවල දී ඉතා අඳුරු තත්ත්වයක තිබුණි. නියෝජ්‍ය විදුහල්පති පවසන පරිදි,

*ඔය සමහර ළමුන් ඉඳලා තියෙන්නේ ළමයි විදිහට නෙවෙයි යක්කු විදිහට. ඇත්තමයි සර් යක්කු විදිහට ඉඳලා තියෙන්නේ. පාරේ යන කොට කතා කරන්නේ සුද්ධ සිංහල ලූ! පාරේ අයිනෙ තියෙන ගෙවල්වලටත් කරදරේ ලූ. ඒත් මිනිස්සු මොකුත් කියන්නේ නැහැ ලූ. ඇයි හොම්බට ගහල වුනත් යන්න පුළුවන් පිරිසක් නේ ඉඳලා තියෙන්නෙ...*



මෙම කාල වකවානුවේ සිටි සිසු සිසුවියන් ද පාසලේ උගන්වන ගුරු භවතුන්ට මහත් කරදරයක් වූ බවට සාක්ෂ්‍ය තිබේ. ඒ පිළිබඳ ව ගුරු මණ්ඩලයේ සාමාජිකයකු අදහස් දැක්වූයේ මෙසේ ය.

*ගුරුවරිය - ඉස්සර හිටිය ප්‍රින්සිපල් සර් ළමයි ගැන කිසි ම උනන්දුවක් වුණේ නෑ. ඒ වගේ ම ශිෂ්‍යයෝ හරියට කලබල කරල තියෙනවා.*

*පර්යේෂක -ඇයි එහෙම කලබල කළේ?*

*ගුරුවරිය - ඉස්සර හිටිය ප්‍රින්සිපල් සර්ට ළමයි බය නැහැ. ඒ සර් ළමයි ගැන සොයා බැලුවේ නැහැ. ඒ නිසයි එහෙම සිදු වුණේ*

*පර්යේෂක -කොයි සර්ල ද ඔය?*

*ගුරුවරිය - මට හරියට මතකයක් නෑ. මේ සර් ආවාට පස්සේ දියුණු වුණේ.*

*පර්යේෂක - ඔයාගේ පන්තියේ සිටි අයත් කලබල කළා ද?*

*ගුරුවරිය - මගේ පන්තියේත් එහෙම අය කිහිප දෙනෙක් හිටියා*

*පර්යේෂක -මොනව ද ඒ අය කළේ?*

*ගුරුවරිය - ඒ අය ඉස්කෝලේ කට්ටි පැන්නා. ගුරුවරුන්ට උගන්වන්න දුන්නෙ නෑ. බෝර්ඩ් එකේ ලියන කොට බෝඩ් එකට කොළ කැලිවලින් ගහනවා. උඩ තට්ටුවේ නම් යට තට්ටුවේ උගන්වන ගුරුවරුන්ට යි ශිෂ්‍යයින්ට යි කොළ කැලි වගේ දේවල්වලින් ගහනවා. සිගරට් වැනි දේ පවා පාසලට ගෙනත් බිව්වා.*

ලොග් සටහන් පොතේ සටහන්වලින් ද මෙසේ පිරිහී තිබූ තත්ත්වය අවබෝධ කර ගත හැකි ය.

*විදුහලේ තාවකාලික ව සාදා ඇති කාමරයේ ගබඩා කර තිබූ ලී බඩු නැති වී තිබේ. ඒ සම්බන්ධ ව පේරාදෙණිය පොලීසියට පැමිණිලි කිරීමට... මයා සමග යමි.*

*(1995.09.25 වන දින ලොග් සටහන)*

මේ පසුබිම තුළ 1997.03.17 දින පාසලට පත් ව ආ විදුහල්පති ඩබ්. පී. පියතිලක මහතා, පාසලේ පැවති තත්ත්වයට ප්‍රතිචාර දැක්වූයේ පහත සඳහන් පරිදි ය.

*....මම නම් සතුටක් විඳින්නේ මේ පාසල හදපු දාට. මේ සමාජය විනාශ කරන්න හිටපු ළමුන්ගෙන් 75%ක් වත් හැදුව දාට මට මහා සතුටක් දැනේවි.*

මෙකී සත් දර්ශනය ඵල ගැන්වුණු අයුරු විමසා බැලීම මේ පර්යේෂණයේ අරමුණ විය.

පර්යේෂණ ක්‍රමය

ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සංජානන මත හොඳ කළමනාකාරිත්වයක් සහිත ය යි හඳුනා ගත් මහ / දෙනු /ඊරියගම ශ්‍රී පුෂ්පදාන ආදර්ශ මහා විද්‍යාලය ප්‍රත්‍යෙක අධ්‍යයනය සඳහා ආරම්මනගත ව තෝරා ගැනිණි. පාසලේ දැනට පවතින පරිසරයට තුඩු දුන් සාධකත් එම සාධක ඓතිහාසික ව පාසල් සංවර්ධනයට බලපෑ අයුරුත් හඳුනා ගැනීම අරමුණු වූ හෙයින් හේතු තුලනාත්මක පර්යේෂණ ක්‍රමය, ප්‍රත්‍යෙක අධ්‍යයනය සඳහා භාවිත කෙරිණි.

විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, ගුරු මණ්ඩල සාමාජිකයන්, සිසු සිසුවියන් සහ දෙමාපියන් සමඟ ගැඹුරින් සම්මුඛ සාකච්ඡා පවත්වා, පාසලේ ලේඛන ද පදනම් කර ගෙන ඓතිහාසික කථාන්තරයට අදාළ දත්ත රැස් කරන ලදී. ව්‍යුහගත නො වූ නිරීක්ෂණ මගින් පාසලේ වර්තමාන දෛනික ක්‍රියාකාරිත්වය සහ පාසල් සිද්ධි ආඛ්‍යාන ශෛලියෙන් වාර්තා කර ගන්නා ලදී. සිද්ධි ඡායාරූප ගත කරන ලදී. මූලික නිරීක්ෂණ සහ සම්මුඛ සාකච්ඡාවලින් හඳුනා ගැනුණු පාසලේ කැපී පෙනෙන සිද්ධි `ලියවැල අලංකරණ` (Vignette) ලෙස ගෙන ඒවා පිළිබඳ විස්තරාත්මක දත්ත සහ සංජානන ලබා ගැනීමට 11 වන ශ්‍රේණියේ සිසුන් 10 සහ ගුරුවරුන් 10 දෙනකුගේ කණ්ඩායම් සමඟ ` ප්‍රත්‍යවේක්ෂණ ජනන සම්මන්ත්‍රණ (Reflection generating conference) ` පවත්වන ලදී. සිසුන්, ගුරුවරුන් සහ දෙමාපියන්ගේ ස්වයං ප්‍රතිචාර ව්‍යුහගත කිරීම සඳහා ප්‍රශ්නාවලි භාවිත කරන ලදී. රැස් කළ දත්ත පාසල් ඉතිහාසයේ කාල අනුක්‍රමික රටා අනුව පෙළගස්වමින් ද ඉතිහාස සිද්ධි රටා හා වර්තමාන පාසල් ක්‍රියාකාරිත්වය සඳහා බලපෑ සාධක හඳුනා ගනිමින් ද විශ්ලේෂණය කරමින් ආඛ්‍යාන ශෛලියෙන් පර්යේෂණ වාර්තාව සකසන ලදී.



අනාවරණය වූ කථාන්තරය

සාමකාමී පරිසරයක් පාසලේ ඇති වීමට හේතු වන පරිදි නව විදුහල්පතිගේ දර්ශනය ක්‍රියාත්මක කෙරුණේ පියවර කිහිපයකිනි.

ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ මූලික අවශ්‍යතා සැපයීම

* විනය සංවර්ධනය කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම
* පරිසරය සංවර්ධනය කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම
* ශිෂ්‍යශිෂ්‍යාවන්ගේ පෝෂණය පිළිබඳ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම

ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ මූලික අවශ්‍යතා සැපයීම

මේ සඳහා ගනු ලැබූ පළමු පියවර වන්නේ පාසල් භූමිය තුළ ජල, වැසිකිළි සහ කැසිකිළි අවශ්‍යතා සපුරාලීම ය. දෙ වන පියවරක් වන්නේ මානසික අවශ්‍යතා සපුරාලීම යි. පාසල් ගොඩනැගිල්ල ඉදිරිපස මිදුලට පිවිසෙන විට ම මිදුල කෙළවරින් දර්ශනය වනුයේ බෞද්ධ ප්‍රතිමා වහන්සේය. ඒ නිසා පාසලට ඇතුළු වන අවස්ථාවේ දී ම සිසු සිත් තුළ පහන් සංවේගය ඇති වේ. විදුහල්පති ප්‍රතිමා වහන්සේ ඉදි කිරීමේ ව්‍යාපෘතිය සඳහා දැඩි උත්සාහයක් දරා සුභ පතන්නකුගේ වියදමින් ඒ ඉදි කර පාසලේ දී සිසුන් තුළ ආගමික නැඹුරුවක් ඇති කිරීමට ප්‍රයත්න දරා තිබේ.

සංවර්ධනය කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම

වර්තමාන පාසලේ දක්නට ලැබෙන ස්වයං විනයෙන් සපිරි සාමකාමී

පරිසරය ගොඩ නැගුණේ ක්‍රියාකාරී වැඩපිළිවෙළක ප්‍රතිඵලයක් වශයෙනි. එම වැඩපිළිවෙළෙහි අංගයක් වූයේ විනය සංවර්ධන වැඩසටහන යි. එම වැඩසටහනේ අතීතය සහ වර්තමානය මෙතැන් සිට විග්‍රහ කරමු.

පාසල 1996 වන විට විනය පිරිහීමේ ඉහළ ම ලක්ෂණ පෙන්නුම් කර තිබුණි. පාසලේ ප්‍රජාව - ගුරුමණ්ඩලය සිසුන් - ප්‍රජාව, ගුරු භවතුන් - ප්‍රජාව, ගුරු - විදුහල්පති, ගුරු - සිසු වශයෙන් ගැටුම් මේ කාලය වන විට පැවතිණි. එහෙයින් පාසල කෙරේ තිබිය යුතු සුභවාදී චින්තනය ප්‍රජාව තුළින් ගිලිහී ඇත.

*නව බුදුමැඳුරට පිටුපස ඉඩම් හිමියා විසින් මායිම වෙනස් කර ඉනි වැටක් සාදා තිබේ. මෙය ගලවා ඉවත් කරන බවට යටිනුවර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂතුමා පැමිණ පරීක්ෂා කර බැලූ විට ඉඩම් අයිතිකරු පොරොන්දු විය. එය 17 වන ඉරිදා සවස් වන තුරුත් ඉවු කර නැත. ඒ නිසා පේරාදෙණිය පොලීසියට පැමිණිලි කර යටිනුවර අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙත හා ග්‍රාම නිලධාරීතුමාට ද වාර්තා කළෙමි*

*(1996.11.18 වන දින ලොග් සටහන)*

ගුරු මණ්ඩලය හා විදුහල්පති අතර ද වරින් වර ගැටුම්කාරී තත්ත්වයන් උද්ගත ව තිබුණි.

*අද ගුරු මණ්ඩලයේ පැමිණීම 22කි. 4ක් පැමිණියේ නැත.... මිය පෙ.ව. 10.45 ට පමණ විදුහලට පැමිණියා ය. ඇය බලහත්කාරයෙන් අත්සන් කිරීමට උත්සාහ දැරුවා ය. එය නො දෙන බව පැවසූ නිසා පැයක් පමණ සිට පිට ව ගියා ය.... ඒ බව යටිනුවර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂතුමාට වාර්තා කළෙමි*

*(1996.11.15 වන දින ලොග් සටහන)*

මෙපමණක් නො ව පාසල තුළ වතුර කරාම ගලවා ගෙන යාමෙන් ජලය අපතේ යාම නිසා ළමයි වතුර සොයා පේරාදෙණිය කඩමණ්ඩියට පවා ගිය බව දැක්වේ. ගල්මුල්වලින් පහර දී පාසලේ ගොඩනැගිලි සෙවිලි කර ඇති ෂීට් ද කඩා දැමිණි. පේරාදෙණියේ කඩවලට සිසුන් විසින් ගල්මුල්වලින් පහර දී අලාභ සිදු කරන ලදි. පාසල ඇරී නිවෙස් කරා යන සිසුන් අහල පහළ නිවෙස්වලට අලාභහානි කළ හ. මෙසේ පැවැති පාසල ගැන, බුදුමැඳුර පාසලට පරිත්‍යාග කළ සුබපතන්නා පැවසුවේ $ අපි ඒ කාලේ පාරේ යනවා. මෙහෙම පාසලක් තියෙනව ද කියලවත් දන්නේ නැහැ` යනුවෙනි. ඒ තරමට පාසල ප්‍රජාවගෙන් ඈත් වී තිබුණි.

මෙසේ පවතින අවස්ථාවක දී 1997.03.17 වන දින වර්තමාන විදුහල්පතිතුමා වැඩ භාර ගෙන ඇත. විදුහල්පතිතුමා කාර්යාලයේ මුල් පුටුවේ වාඩි වී හිටි සමහර අවස්ථාවල දී සිසුන් විසින් දොරෙන් එබිකම් කර බලා ඇත්තේ අමුතු සතකු දෙස බලන ආකාරයෙනි. මෙසේ වැඩ භාර ගත්ත ද දින කීපයකින් පසු අවුරුදු නිවාඩුව උදා වී 1997.04.21 වන දින නැවත දෙවන පාසල් වාරය ආරම්භ කරන ලදි. විදුහල්පතිතුමා අලුත් අවුරුදු නිවාඩුවේ දී පවා මෙම පාසලේ විනය පිළිබඳවත් එය නිවැරදි කර ගන්නා ආකාරය පිළිබඳවත් සිතුවේ ය. එසේ වූ නිසා පාසල් වාරය පටන් ගෙන දින 3ක් ගිය විට ම ළඟි ළඟියේ ම 11 වන වසර සිසුන්ගේ අවිනීත හැසිරීම් පිළිබඳ ව දෙමාපිය රැස්වීමක් කැඳවන ලදි.

*11 වසර සිසුන් අවිනීත ව හැසිරීම නිසා විනය කමිටු මගින් තීරණ ගැනීමට සිදු විය. ඒ අනුව 1997.04.28 වන දින එම විනය විරෝධී ක්‍රියාවට සම්බන්ධ අයගේ දෙමාපියන් කැඳවීමට තීරණය කර ඒ අනුව කටයුතු කරන ලදි .*

( 1997.04.25 වන දින ලොග් සටහන)

දෙමාපියන් කැඳවා විනය විරෝධී ක්‍රියා කළ අයට උපදෙස් දුන් අතර නැවත වරක් එවැනි ක්‍රියා නො කිරීමට සිසුන්ගෙන් එකඟතාව පළ කර ගන්නා ලදි. මෙසේ විනය විරෝධී ක්‍රියා කරන්නන් පිළිබඳ ව අවධානය යොමු කිරීම, විදුහල්පති පැමිණි විගස ම කළ ක්‍රියාවක් ලෙස හඳුනා ගත හැකි ය. මේ අතරතුර කාලය තුළ වුව ද විදුහල්පති බොහෝ විට සිසුන්ට අවවාද කර ඇති අතර දඬුවම් ද දී ඇත. නොයෙකුත් විනය ගැටලු සම්බන්ධ සාකච්ඡා කිරීම සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හමු වූ අවස්ථා ද දක්නට ලැබේ. ඒ අතර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නව විදුහල්පතිතුමා පාසලේ කටයුතු දියුණු කිරීමට අවංක උත්සාහයක් ගන්නා බවට කළ

ප්‍රශංසා ද දක්නට ඇත. මේ අතර විනය අතින් යහපත් ක්‍රියාමාර්ග දිනෙන් දින ගනු ලැබුණි. ඒ අනුව 1997 වර්ෂයේ පැවැති දහම් සතිය වෙනුවෙන් පහත සඳහන් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට විය.

* උදය රැස්වීමේ දී සිසුන් හා ගුරු භවතුන් කතා පැවැත්වීම
* 6 - 11 වසර සිසුන්ගේ සහභාගිත්වයෙන් සීල ව්‍යාපාරයක් පැවැත්වීම
* 1 - 5 වසර සිසුන් පෙරහැරින් විහාරස්ථානයට ගොස් ආගමික වතාවත් සිදු කිරීම
* පහන් ආලෝක පූජාවක් පැවැත්වීම

මේ කරුණු සඳහා ගුරු මණ්ඩලයේ නොමද සහයෝගය අත්‍යවශ්‍ය බව විදුහල්පතිතුමා විසින් අවධාරණය කරන ලදි. ඒ අනුව නියමිත දින මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර ඇති අතර ප්‍රදේශයේ වෙළඳ ව්‍යාපාරිකයන් ඇතුළු සුභපතන්නන් ද අනෙකුත් ප්‍රජාව ද අධ්‍යාපන අධ්‍යක්ෂ ඇතුළු නිලධාරී මණ්ඩලය ද මේ සඳහා සහභාගි වී ඇත. මෙසේ ශිෂ්‍යයන් හා ප්‍රජාව යම් තරමක විනයක් සහිත පිරිසක් බවට පත් කිරීමට උත්සාහ දැරුව ද තවදුරටත් අතීත මතක සටහන් අවධි වන්නා සේ ගුරුවරුන්ගෙන් හා සිසුන්ගෙන් විනය විරෝධී ක්‍රියා වරින් වර මතු වනු දක්නට ලැබුණි. 1997.10.13 ලොග් සටහනට අනුව ගුරුවරියකට අදාළ සිද්ධියක් ගැන මෙසේ සඳහන් වේ.

*... 7 වසර පන්තිය සඳහා වැඩ පැවරීම යටතේ .... මියට පවරන ලදි. නමුත් එය භාර ගැනීම එම මහත්මිය විසින් ප්‍රතික්ෂේප කිරීම නිසා ඇය කාර්යාලයට කැඳවන ලදි. ...*

යනුවෙනි. එසේ ම නව වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රතිසංස්කරණය කිරීමට යාමේ දී සිසුන් හා ගුරු භවතුන්ගෙන් නොයෙකුත් චෝදනා ඇනුම් බැනුම් අපහාස විඳීමට සිදු වී ඇත. මෙවැනි තත්ත්වයක් තිබිය දී විනය සංවර්ධන වැඩ පිළිවෙළක් විදුහල්පතිතුමා ඇතුළු ආචාර්ය මණ්ඩලයේ කිහිප දෙනකු විසින් සකස් කර ක්‍රියාත්මක කරන ලදි. මෙම ව්‍යාපෘතියේ අරමුණු වී ඇත්තේ



* ගුණදම්වලින් සපුරුණු සිසුන් පිරිසක් බිහි කිරීම
* එමගින් අධ්‍යාපන තත්ත්වය ඉහළ නැංවීම
* පාසලේ පරිපාලනය පහසු කර ගැනීම
* පාසලේ භෞතික සම්පත් ආරක්ෂාව හා නඩත්තුව ය.

$ *අඳුරට දොස් නගමින් අඳුරෙහි ජීවත් වනවාට වඩා එක් පහනක් හෝ දැල්වීම වටී* ` යනුවෙන්, මෙම ව්‍යාපෘතිය හඳුන්වා දී ඇත. එකී ව්‍යාපෘතිය තවදුරටත් සාර්ථක කර ගැනීම සඳහා මනා ව දැනුවත් කිරීමක් ද කරන ලදි. සිසුන් ගුරු භවතුන් පමණක් නො ව සුභපතන්නන්ට ද මෙම පණිවිඩය සන්නිවේදනය කර ඇත. වැඩ සටහන විස්තරාත්මක ව රෝනියෝ කර බෙදා හැර ඇති අතර ම පාසලේ ප්‍රදර්ශනය ද කර ඇත. මෙහි තවත් ඉදිරි පියවරක් වූයේ වැඩ පැවරීම හා ක්‍රියාත්මක කිරීම යි. මේ සඳහා විශේෂයෙන් ම පන්ති භාර ගුරු මණ්ඩලය හා විනය භාර ගුරු මණ්ඩලය යොදා ගන්නා ලදි. විශේෂයෙන් ම බොහෝ කරුණුවල දී අවසන් තීරණ ගැනීම ප්‍රජාතන්ත්‍රවාදී ව විනය කමිටු මගින් සිදු කරන ලදි. එසේ ම මේ සඳහා ශිෂ්‍ය මාර්ගෝපදේශක මහතකු ද පත් කිරීම සුවිශේෂත්වයකි. සිසුන්ට තරු ප්‍රදානය කිරීමක්, සිදු කර ඇති අතර එකී තරුවල වර්ණය හා ක්‍රියාවේ ස්වභාවය පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| තදබල වැරදි | - | කළු |
| සුළු වැරදි | - | රතු |
| ඉතා හොඳ ක්‍රියා | - | දම් |
| සාමාන්‍ය හොඳ ක්‍රියා | - | කහ |

මේ අනුව වර්ණ හා තරු ප්‍රදාන සටහනක් දෛනික ව පන්ති භාර ගුරුතුමා විසින් පවත්වා ගෙන යන ලදි. කළු සහ රතු වර්ණ ගත් ළමයින්ට හොඳ වැඩ තුළින් එම වර්ණ ඉවත් කර ගැනීමේ හැකියාව, විනය වර්ධන වැඩසටහනින් ඇති කර තිබීම විශේෂ ලක්ෂණයකි. පාසලෙන් පිට ව යාමේ දී මේ දත්ත සටහන් ව තිබූ ශිෂ්‍ය චර්යා සටහන් පත්‍රිකාව ශිෂ්‍යයාට

ප්‍රදානය කරන ලදි. ඔහු ලබා ගන්නා තරුව ද ඒ සමඟ විය. එකී තරුව රන් හෝ රිදී වූයේ වැරදි හදා ගැනීමට අවකාශය පාසලේ ඇති කළ නිසා ය.

මෙකී වැඩ සටහන මගින් දීර්ඝ කාලීන හා කෙටි කාලීන වශයෙන් යහපත් අතුරු ප්‍රතිඵල ද ලැබුණි. පාසල විදුහල්පතිතුමා ඇතුළු ගුරු මණ්ඩලයටත්, සිසුන්ටත්, ප්‍රජාවටත්, ප්‍රිය මනාප ස්ථානයක් බවට පත් විය. මීට පෙර තිබූ රළු කටුක ස්ථානය වෙනුවට දැන් එය මෘදු නම්‍ය ස්ථානයක් බවට පත් විය. එසේ ම පාසලෙන් සිසුන් අස් කරනවා වෙනුවට සිසුන් ඇතුලත් කර ගැනීම තරගයක් බවට පත් විය. අ.පො.ස. (සා. පෙළ) සමත් වූවෝ වෙනත් පාසල්වලට යනවාට වඩා උසස් පෙළ හැදෑරීමට එහි රැඳී සිටීමට කැමැත්තක් දක්වති. බුදුමැදුර සෑදීමත්, මාර්ගය සුදුසු පරිදි සකස් කිරීමත්, පාසලට අලුතින් ඉඩම් කැබැල්ලක් ලබා ගැනීමට උත්සාහ කිරීමත්, ප්‍රජාව හා ගුරු මණ්ඩලය පාසල කෙරේ දක්වන ඇල්මෙහි ප්‍රතිඵලයන්ය.

විනය වැඩසටහනේ ප්‍රතිඵල හතර ආකාර සාක්ෂ්‍ය එකමිතියට ගෙන නිරූපණය කළ හැකි ය. පළමු ව 2004 වර්ෂයේ දිනක පාසලත් රට අල්ලපු නිවසේ වැටත් අතර ඇති ලොවි ගසේ එල බර වී පාසල දෙසට නැමී තිබුණි. මේවා කඩා ගැනීමට සිසුන් තුළ කිසිදු සිතුවිල්ලක් පහළ නො වී ය. ලොවි ගසේ අයිතිකරු මේවා ආරක්ෂා කළාට කළගුණ සැලකීමක් ලෙසට මෙහි එල නැවත සිසුන්ට ම දීමට යොමු විය. විනය වැඩ සටහනේ යහපත් ප්‍රතිඵලයක් මෙමගින් නිරූපණය විය. දෙවනු ව පාසලේ විනය සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක වීමෙන් පසු සාමකාමී පරිසරයක් ගොඩ නැගුණු අයුරු සංඛ්‍යා දත්තවලින් ද තහවුරු වේ.

**විනය විරෝධී වාර්තා ගණන: 1998- 2004**

| | | |
|---|---|---|
| 1998 | - | 23 |
| 1999 | - | 21 |
| 2000 | - | 05 |
| 2001 | - | 02 |
| 2002 | - | 02 |
| 2003 | - | 01 |
| 2004 | - | 00 |



තෙවනු ව වර්තමාන පාසල් පරිසරයේ ශිෂ්‍ය හැසිරීම මේ සඳහා වන හොඳ උදාහරණයකි. හතරවනු ව විනය යහපත් අතට හැරීම පිළිබඳ ගුරුවරයකුගේ අදහස් පහත දැක්වේ.

1 වන ලියවැල් අලංකරණය: ගුරුවරයකුගේ අදහස්

*වසර හතකට ඉහත දී අප්‍රසාදයට පත් ව තිබූ පාසල අද ආදර්ශ පාසලක් බවට පත් ව ඇත. දේශීය උගතුන් විද්වතුන්, ප්‍රභූන් සුබපතන්නන් මෙන් ම විදේශීය අමුත්තන් ද පාසලට පැමිණ එහි කටයුතු අගය කරති; පාසලට නොයෙක් පරිත්‍යාග කරති. පාසලේ දරුවෝ පුණ්‍යවන්තයෝ ය. නොයෙකුත් අඩුපාඩු මැද තම නිවෙස්වල ජීවත් වන ඔවුන්ට පාසල ඉසුරු පිරුණු තැනකි. ජාතික මට්ටමේ හැකියා කුසලතා එළි දක්වන්නට මඟපෙන්වන තෝතැන්නකි. පාසල දරුවන්ට ප්‍රියජනක ස්ථානයකි. ඔව්හු ස්වේච්ඡාවෙන් ම තමන්ගේ වගකීම් යුතුකම්, ඉටු කරන්නට පෙලඹී සිටිති. වැඩ කිරීමෙන් ආත්ම තෘප්තියක් ලබන්නට ඔවුහු හිමි කරුවෝ ය. ඔව්හු පාසලෙන් අනාගත ලෝකයට පිවිසෙන්නට පාර සොයා ගත්තෝ ය. රැකියාවක් නො ලැබුන ද අභියෝගවලට මුහුණ දීමට ඔවුන්ට ආත්ම ශක්තියක් ඇත. පාසලේ දී දැන උගත් දෙයින් සුළු වැටුපක් හෝ උපයන්නට දැනටමත් ඔවුන්ට හැකියාවක් ඇත.*

*විදුහල්පතිතුමා ප්‍රමුඛ ගුරු මණ්ඩලය තුළ ද පාසලට ම ආවේනික වූ ආචාරධර්ම පද්ධතියක් ක්‍රියාත්මක වේ. මනා කළමනාකරණයකින් යුත් විදුහල්පතිතුමාගේ කාර්යභාරය සුවිශේෂී වූවකි. එය නිර්මාණශීලී ය. හොඳ දේ අගය කිරීම, වැරදි ඇති විට පේනවා දීම තුළින් ක්‍රියාශීලී ගුරු මණ්ඩලයක් මගින් මනා කැප වීම හා සහයෝගය ලබා ගැනීමට විදුහල්පතිතුමා බුද්ධිමත් ය, දක්ෂ ය.*

*ගුරුවරුන්ගේ අවශ්‍යතා සොයා බලා ඒවා සපුරා දීමට විදුහල්පතිතුමා කැප වී කටයුතු කරයි. රාජකාරී වශයෙන් මෙන් ම පෞද්ගලික වශයෙන් ද මානව හිතවාදී ව ගුරු මණ්ඩලයට සලකයි. සමානාත්මතාව, සහජීවනය, සහයෝගීතාව, ගුරු මණ්ඩලය තුළ පවතින සුවිශේෂ අංගයන් ය. මේ නිසා අද අප පාසල වසර පුරා සෑම දිනක ම වැඩ කරන ආදර්ශමත් පාසලක් බවට පත් වී ඇත.*

## පරිසරය සංවර්ධනය කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම

මේ පාසලේ යහපත් ලක්ෂණයක් වන්නේ අලංකාරවත් පරිසරයක් පවත්වා ගෙන යාම යි. මීට අදාළ කාර්යයන් දිගු කලක් සිදු වී ඇති අතර ක්‍රමක්‍රමයෙන් වැඩකටයුතු ක්‍රමවත් කිරීම සඳහා ව්‍යාපෘති වාර්තා සකස් කර පරිසර අලංකරණ කාර්ය විධිමත් ව විමධ්‍යගත කර බෙදා හැර ඇත. එකදු සුළු සේවකයකුවත් නොසිටින පාසලේ පිරිසිදු කිරීම් කටයුතු සිදු වන්නේ විදුහල්පතිගේ සහ ගුරු මණ්ඩලයේ සුහදශීලී අධීක්ෂණය හා සැලැස්මත් ශිෂ්‍ය නායක මණ්ඩලයේ සහ අනෙකුත් සිසුන්ගේ ස්වේච්ඡා සහභාගිත්වයත් මත ය. උදෑසන පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය සඳහා පාසල කලාප අටකට බෙදා ඇත. එක් එක් කලාපයට අධීක්ෂක ගුරු භවතුන් ශිෂ්‍ය නායකයන් සහ අනෙකුත් සිසුන් පත් කර ඇත. උදෑසන පාසලට පැමිණෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පාසල් භූමිකාව ඇරඹෙන්නේ තමනට හිමි පිරිසිදු කිරීමේ කාර්යය සඳහා යොමු වීමෙනි. තමන් අධීක්ෂණයට සිටින ශිෂ්‍ය නායකයන් හෝ ගුරුවරු නොසිටිය ද ස්වේච්ඡාවෙන් ම මේ මට අයිති වගකීමක් යන හැඟීමෙන් වැඩෙහි නිරත වීම විශේෂ ලක්ෂණයකි. උදෑසන පිරිසිදු කිරීමේ කාර්යය විවිධාකාර විය.

* බිම අතු ගා කොළ රොඩු එකතු කර කොම්පෝස්ට් ව්‍යාපෘතිවලට දැමීම හෝ බැවුම්වල ආරක්ෂාව සඳහා යොදා ඇති වැටිවල සෝදා පාළුව ඇති තැන් සඳහා දැමීම.



* ගැලවී ඇති වැටිවල ගල් ආදිය නිසි පිළිවෙළට තැබීම
* පන්තිය අතු ගා දූවිලි ඉවත් කිරීම
* මිදුල්වල හා පිට්ටනියේ දූවිල්ල වැළැක්වීමට වතුර ඉසීම
* මල් පාත්තිවලට වතුර දැමීම
* මල් පාත්තිවල වල් පැළ ගැලවීම, පර වුණු මල් ඉවත් කිරීම, මල් වැට පිළිවෙළට කපා දැමීම.

මේ කටයුතු කොතරම් හොඳින් කරන්නේ ද යත් සියලු ශිෂ්‍ය ශිෂ්‍යාවෝ එම කටයුතුවලට ආත්මික ව බැඳී ඇතුවාක් මෙන් කටයුතු කරනු නිරීක්ෂණය කළ හැකි විය. එසේ ම විනෝදාත්මක ලෙස විනෝදයෙන් හා සතුටින් ඔවුහු ඒවායේ නිරත වෙති. නියෝග නිසා නිරත වීමක් කිසිසේත් දක්නට නැත. ළමයකු මෙහෙයවා වැඩ කරනු වෙනුවට ` මල්ලී මේ ටිකත් අතු ගාන්න ` වැනි වදන් සහිත සුහදශීලී බවක් දක්නට තිබේ. පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී පිරිසිදු කිරීමට ගන්නා භාණ්ඩ ආරක්ෂා කිරීම සඳහා විධිමත් සැලැස්මක් සකස් කර තැබීම ද අගය කළ යුතු ය. කොසු ඉදල් භාර ගැනීමත්, භාර දීමත් ශිෂ්‍යශිෂ්‍යාවන් අතින් ම ඔවුන්ට වගකීම් පැවරෙන පරිද්දෙන් ලේඛනගත ව සිදු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර තිබේ.

පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ සමස්ත අර්ථය වන්නේ වගකීම් විමධ්‍යගත කිරීමෙන් ද ඒවා ඉටු කිරීම යුතුකමක් ය, යන හැඟීම ඇති කිරීමෙන් ද හා පාසලෙන් ඉටු කරන භූමිකා හුදෙක් පොතපතේ කරන කටයුතුවලට සීමා නො කිරීම ද බව පැවසිය හැකි ය. එසේ ම *“පාසලේ අපද්‍රව්‍ය කිසි දෙයක් පාසලෙන් පිටට යවන්නේ නැහැ `* යන සංකල්පය තුළ පිහිටා කටයුතු කරනු ලැබේ. සාමකාමී අන්තර් ක්‍රියාකාරිත්වයත් පරිසර හිතකාමී බව සුරැකීමත් පිළිබඳ දර්ශීය පාසලක් බවට පත් වීමට පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය හේතු වී ඇත.

පාසල අලංකරණයෙන් යුතු ව සහ පිරිසිදු ව තබා ගැනීම පාසල තුළ ක්‍රියාත්මක වන දිගුකාලීන මෙන් ම කෙටිකාලීන ක්‍රියාකාරීත්වයේ

ප්‍රතිඵලයකි. මීට අදාළ කෙටිකාලීන ක්‍රියාකාරිත්වය, පාසල ඇරඹීමට පෙර සිදු වන උදෑසන ක්‍රියාවලියෙන් මැනවින් නිරූපණය වේ.

2 වන ලියවැල් අලංකරණය :

පාසලේ උදෑසන ක්‍රියාවලිය පිළිබඳ නිරීක්ෂණ සටහනක්

ක්‍රමයෙන් සිසුහු පාසලට පැමිණෙති. පෙ.ව. 7.25 වන විට පැමිණෙන විදුහල්පති, කාර්යාලයට පිවිසේ. ශිෂ්‍යයෝ තමතමන්ගේ පන්ති කාමර වෙතට පියමං කරති. ඒ හා සමඟ ම කිසියම් අරමුණක් කරා අප ළඟා විය යුතු ය, යන සිතුවිල්ලෙන් ඔවුහු විවිධ කාර්යයන්හි නියැලෙති. පිරිමි ළමයෙක් පාසලට පිවිසෙන මාර්ගය පිරිසිදු කරයි. තවත් ශිෂ්‍යාවන් පිරිසක් පාවහන් ගලවා බුදුමැදුරට ඇතුළු වී එය පිරිසිදු කරති. සමහර දරුවෝ ජලනළවලින් ජලය ඉසිමින් මිදුලේ නැගී එන දූවිලි මග හරවනු ලබති. තවත් දරුවන් තිදෙනෙක් විල් බැරෝවක පුරවා ගත් මල් බාල්දිවලින් ජලය රැගෙන පිට්ටනිය වෙත ගොස් ඒවා සෑම තැන විසුරුවති. පිට්ටනියේ කටයුතු හමාර කළ ළමුන්ට $මේ ටිකත් අතුගාමු `යනුවෙන් ශිෂ්‍ය නායකයෝ සුහද ව කරුණු පහදා දෙති. මේ අනුව සුහදශීලී නායකත්ව ශෛලියක් විද්‍යමාන විය. තවත් පිරිසක් මල්පාත්තිවල බැමි සකසති. තවත් දැරියෝ පිරිසක් තමතමන්ගේ පන්ති පිරිසිදු කරති. නව යොවුන් වියේ සිසුන් පිරිසක් පඩි පෙළ අතු ගාති. තවත් පිරිසක් මල්වලට වතුර දමති. මල් වැට ද නිසි පරිදි සකසති. මේ චර්යා රටා සිදු වන අතරතුර ගුරුවරුන් සමහරෙක් සිසුන්ට උදව් වෙති. එසේ ම අධ්‍යාපනික කාර්යයන් ඇරඹීමට පෙර නිම කළ යුතු පාසලේ පිරිසුදු කිරීම් නිම කරන්නට ඔවුහු උත්සුක වෙති. හික්මීමෙන් ද ශික්ෂණයෙන් ද සතුටින් ද සාමූහිකත්වයෙන්ද කෙරෙන මේ උදෑසන ක්‍රියාවලියේ ප්‍රතිඵලය වන්නේ පරිසරය ලස්සන වූ එහෙයින් ම සාමකාමී වූ පාසලක් තුළ ඉතිරි කටයුතු කිරීමට අවශ්‍ය පරිසරයක් ජනිත වීමය.

පරිසරය අලංකාරය පිළිබඳ ව පාසල දක්වන අවධානය විශද ලෙස



දැක්වෙන පර්යාලෝක පාසලේ ගුරුවරියන් දෙදෙනකුගෙන් ලිඛිත ව ප්‍රකාශ වූයේ මෙසේ ය.

2 වන ගුරුවරිය - පාසල් අලංකාරය

3 වන ලියවැල් අලංකරණය:

වගාවන්ගෙන් තොර ව පැවති මෙම බිම් කොටසෙහි අලංකාර මල් වගාවක් ස්ථාපනය කිරීමට විදුහල්පතිතුමා ඇතුළු ගුරු මණ්ඩලය තීරණය කරන ලදි. පළමුවෙනි පියවර ලෙස ගුරු මණ්ඩලයෙන් කිහිප දෙනකු තෝරා මල් වගාවේ විශේෂිත වූ කාර්යයන් කිරීමට පැවරින. දෙවෙනි පියවර ලෙස නියමිත රටාවකට අනුව එම බිම් කොටස වෙන් කරන ලදි. මේ සඳහා පාසලේ චිත්‍ර ගුරු භවතාගේ සහාය නොමඳ ව ලැබිණ. මේ සමයේ පාසලට පැමිණි විද්‍යාපීඨ ගුරු භවතුන්ගේ සහාය ද ලබා ගත් අතර ඔවුන්ට උදව් වීමට10 හා 11 වන ශ්‍රේණිවල ළමයින් යොදා ගන්නා ලදි. බ්ලොක් ගල්වලින් රටාව නිම කළ පසු පාසල් පිට්ටනිය අසල උස් බිමෙන් පස් කපා ගෙනැවිත් පාත්ති පුරවන ලදි. එයට අවශ්‍ය කොම්පෝස්ට් පොහොර හා අමු කොළ (ග්ලිඩ්සිරියා) ළමුන්ගේ නිවෙස්වලින් ගෙන එයින් පස සාරවත් කරන ලදි. තෙවෙනි පියවර ලෙස පාත්තිය වටා සිටුවීමට අවශ්‍ය අලංකාර මුගුණුවැන්න හා මල් පැළ වර්ග ගුරු මණ්ඩලයේත් සිසුන්ගේත් සහාය ඇති ව සිටුවන ලදි.

හතරවෙනි පියවර ලෙස මල්වල ඉදිරි පැවැත්ම සඳහා අවශ්‍ය ජලය සම්පාදනය හා විටින් විට අවශ්‍ය වන පොහොර යෙදීමට මෙම ගුරු කණ්ඩායමට හා සිසුන්ට මහත් වෙහෙසක් දැරීමට සිදු විය. මේ සඳහා උදය, දහවල් හා පාසල් නිවාඩු කාලය යොදා ගන්නා ලදි. පාසල් දින පහ තුළ 7 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් ඒ සඳහා යොදා ඇත. එක් පන්තියකින් නායකයකු පත් කර ඔවුන්ට නියමිත දින ජල සම්පාදනය කිරීමට එම ළමුන් කාණ්ඩ වශයෙන් යොදවනු ලැබ ඇත. මෙම දිනවල දී නිසි ලෙස

කාර්යයන් ඉටු වේ ද යන්න සොයා බැලීමට පාසල් ශිෂ්‍ය නායකයකු පත් කර ඇත. නිවාඩු කාලය තුළ දී මේ කාර්යයන් සඳහා පාසල අසල සිටින ළමුන්ට වගකීම් පවරා ඇති අතර ඔවුන්ගේ කටයුතු සොයා බැලීමට සමස්ත ගුරු මණ්ඩලය ම පත් කර ඇත. මේ සඳහා එක් ගුරුවරයකුට මාසයකට එක් දිනක් පමණක් යොදා ඇත. ජලය සැපයීමට නිවාඩු කාලයේ පැමිණෙන ළමුන්ට පොත් පැන් පැන්සල් වැනි දේ ප්‍රදානය කරයි. මල් වගාවේ සාර්ථකත්වයට පසු පැළ අලෙවි කොට ලබන ආදායමෙන් මල් වගාවට අවශ්‍ය ගොම පොහොර හා උපකරණ ලබා ගනු ලැබේ. දිනපතා වී ය ලී යන මල් කොළ ආදිය ඉවත් කරමින් ද වල් පැළෑටි ඉවත් කිරීමෙන් ද නිරන්තරයෙන් නඩත්තු කිරීමක් සිදු වෙයි. පාසලේ ඉදිරිපස කොටස (3, 4, 5 ශ්‍රේණි ඉදිරිපිට) සකස් කිරීම සඳහා එම පන්තිවල පන්ති භාර ගුරුතුමියන් හා එවකට සිටි විද්‍යාපීඨ ගුරු භවතුන්ගේ සහාය ලබා ගන්නා ලදි. දිනපතා නඩත්තු කටයුතු එම ශ්‍රේණි භාර ගුරුතුමන්ලාගේ සහ සිසුන්ගේ සහායයෙන් කරනු ලැබේ. නිවාඩු කාලයේ වැඩ කටයුතු කිරීමට ඉහත මල් වගාවට ජලය සපයනු ලබන සිසුන් යොමු කරනු ලැබ ඇත. පරිසර අලංකාරයට කෘෂිකාර්මික බෝග වගාවන් ද එක් කිරීමෙන් එහි අලංකාරය ද වැඩි කොට ඇත. එම බෝගයන්ගෙන් පාසලේ දිවා ආහාර වේලට ද ප්‍රයෝජනයක් ලැබේ.

### 4 වන ලියවැල් අලංකරණය:2 වන ගුරුවරිය - පරිසර අලංකරණය

පරිසර අලංකරණ කටයුත්තේ දී පාසල් බිම ප්‍රධාන වශයෙන් කලාප 6කට වෙන් කර ඒ කලාප සඳහා සිසුන් හා ගුරු මහත්ම මහත්මීන් බෙදා වෙන් කර ඇත. කලාපය පිරිසිදු කිරීම, මල් පැළ සැකසීම, මල් පැළ සඳහා ජලය හා පොහොර යෙදීම ආදී කාර්යයන් ගුරු මණ්ඩලයේ අධීක්ෂණය හා උපදෙස් මත ඔවුන් විසින් කරනු ලබන අතර මෙහි දී සිසුන් කැමැත්තෙන් ම සිය වගකීමක් හා යුතුකමක් ලෙස සලකමින් මහත් ඕනෑකමින් යුතු ව මෙම කාර්යයේ



නියැලේ. මෙහි දී මල් වගාවන් සඳහා අවශ්‍ය පොහොර පාසලේ දී ම නිෂ්පාදනය කර ගනු ලබන අතර මුළුතැන් ගෙයින් ඉවතලන අපද්‍රව්‍ය කොළ රොඩු ආදිය යොදා ගනිමින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කරනු ලබන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. අප විද්‍යාලය පොලිතීන් භාවිතයෙන් තොර වන අතර දිරා යන දේ කොළ රොඩු ආදිය දැමීම සඳහා වැටකින් ආවරණය වූ තීරුවක් එක් කලාපයක ද අනෙක් කලාප සඳහා සකස්කරන ලද කුණු වළක් ද ඇත. කඩදාසි වැනි දෑ දිනපතා මෙහි දී පුළුස්සා දමනු ලැබේ. මීට අමතර ව උණ බට යොදා ගනිමින් සකස් කරන ලද කසළ බඳුන් කීපයක් පාසල් බිමේ ස්ථාන කීපයක ම රඳවා ඇත. මෙම බඳුන් තැනින් තැනට ගෙන යා හැකි සේ සකස් කර ඇත. මීට අමතර ව බඳුන්ගත මල්පැළ වගාව ද පරිසර අලංකරණයේ දී වැදගත් ය. එළවළු සහ පලා වර්ග ද බඳුන් ගත වගාවක් ලෙස සකස් කර ඇත. දිනපතා මෙම වගා සඳහා ජලය සැපයීමත්, පොහොර යෙදීමත් ක්‍රමානුකූල ව කරනු ලබන අතර මල්පැළ අලෙවිය සඳහා තබා ඇත. එම පැළ අලෙවියෙන් ලැබෙන මුදල් පොහොර සකස් කිරීම සඳහා යොදා ගනී. මීට අමතර ව වැසිකිළි හා කැසිකිළි පවිත්‍ර කිරීම සඳහා ද විශේෂ වැඩ සටහනක් ක්‍රියාත්මක වේ. දිනකට කීප වතාවක් ජලය යෙදීමෙන් වැසිකිළි හා කැසිකිළි පවිත්‍ර ව තබා ගැනීමට කටයුතු කරනු ලබයි.

### ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පෝෂණය පිළිබඳ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම

පාසලේ ඉගෙනුම ලබන දරුවන් වැඩි දෙනකු ආර්ථික අපහසුතාවන්ගෙන් පිරී දෙමාපියන්ගේ දරුවෝ වෙති. එබැවින් ඔවුන් ඌනපෝෂණ තත්ත්වයෙන් යුක්ත වූවන් බව හඳුනා ගන්නට ලැබුණි. දෛනික ව පාසලට පැමිණෙන දරුවන්ගේ සංඛ්‍යාව 350කට ආසන්න ය. මෙම සංඛ්‍යාව සඳහා දිවා ආහාරය ලෙස දෙමාපියන් තම නිවෙස්වල පිසින ලද ආහාරයක් ගෙනැවිත් කෑමට පුරුදු වී තිබිණි. සමහර දරුවෝ ආහාර ගෙන ඒමට තරම් ආර්ථික ශක්තියක් නොමැති දිළිඳු අය වූ හ. එමෙන් ම

කෙනකු රසවත් ආහාර ගෙන එන අතර තව දරුවකු ප්‍රිය මනාප නො වන, ගෙදරින් දෙන කුමක් හෝ ආහාරයන් රැගෙන එනු නිරීක්ෂණය කළ හැකි විය. මෙය ළමා මනස තුළ විවිධ හැඟීම් ඇති කරවන්නකි. සුපිරි පාසලක හෝ නගරාසන්න ජනප්‍රිය පාසල්වල දරුවන්ට ආහාර පාන සඳහා දෙමව්පියන් දක්වන උනන්දුව මේ පාසලේ දරුවන් වෙත දැක්වීමට තරම් හැකියාවක් දෙමාපියන් තුළ නො වන්නේ එදිනෙදා වේල සොයා ගැනීමට ජීවන සටනක යෙදෙන්නන් වැඩි දෙනකු මේ අතර සිටින බැවිනි.

5 වන ලියවැල් අලංකරණය : එල්. එස්. සූරියසුන්දර (නියෝජ්‍ය විදුහල්පති: සංවර්ධන) මහත්මියගේ පැහැදිලි කිරීම

> *සකුන්තලා පෙරමුණේ ප්‍රාථමික ශ්‍රේණි ඉංග්‍රීසි ගුරුවරියක්. එයා දවසක් ගැහැනු ළමයෙක් වේලිච්ච සුදු පාන් කෑල්ලක්, මේසයට ඔළුව තබා ගෙන හංග ගෙන මේසෙ යටින් එය තබා ගෙන හොරෙන් කනවා දැකලා එයාගේ කෑම කොටසක් හැමදා ම ළමයාට දීලා තියෙනවා. මෙහෙම දෙයකුත් තියෙනවා. විවේකයට වතුර බීලත් සමහරු ඉන්නවා. නැති අයට මොකුත් නෑ. සමහරු කැන්ටිමේ වඩේ කාලා ඉන්නවා. සමහරු උදේ රැස්වීමේ කලන්තෙ දාලා වැටෙනවා. ඊට පස්සේ ප්‍රින්සිපල් සර්රුත් කල්පනා කළා ළමයින්ට ඉස්කෝලෙ දී කෑම දෙන එක හොඳ යි කියලා. ඉස්සෙල්ල ම කොළ කැඳ දුන්නා. පස්සේ ධාන්‍ය මාරුවෙන් මාරුවට දුන්නා. සාපේක්ෂ ව ගණන් බැලුවහම ධාන්‍ය ගණන සැර වැඩි නිසා ළමයින්ට බත් දෙන්න තීරණය කළා. ළමයින්ගේ බඩත් බත්වලින් පිරෙනවා.*

ඩබ්. එම්. පී. කේ. වීරසේකර (නියෝජ්‍ය විදුහල්පති: පරිපාලන) මහතා පවසන පරිදි දැනට විශ්‍රාම ගොස් ඇති ගුරු මහත්මියකගේ මුදල් පරිත්‍යාගයකින් ව්‍යාපෘතිය ඇරඹිණි. 2001 අප්‍රේල් 02 වන දින සිට පෝෂ්‍යදායක දිවා ආහාර වේලක් ලබා දීම පාසලේ පෝෂණ ව්‍යාපෘතියේ ආරම්භය ලෙස සැලකිය හැකි ය. මෙය පාසල් දරුවන්ගේ පෝෂණ තත්ත්වය නංවාලීමේ අත්‍යාවශ්‍යතාව හඳුනා ගැනීමත් සමග ඊට සමගාමී ව සිදු වූවකි. පෝෂණ ව්‍යාපෘතිය පිළිබඳ අදහස විදුහලේ පාසල් සංවර්ධන සමිතියට 2001.03.11 වන දින ඉදිරිපත් කරනු ලදු ව ඒකමතික ව ඊට එකඟතාව පළ විය. මෙම ව්‍යාපෘතිය කිසිදු මූලික ප්‍රාග්ධනයක් නො ලබා ඉතා සරල සමාජ මෙහෙවරක් ලෙස ආරම්භ කිරීමේ වටිනාකම පාසල් සමිති රැස්වීමේ දී පැහැදිලි කරන ලද්දේ විදුහල්පති විසිනි. එය මල්ඵල ගැන්වීම සඳහා පාසල් සංවර්ධන සමිතිය නො මඳ සහයෝගයක් ලබා දුන්නේ ය. අනතුරු ව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ආරම්භ කළ පෝෂණ ව්‍යාපෘතිය අද වන තුරු සාර්ථක ව පවත්වා ගෙන යනු ලැබේ. මෙය තවදුරටත් අඛණ්ඩ ව පවත්වා ගෙන යාම පාසල් සංවර්ධන සමිතියේ අපේක්ෂාව වන හෙයින්, එය දිගුකාලීන වැඩ පිළිවෙළක් ලෙස ක්‍රියාවට නැංවීම සඳහා, එදිනෙදා ලබන අත්දැකීම් අනුව, අවශ්‍ය සංශෝධන සහිත ව ක්‍රියාත්මක වෙමින් පවතී.

පෝෂණ ව්‍යාපෘතිය තුළින් මුදුන් පත් කර ගැනීමට වෑයම් කරන ලද්දේ ප්‍රධාන වශයෙන් පාසලේ දරුවන්ගේ පොෂණය නගා සිටුවීම වුව ද ඒ තුළින් ඇති වන අතුරු ප්‍රතිඵල ගැන ද අවධානය යොමු කරන ලදි. ඒ අතුරු ප්‍රතිඵල නම් :

1. සියලු ම සිසුන්ට සමාන ආහාර වේලක් ලබා දීම සහ සිසුන් තුළ සමානාත්මතාව ඇති කිරීම
2. සිසුන්ට යහපත් පුරුදු පුහුණු කිරීම
3. ප්‍රජා සහභාගීත්වය වර්ධනය කර ගැනීම
4. ආර්ථික අගහිඟතා ඇති දෙමාපියනට උපකාර කිරීම
5. පාසලේ පවිත්‍රතාව ආරක්ෂා කර ගැනීම
6. පාසල් විවේක කාලයේ සිසුන් බාහිර වෙළෙඳසැල්වල ගැවසීම වැළැක්වීම
7. සිසුන් අතර අනවශ්‍ය මුදල් පරිහරණය වැළැක්වීම
8. සිසුන්ගේ පෝෂණ තත්ත්වය වර්ධනය කිරීම තුළින් ක්‍රියාශීලීත්වය වර්ධනය කිරීම

විනය ගරුක, ආචාරශීලී, සමාජ හිතකාමී, සමානාත්මතාව අගයන සෞඛ්‍ය සම්පන්න බවින් යුත් ක්‍රියාශීලී දරුවන් පිරිසක් සමාජයට දායාද කර දීම ව්‍යාපෘතියේ සමස්ත පරමාර්ථය වී ඇති බව මේ අනුව පැහැදිලි ය. විවිධ තරාතිරම්වලට අයත් දරුවන් එක් පියසක් තුළ වෙසෙන විට ඇති වන මානසික ගැටුම හා සමාජ විරෝධී ක්‍රියාවලට පෙලඹවීම වළක්වාලීමට සුදුසු ව්‍යාපෘතියක් ලෙස ද මෙය දක්වාලිය හැකි ය.

ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය සියලු උපකරණ සංවර්ධන සමිතිය මගින් සපයා ගනු ලැබුණි. ආහාර පාන සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගැනීම, එම ද්‍රව්‍ය පරිත්‍යාගශීලීන්ගෙන් හෝ දෙමව්පියන්ගෙන් ලබා ගැනීම, ලැබෙන ද්‍රව්‍ය එදිනෙදා පරිභෝජනය සඳහා යෙදවීම යන කාර්ය සඳහා අධීක්ෂණ ගුරු කමිටුවක් විදුහල්පතිතුමාගේ මග පෙන්වීම යටතේ ක්‍රියාත්මක කර ඇත. මෙහි දී එක ම වියදම ලෙස පෙනී යන්නේ දිවා ආහාර පිළියෙළ කිරීම සඳහා යොදා ගන්නා කාන්තාවන් දෙදෙනෙකු සඳහා වන රුපියල් 60 බැගින් වූ දෛනික දීමනාව පමණි. දැන් එම මුදල රුපියල් 75 දක්වා වැඩි කර ඇත. ඒ සඳහා අඟහිඟකම් ඇති ළමයින් හැර ඉතිරි ළමයින්ගෙන් දිනකට රුපියල බැගින් මසකට රුපියල් 20/- ක් එකතු කරනු ලැබේ. මුල දී ආහාර පිසීම සඳහා බාහිර කාන්තාවන් දෙදෙනකු සිටිය ද දැන් පාසලේ ළමයින් දෙදෙනකුගේ මව්වරුන් දෙදෙනකු මේ සඳහා යෙදවීමෙන් $අපේ දරුවන් සඳහා පිසෙන ආහාර` යන ආකල්පය ආහාර සකස් කරන අය තුළ ඇති කිරීමට සමත් වී තිබේ. අනික් සියලු කටයුතු සංවිධානය කර ඇත්තේ පාසල් විෂය බාහිර ක්‍රියාකාරකම් ඉටු වන අයුරින් පාසලේ ගුරු මණ්ඩලය විසිනි.

පාසල් පෝෂණ කමිටුවේ ක්‍රියාකාරකම් සහ භාරකාරත්වය පහත සඳහන් අයුරින් සකස් වී ඇත.

1 වන පියවර

1. සම්පත් පුද්ගලයින් හඳුනා ගෙන දැනුවත් කිරීමෙන් පසුව ලැබෙන ඉල්ලුම්පත් පිළිවෙළින් මාස්පතා ගොනු කිරීම

2 වන පියවර

1. සතියකට පෙර පරිත්‍යාගශීලීන් දැනුවත් කර නියමිත දිනට ආහාර ද්‍රව්‍ය ගෙන්වා ගැනීම හා මුළුතැන් ගෙයට නිකුත් කිරීම
2. ආහාර සකස් කරන්නන් හට සහාය වී කලට වේලාවට පිරිසිදු ආහාර වේලක් සකස් කිරීම:
3. එදිනෙදා පැමිණීම අනුව පන්ති කාමරවලට අවශ්‍ය ආහාර කොටස් කර නියමිත වේලාවට පන්ති කරා යැවීම
4. පන්ති භාර ගුරුවරුන් ලවා සිසුනට එම ආහාර බෙදා දීම.
5. ආහාර ගැනීමෙන් පසු එම උපකරණ සුරක්ෂිත ව ගබඩා කර තැබීම
   (i) එදිනෙදා ලැබෙන ද්‍රව්‍ය ලේඛන ගත කිරීම (ගිණුම් කටයුතු සහ පරිත්‍යාගශීලීන් හට ස්තුති කර දන්වා යැවීම)
   (ii) එදිනෙදා කෑම දෙන අයගේ නම් කළුලෑල්ලේ දැමීම. එදිනෙදාට අවශ්‍ය අඩුපාඩු (මුදල්/ ඉවීමට අවශ්‍ය තෙල්) බෙදා හැරීම

විවිධ වැඩ කොටස් ද විදුහල්පතිතුමාගේ මග පෙන්වීම යටතේ දිවා ආහාර සේවා කමිටුව මගින් පාසල් බාහිර ක්‍රියාකාරකම් වශයෙන් නොමඳ කැපවීමෙන් හා සහයෝගයෙන් ඉටු කෙරේ. මෙම අතිරේක ක්‍රියාකාරකම් සඳහා ගුරු මණ්ඩලය කැපවීම කරනුයේ ` තම දරුවන්ට බත් පිඩක් දෙන දයාබර මව්වරුන් ` ලෙසිනි. දිවා ආහාර සැපයීමේ ක්‍රියාවලියට දායක වීමට ගුරුවරුන් තම නිදහස් කාල වේලාව යොදා ගැනීමට හැකි අයුරින් කාල සටහන් සැලසුම් කර ඇති ආකාරය විදුහලේ කළමනාකරණ දක්ෂතාවක් සේ දැකිය හැකි ය. උදාහරණයක් වශයෙන් ළමුන්ගේ සේවය ආහාර පිසීම සඳහා ලබා ගන්නේ පාසල පටන් ගැනීමට පෙර ය. පොල් ගාන්නට පිරිමි ළමයින්ගේ සේවය ලබා ගනු ලැබේ. මැල්ලුම් ලිවීමට ගැහැනු ළමයින් යොදවා ගනු ලැබේ. මේ කාර්ය සඳහා 10 හා 11 වන ශ්‍රේණිවල ළමයින්ට දින බෙදා දී ඇත. තමන්ට හිමි දිනවල ළමයින් උදය ම පැමිණ තම වගකීම් ස්වේච්ඡාවෙන් ඉටු කරති. අහම්බෙන් ළමයකු නොපැමිණිය හොත් මේ සඳහා පුරුදු වූ ළමයින් කැඳවා ඔවුන්ගේ සේවය ලබා ගනු ලැබේ.

පෝෂණ ව්‍යාපෘතිය සඳහා මුල දී ඒ ඒ පන්තියට අවශ්‍ය ආහාර ප්‍රමාණය වෙන් කිරීම සඳහා වෙන ම හැඳි තිබුණි. එහෙත් අත්දැකීම් අනුව එක් පන්තියකට ලැබිය හැකි ආහාර ප්‍රමාණය ගැන දන්නා නිසා දැන්

ආහාර බෙදීම සඳහා එක හැන්දක් භාවිත කරනු ලැබේ. කුමන ළමයා වැඩිපුර ආහාර ගන්නේ ද කුමන ළමයා අඩුවෙන් ආහාර ගන්නේ ද යන්න ඒ ඒ ගුරුවරුන් දන්නා නිසා පන්තියේ සිටින ගුරුවරුන් පන්තියේ දී ද එක් එක් ළමයාට කෑම බෙදන්නේ එක් එක් ළමයාට අවශ්‍ය ප්‍රමාණයට ය. කුස්සියේ දී ඒ ඒ පන්තියට කෑම බෙදන, උයන්නට සිටින දෙදෙනා ද ඒ ඒ පන්තියට අවශ්‍ය කෑම ප්‍රමාණය පිළිබඳ ව දැනුවත් ව සිටිති.

කිහිප දෙනකු හැර අන් දෙමාපියන් සියලු දෙන පාසලේ සියලු සිසුන් සඳහා දිනක දිවා ආහාර වේල සඳහා වූ වියදම දරති. තම දරුවන් වෙනුවෙන් වසරකට දිවා ආහාර වේල සඳහා වන වියදමට වඩා අඩු මුදලක් වැය වීම නිසා ම, දෙමාපියන් පැකිළීමකින් තොර ව දිනක ආහාර වේලක් සියලු සිසුන් වෙනුවෙන් ලබා දීමට දක්වන උනන්දුව අගය කළ යුතු වේ. මේ නිසා ම දෙමාපියන් තුළ යහපත් ආකල්ප වර්ධනය කිරීමට මෙම ව්‍යාපෘතිය මග පාදා ඇත.

දානපතියකු වශයෙන් නගර ආසන්නයෙන් පමණක් නො ව පිට පළාත්වල අය ද මේ පාසලේ දිවා ආහාරය සැපයීමට පෙලඹෙනුයේ මෙහි ඇති වටිනාකම අවබෝධ කර ගෙන ඇති නිසා ය. එහෙයින් තම තමන්ගේ ජීවිතවල වැදගත් සිදුවීම් සිහි ගන්වමින් මෙය පුණ්‍ය ක්‍රියාවක් ලෙස සලකා කටයුතු කිරීමට පෙලඹී ඇත.

ව්‍යාපෘතිය යටතේ සැපයෙනුයේ ඉතා සරල මෙන් ම පෝෂණ ගුණයෙන් යුතු ආහාරයක් වේලකි. ඒ සඳහා දිනකට වැය වන මුදල රුපියල් 1200 - 1500 අතර ප්‍රමාණයකි. ඒ තුළින් දරුවන් 300 - 350 කට ආහාර සැපයීමට හැකි හෙයින් මෙය මහඟු පුණ්‍ය කර්මයක් ලෙස සලකා මෙයට දායක වීමට උනන්දු වී ඇත.

පාසල් දරුවන්ගේ සෑම දෙමාපියකුට ම මේ මුදල දරා වර්ෂයකට දිනක් ආහාර සැපයීමට අවකාශ ලබා දී ඇත. එහෙත් නැති බැරි දෙමාපියන් මේ ආහාර සැපයීමෙන් නිදහස් කර ඇත. නිදහස් කළ යුතු දෙමාපියන් හඳුනා ගැනීම සඳහා විධිමත් පරිදි දත්ත භාවිත කිරීම ද පාසලේ පවතින හොඳ කළමනාකරණ ව්‍යවහාරයකි. මේ ව්‍යවහාරය අනුව 2003 දී පවුලේ විස්තර දැන ගැනීමට පත්‍රිකාවක් රෝනියෝ කර සෑම ළමයකුට ම ලබා දී



ඇත. දිවා ආහාර ලබා දිය හැක්කේ කාට ද යන්න හඳුනා ගැනීමත් නිදහස් කළ හැකි ළමයින් නිදහස් කිරීමත් සඳහා විධිමත් ක්‍රමයක් මෙමගින් භාවිතයට ගැනීමක් සිදු වේ. 2003 දී දත්ත පදනම් කර ගත් මේ ක්‍රමය ඇරඹීමට ප්‍රථම ළමයින්ගෙන් ලබා ගන්නා වාචික දත්ත, තීරණ ගැනීම සඳහා යොදා ගැනිණි. මුදල් ගෙවිය හැකි අයගේ ද එක වර මුදල් ගෙවීමේ අපහසුතාව මග හැරවීමට, 2004 පෙබරවාරි මස ගත් තීරණයක් අනුව එක වර ගෙවන්නට නො හැකි දෙමාපියන්ට කොටස් වශයෙන් ගෙවීමේ පහසුව ද ලබා දී ඇත. මේ අනුව කිසියම් දිනක වියදමට අවශ්‍ය මුදල් අඩුවෙන් ලැබෙන විට එම දිනවල වියදම් පියවීමට අවශ්‍ය මුදල් පාසල් සංවර්ධන සමිතියෙන් ලබා ගනු ලැබේ.

දෙපාර්තමේන්තු භූමිකාව වශයෙන් බැලූ විට චක්‍රලේඛවලට සීමා නො වී පොදු සුභ සාධක හැඟීමෙන් පාසල් සංවර්ධන සමිතිය කටයුතු කිරීම නිසා මේ ව්‍යාපෘතියෙන් රජයට කිසිදු බරක් පැටවී නැත. එහෙයින් රජය මෙවැනි ව්‍යාපෘති හඳුනා ගැනීම වැදගත් වේ. මෙම කටයුතු සඳහා වෙනත් පාසල්වලට ද පහසුකම් සලසා දීමට රජයේ මැදිහත් වීම උචිත ය. විශේෂයෙන් ගොඩනැගිලි, උපකරණ අවශ්‍යතා සහ මග පෙන්වීමට අදාළ උපදෙස් ද මූල්‍යමය පහසුකම් ද සපයා දීමෙන් මෙම ව්‍යාපෘතිය අනෙක් පාසල්වලට ව්‍යාප්ත කිරීම දිරිමත් කළ හැකි ය. එනෙක් දෙගුරු සංගම් හෝ පාසල් සංවර්ධන සමිති මගින් තාවකාලික ගොඩනැගිලි ඉදි කර හෝ ව්‍යාපෘතිය ආරම්භ කරන ලෙසත් රජය විසින් ඊට සුදුසු පහසුකම් දිගුකාලීන ව සලසා දීමෙන් මෙම ක්‍රියාව විශේෂයෙන් හඳුනා ගන්නා පාසල් අතර ක්‍රියාවට නැගීමට සුදුසු ව්‍යාපෘතියක් බව යෝජනා කළ හැකි ය.

මෙම ව්‍යාපෘතිය තුළින් අඟහිඟකම් ඇති දරුවන්ට වූයේ ඉමහත් සෙතකි. ඒ පිළිබඳ ව තෙයාකාරයක සාක්ෂ්‍ය ඉදිරිපත් කළ හැකි ය. පළමු ව C.R. කිරිදෙන සහ E.D.N.N. විතානගේ මහත්මීන් දෙපළ සැකසූ පෝෂණ ව්‍යාපෘතිය පිළිබඳ පිටු 18න් සමන්විත ඇගයුම් වාර්තාවේ අනාවරණ සාක්ෂ්‍ය ලෙස පදනම් කර ගත හැකි ය. ඒ අනාවරණ විග්‍රහ කරන විදුහල්පති මෙසේ පවසයි.

> *දැන් අපේ ව්‍යාපෘතිය ආරම්භ වුණේ අප්‍රේල් මාසේ. ඊට පස්සේ මාස 3ක් යන කොට ළමයින්ගේ, සිසුයෙන් බර වැඩි වෙගෙන ආව. පස්සේ මොකක් ද හේතුවක් හින්ද දින 40ක නිවාඩුවක් ආවා, මාසෙකුත් දවස් 10ක්. ඒකේ දී 25 kgට ආපු*

*ළමයා ආපහු ඉස්කෝලෙට ඇවිත් තියෙන කොට බර 23kg යි. හැමෝගෙ ම 1kg, 2kgක් අඩු වෙලා බර. ආයි දවසක් දෙකක් ගිහින් එන කොට බර වැඩි වේගෙන එනවා*

6 වන ලියවැල අලංකරණය: විදුහල්පති ස්වකීය අත්දැකීම් මගින් ඉදිරිපත් කරන සිද්ධියක් සාක්ෂ්‍යයක් ලෙස

*ගිය සතියේ මං යන කොට ළමයෙක් නිදා ගෙන ඉන්නවා. කෑම බෙදන වෙලාව. මේ ළඟ උඩහ ගෙදර. කෑම බෙදන වෙලාවේ. ඊට පස්සේ පන්ති භාර ගුරුතුමියගෙන් ඇහුවා `මොක ද මෙයාට` කියලා. `අනේ සර්... ඔළුවේ කැක්කුම උණ හැදෙන්න කියලා.` ඊට පස්සේ මම කිව්වා `අපෝ බෝවෙන උණ තියෙනවා. දැන්මම ගෙදර යවන්න` කියලා, තව ළමයෙක් එක්කල එළියට දැම්මා. දැන් ළමයට යන්න බෑ. මෙහෙම ඉණට අත ගහ ගෙන ළමයා එක්කල යන්නේ. එයාගේ බරත් මෙයා ම අරගෙන ම තමයි එක්කල යන්නේ. මට නිකන් හිතුණා එදා හොඳ එළවළු බත් ද... කහ බත් ද... තිබුණේ. බත් පිඟානකුත් බෙදල අරින්න ඕන මේ ගෙදෙට්ට කියලා. ඊළඟ ළමයා අතේ මේ ළමයට බත් පිඟානක් ඇරියා, කාල ඉවර වෙල එයාට ගෙනිහින් දෙන්න කියලා. ඊට පස්සේ මම පැය භාගයකින් විතර බලන කොට ළමයා ආපහු ඉස්කෝලෙට එනවා.ඒ ළමයාට තිබිල තියෙන්නේ හාමත... තිබිලා තියෙන්නේ, හාමත. අම්මා රට ඉන්නේ. තාත්තා ගෙදර ඉන්නේ. ඒවුණාට ඒ වෙලාවේ තාත්තත් ගෙදර ඉඳල නෑ... බත් එ ක ගෙනිහින් දුන්න. බත් එක කෑවා. ඇඟට හරි, ඊට පස්සේ ආපහු ඉස්කොලේ ආවා.බලන්න මම ඔන්න ඔතන ගැන ඩිංගක් හිතල තමයි මං විශේෂයෙන් ඔය කථාව කිව්වේ. දැන් දවල් ආහාර වේල සමහරු උදේට කන්නේ නැතිව එනවා. ඒ අයටත් 10 වෙනකම් ඉඳලා මේ කෑම එක කෑව හැකි. මේ කෑමෙන් වේල් දෙක ම පිරිමැහෙනවා.*

ව්‍යාපෘතිය ශිෂ්‍ය ඉගෙනුම කෙරෙහි ද ප්‍රබල බලපෑමක් කළේ ය.

*මේ ව්‍යාපෘතිය නිසා අපිට පුළුවන් වෙලා තියෙනවා 1-2 පන්තිවල ළමයි 12ට අරින්න ඕන එක 12.30 වෙනකම් තියාගන්න. ඒ අයට වාචික ඉංග්‍රීසි ඒ කාලයේ කරනවා. දැන් ඒකෙන් හොඳ ඉංග්‍රීසි දැනුමක් ඇවිත් තියෙනවා. එතකොට 3-4 පන්තිවල ළමයින්ටත් 1.30ට ඇරෙන්න ඕනා. 2 වෙන කම් තියා ගන්න පුළුවන් කෑම දෙන හින්දා. ඒ පැය 1/2 ඒ ළමයින්ටත් ඉංග්‍රීසි උගන්නනවා. ඊළඟට 11 ළමයින්ට, විභාගෙට යන ළමයින්ට*



*හවස පැයක් තියෙනවා. ඔක්කොට ම කිසි බයක් නෑ. කෑම ගේන්න ඕන නෑ, මොකවත්. 12 ළමයින්ට 11 ළමයිට හොඳ බත් පිඟානක් හම්බ වෙනවා.*

තෙවනු ව ආහාර වේලෙහි ස්වභාවය ම එහි ගුණාත්මක බව පිළිබඳ ප්‍රබල සාක්ෂ්‍යයක් වන්නේ ය.

මෙම ව්‍යාපෘතිය තුළින් ඇති ව තිබෙන දරුවන්ගේ මනා හැසිරීම ද අගය කළ යුතු වේ. දරුවන් ආහාර වේල ලබා ගන්නා ආකාර තුළින් ඔවුන් ලද හොඳ පුරුදු ලෙස පහත සඳහන් කරුණු දැකිය හැකි ය.

*විනීත බව - ක්‍රමානුකූල ව ආහාර ගැනීම - ආහාර ගැනීමේ යහපත් පුරුදු - නාස්තියකින් තොර ව ආහාර ගැනීම - පිරිසිදු බව හා ප්‍රසන්න බව - පරිසර පවිත්‍රතාව (පොලිතින් වැනි අපද්‍රව්‍ය නොමැති කම)*

මේ පුරුදු පාඩම් මාලා ගණනකින් ඇති කළ යුතු කර්තව්‍යයක් වුවත් මේ හොඳ පුරුදු ක්‍රමානුකූල ව දියුණු කිරීමේ ලා ව්‍යාපෘතිය ඉවහල් විය. මේ අනුව බලන විට සමාජයට මෙවැනි යහපත් දරුවන් දායාද කිරීමට ලැබීම විදුහල ලත් වාසනාවත් ලෙස සැලකිය හැකි ය.

අතික් අතට පාසල් ළමයින්ට පාසලට එන විට මුදල් ගෙන ඒමේ අවශ්‍යතාව නැති වී ඇත. මුදල් ගෙනැවිත් කරන්නට දෙයක් පාසලේ නොතිබෙන නිසා ය. විවිධ ආහාර මිල දී ගැනීමට ආපන ශාලාවක් ද පාසලේ නැති නිසා මුදල් රැගෙන ඒමේ අවශ්‍යතාවක් පැන නො නගී. දෙමාපියන් ලෙස බැලීමේ දී යමක් කර කියා ගත හැකි, නො හැකි යන භේදයෙන් තොර ව තම දරුවන්ට සමාන ආහාර වේලක් ලැබීම ඔවුනට ඉතා සතුටට කරුණකි. මේ නිසා ම දරුවන්ගේ පැමිණීමේ වර්ධනයක් දක්නට ලැබේ.

පෝෂණ ව්‍යාපෘතියේ ඵල ලබන්නන් වන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මෙ මගින් ඇති වන ප්‍රයෝජනය අතිමහත් වේ. මේ බව මැනවින් පළ වන ලිපියක් ශිෂ්‍යයකු විසින් රචනා කරනු ලැබ තිබේ. දිවා ආහාරයෙන් මතු වන ශිෂ්‍ය සන්තුෂ්ටිය මේ මගින් මොනවට පළ වේ.

7 වන ලියවැල අලංකරණය: විදුනැණ ගුණ නැණ ඇති කරනා - රස අහරින් නිති කුස පුරණා - පුෂ්පාදාන විදු මව් දිලෙනා

*විදු නැණ නැමැති රසාහාරය සමඟ පෝෂ්‍යදායී ආහාර වේලක් සපයන දිවයිනේ එක ම පාසල වන ඊරියගම ශ්‍රී පුෂ්පාදාන විද්‍යාලයේ සිසුවකු වන මම මේ ලිපිය ලියනුයේ මහත් සොම්නසින් යුතු ව ය. ආර්ථික සාමාජීය ගැටලු අතර පීඩිත ව පවතින සුවහසක් දෙමාපියන්ට මද හෝ අස්වැසිල්ලක් වෙමින් එසේ ම පාසලේ සැම සිසුවකු තුළ ම ගුණවත් සදාචාරාත්මක හැඟීම් සමඟ යහපත් සෞඛ්‍ය පුරුදු නංවමින් අර්ථවත් චර්යාවෙන් හා සමානාත්මතාවෙන් හෙබි මානව සමාජයක් බිහි කිරීමත් ඒ තුළින් පොදු සමාජයට ම යහපත සැලසීමේ අටියෙන් ඉන්ද්‍රඛීලයක් බඳු වූ අප විදුහල්පතිතුමාගේ අප්‍රතිහත ධෛර්යෙන් ද මනා ආරම්භක ශක්තියෙන් ද ඇරඹුණු මෙම වැඩ සටහන එනම් පෝෂණ ව්‍යාපෘතිය සත්‍ය වශයෙන් ම සාර්ථක වී හමාර ය.*

*ගුරු මැණිවරුන්ගේ ද පියවරුන්ගේ ද කැපවීම තුළින් යහපත් අධ්‍යාපනය සමඟ පුරා වසරක් සැම දරුවකුට ම දිවා ආහාරය සපයන බව මහත් සොම්නසින් යුතු ව පාසල් ශිෂ්‍යයකු ලෙස පවසනු කැමැත්තෙමි. කාර්යශූර කාය ශක්තියෙන් හා මානසික සුවයකින් යුතු අනාගත සමාජයක් බිහි කිරීමේ මහඟු කාරීය සඳහා වූ මෙම වැඩසටහන දීප ව්‍යාප්ත ව සමස්ත ශ්‍රී ලංකාව තුළ ම මනා ව ක්‍රියාත්මක කිරීමට වගකිවයුත්තන්ගේ අවධානය යොමු විය යුතු වේ.*

*විහඟ ප්‍රමුදිත ප්‍රියංකර, 10 වන වසර, 2002.04.02*

කොතරම් හොඳින් කැම බෙදීමේ දී ද ආහාර ගත් පසු නැවත පිඟන් පිරිසිදු කිරීමේ දී ද ළමයින් හුරු පුරුදු වී ඇති ද යත් විනාඩි 20ක කාලය තුළ ආහාර ගෙන සෙල්ලම් කිරීමටත් යාමට තරම් ළමයින් ආහාර ගැනීමේ



ක්‍රියාවලියට පුරුදු වී ඇත. මේ තුළින් වුව පාසල් කළමනාකරණයේ සාර්ථක බව ඔප්පු කළ හැකි ය.

පෝෂණ ව්‍යාපෘතිය තුළ පර්යේෂණ ක්‍රමශිල්ප භාවිතය ද විශේෂ ලක්ෂණයකි. අදාළ තීරණවලට එළැඹීමට දත්ත ත්‍රිකෝණීකරණ ක්‍රමශිල්ප අනුගමනය කර ඇත. මැදිහත් වීමක් ද එම මැදිහත්වීමේ ප්‍රතිඵල නිරීක්ෂණයට පෙර - පසු තත්ත්ව සැසඳීමක් ද සිදු වී ඇති නිසා අර්ධ සම්පරීක්ෂණ පර්යේෂණ ක්‍රමශිල්ප ද භාවිත කර ඇත. පාසලට උචිත අයුරින් එහි ශක්‍යතා අනුව පෝෂණ වැඩසටහන සිදු වී ඇති නිසා ක්‍රියාමූලික පර්යේෂණවල මූලිකාංග ද පෝෂණ ව්‍යාපෘතියත් ඊට අදාළ ක්‍රියාවලියත් තුළින් පැහැදිලි ව හඳුනා ගත හැකි ය.

## නිගමන සහ ආදර්ශන

මෙතෙක් සාකච්ඡා කළ පාසල් ව්‍යවහාර ඔස්සේ හඳුනා ගත හැකි වූ ඕනෑ ම පාසලකට පදනම් කර ගත හැකි, පාසල් ප්‍රතිපත්ති කීපයක් වේ.

* ළමයින්ගෙන් අනවශ්‍ය පරිදි මුදල් එකතු කර නොගැනීම පාසලේ ප්‍රතිපත්තියකි. `දරුවාට පාසල බරක් නොවිය යුතු ය. පාසල දෙමාපියන්ට බරක් නොවිය යුතු ය` යනු විදුහල්පතිගේ මීට අදාළ දර්ශනය ප්‍රකාශ වන වාක්‍ය වේ.
* පාසලට පැහැදිලි දැක්මක් ඇත.

  නියෝජ්‍ය විදුහල්පති (පරිපාලන) පාසලේ දැක්ම පැහැදිලි කරන්නේ මෙසේ ය. ` *කවදා හරි ළමයා සමාජයට ආවා ම එයාට හිතෙනවා නම්, මතක් කරන්න පුළුවන් නම් මම අද මේ කරන දෙයට ශක්තිය ආවේ, මම අද කථා කරන මේ දෙවල්වලට හැකියාව ලැබුනේ පාසලෙන් කියලා ඒ තත්ත්වයට පාසල ගේන්නයි අපි උත්සාහ කරන්නේ. ළමයාට ඉස්කෝලෙට ආවාම ආශාවෙන් ඉන්න පුළුවන් තැනක් නිදහස් පරිසරයක් ගොඩ නැගීම යි අපේ අරමුණ.*`
* ඊරියගම පුෂ්පදාන විදුහලේ අගය කළ යුතු ව්‍යවහාරයක් වන්නේ ක්‍රියාත්මක කරන ව්‍යාපෘතිවලට අදාළ ව දත්ත රුස් කිරීම, එම දත්ත ක්‍රමානුකූල ව ගබඩා කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී එම

දත්තවලින් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම ය.

දත්ත මත තීරණ ගැනීමේ ලා විදුහල්පති ප්‍රමුඛ ගුරු මණ්ඩලය ගත් උත්සාහයකට හොඳ උදාහරණයක් ලෙස සැලකිය හැක්කේ පෝෂණ ව්‍යාපෘතිය පිළිබඳ පිටු 18ක් සමන්විත ඇගයුම් වාර්තාව යි. වාර්තාවේ අරමුණ වී ඇත්තේ පාසලෙන් ලබා දෙන දිවා ආහාරය කරණ කොට ගෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ බරෙහි වෙනසක් ඇති වී දැ යි සොයා බැලීම ය. 2001 වර්ෂයේ දී 6 වන ශ්‍රේණියේ සිටි ශිෂ්‍ය ශිෂ්‍යාවන් 17 දෙනකුගේ බර අප්‍රේල් 26 වන දින සිට දෙසැම්බර් 23 වන දින දක්වා මැන එම දත්ත එක් එක් ශිෂ්‍යයාට වෙන වෙන ම ප්‍රස්තාරානුකූල ව නිරූපණය කර ඇත. මේ දත්ත පදනම් කර ගෙන පාසලේ වාර අවසාන නිවාඩු කාලයේ දී බර අඩු වන ආකාරයත්, පාසල් කාලය තුළ බර වැඩි වන ආකාරයත්, මැනවින් නිරූපණය කර ඇත. පාසලේ ක්‍රියාත්මක වන පෝෂණ වැඩ සටහන පිළිබඳ ව විදුහල්පති හා ගුරුවරුන්ගේත්, දෙමාපියන්ගේත්, සිසුන්ගේත්, බාහිර පුද්ගලයන්ගේත් ප්‍රශංසා වාචික වන අතර ඒ ප්‍රශංසා ඔප්පු කිරීම සඳහා මේ වාර්තාවේ එන දත්ත උපයෝගී කර ගත හැකි ය. ඒ ඒ ශිෂ්‍යයන්ගේ පවුල් පසුබිමට අදාළ මූලික තොරතුරු ද (පියා හා මවගේ රැකියා, පවුලේ සාමාජිකයන් ගණන) වාර්තාවේ ඇතුළත් ය.

ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතියට අදාළ ව පවතින ඌනතාවක් නම් ගුරුවරුන් ද විදුහල්පතිවරුන් ද තමන් කරන කියන දේ පිළිබඳ ව පර්යේෂණාත්මක ව සොයා නො බැලීම යි. සමහර විට මේ සඳහා හේතු වී ඇත්තේ පර්යේෂණ සඳහා වූ දැනුම හා පර්යේෂණ පිළිබඳ ව්‍යවහාරික භාවිතය ගුරුවරුන් අතර අඩු වීම යි. මෙ වැනි තත්ත්වයන් යටතේ වුව ද පාසලේ පහසුකම්වලට අනුගත ව පෝෂණ ව්‍යාපෘතියක් ඇරඹීම, එම පෝෂණ ව්‍යාපෘතිය ඇගයීම සඳහා පර්යේෂණ වාර්තාවක් සැකසීම යන ක්‍රියාකාරකම් අගය කළ හැකි ය. පෝෂණ ව්‍යාපෘතිය පිළිබඳ ව කටයුතු කිරීමේ දී ක්‍රියාමූලික පර්යේෂණය භාවිත කරන්නේ කෙසේ දැ යි යනු පිළිබඳ නිපුණතා ලබා දීමෙන් මේ පාසලේ ගුරුවරුන්ගේ පර්යේෂණ නිපුණතා ඉහළ මට්ටමකට ගෙන යා හැකි ය.



* ප්‍රායෝගික කළමනාකරණ උපායමාර්ග භාවිතය හා ඒ මත ප්‍රතිපත්ති ගොඩ නැගීම තවත් ලක්ෂණයක් වේ. විදුහල්පති, මීට අදාළ ස්වකීය කළමනාකරණ උපායමාර්ග මෙලෙස පෙන්වා දෙයි.

*මට නම් තේරෙන්නේ, මේ පාසල්වල පාසලේ ප්‍රජාවත් එක්ක හොඳට දැනුවත් වෙලා, පාසලට ආවේණික වෙච්ච මොනවා හරි ක්‍රියාත්මක කරලා, පාසල් කළමනාකරණ සංවර්ධනයක් වෙන්න ඕන, ඒ විදුහල්පතිවරයාගේ මෙහෙයවීම යටතේ. ඔය නිකන් කවුරුත් යන විදියට අර පොතේ චක්‍රලේඛ ටික කරල හැන්දෑවට පොත වහල යන සංස්කෘතිය නැති කරන්න ඕන.*

*දැන් සමහර විට මේක රජයෙන් ම දෙනකම් ම ඉදල කරන්න අමාරුයි. මේ ආහාර ඉස්කෝලෙ ම දෙන්න ඕන. ඒක පාසල තුළ යම් සංවිධානාත්මක විධියකින් කරලා ළමයින්ගේ අවශ්‍යතා සම්පූර්ණ වෙනව නම් ඒකට දෙමාපියන්ගේ උදව් පුළුවන් විධියකින් දෙනවා.*
*මේක මේ පොඩි හිරිහැරයක් ඇත්තට ම. දැන් ඇත්තට ම මේක ආරම්භ කරපු දවස්වල මේ... මෙහෙම සහනයක් මට තිබුණෙ නෑ. සමහර විට රෑ 12ට ඇහැරිච්ච ම එළිවෙන කම් නින්ද යන්නේ නෑ. ඉතිරි ටික කොහොම ද මේක ගෙනියන්නේ? මේකට පුද්ගලයෝ හොයා ගන්නේ? මේක අඩාල වෙන්නැතුව මේක මං කොහොම ද කරන්නේ. ඒ වගේ අපහසුතා මුල දී වින්ද. ඒක නැතුව මේ එකපාරට මේ ලේසියෙන් නෙමෙයි. මේ අපහසුතාව මාසයක් දෙකක් වින්දට, දැන් අපි අවුරුදු ගණනක් හොඳ පැත්ත භුක්ති විඳිනවා. අපහසුවෙන් ගෙයක් ගොඩ නඟා ගන්න මැටි පාගල ඒ මේව කරලා ගෙයක් ගෙඩ නඟා ගත්තා. ගේ ඉන්න කොට අර සතුට තියෙනවා තමයි. හුඟ දෙනෙක් මේ ආරම්භයේ අපහසුව විඳින්න කැමති නෑ.*

* ශිෂ්‍ය අවශ්‍යතා සපුරාලීමේ දී පමණ දැන අවශ්‍යතා සපුරාලීමේ වැදගත්කම හෙතෙම පැහැදිලි කරන්නේ මෙසේ ය.

*මේක මං කිව්වට පිළිගන්නෑ. අදත් මං වෙන ඉස්කෝලෙකට ගියා. එහෙත් බත් දෙනවා. අපි යන කොට ළමයින්ට ඕනැවට වැඩිය බත් බෙදලා තියෙනවා. දැන් මිරික මිරික ඉන්නවා, ළමයි කා ගන්න බැරුව. අපි හිටිය හින්ද විසි කරන්නත් බෑ. එකක් ඔන්න ඔය කාරණෙ... ළමයින්ට අවශ්‍ය ප්‍රමාණය දෙන්න ඕනෑ. ගෙවල්වල වෙන්නේ ඒක නේ? බලහත්කාරයෙන් කවන්න ගිහින් මොකවත් කන්නේ නෑ.*

*අර සල්ලි කාරයෝ හරි, වැඩියෙන් සල්ලි දෙන්න පුළුවන් කෙනෙක් එයාට ඕන ඕන ජාති දෙන්න දෙන්න පුළුවන්. අපි එහෙම දෙන්නෑ. අයිස්ක්‍රීම් දෙන්නෑ. අරව මේවා දෙන්නෑ.*

*අපි දන්නවනේ ඒ දවස්වල...(වෙනත් පාසලක නමක් කියයි) ඉස්කෝලේ අපි අර කිව්වේ එදා යනකොට මුදලාලි කෙනෙක් හොඳ කෑම පැකට් ගෙනත් දීලා තිබුණා. මේ ඒ කෑම දෙකේ, පහේ ළමයකුට කන්නත් බෑ, ඒ බත් එකක්. පහුවදාට කෑම දෙන්න ඉන්න කෙනාට මේක කරන්නත් බැනේ. සාමාන්‍ය මිනිහා හිතනවා මට මෙහෙම කොන් වෙන්න බැනේ කියලා, කෙළින් ම එයා කෑමට ආධාර දීමේ වැඩපිළිවෙළින් අයින් වෙනවා.*

*අපි එදා ඉඳන්, මම සම්පූර්ණයෙන් තදින් ම ඉල්ලලා තියෙන්නේ ගුරු මණ්ඩලේට වුනත් කිසි කෙනකුට ඒ වගේ වියදම් කරලා කෑම නොදෙන්න කියල යි. ළමයාට පෝෂ්‍යදායක තත්වේ තියෙනවා නම් ඒකයි අවශ්‍යය. ඉතා ම පහසු වට්ටෝරු ටිකක් තමයි හදල තියෙන්නේ. මේක කාල දැන් ළමයින්ගේ බරත් වැඩිවෙලා තියෙනවා. දැනුමත් වැඩිවෙලා තියෙනවා. හොඳ පාසල් පරිසරයත් ඔක්කෝමත් ලැබිලා තියෙනවා. ඒකේ කිසි ම ගැටලුවක් නෑ එයාට.*



*ඇත්තට ම නිර්මාංශ ආහාරවලට අපි පුරුදු වෙන්න ඕන. අපි ගොටුකොළ මිටිය විකුණලා කුණු මාළු ටිකක් ගෙනල්ලා කනවා.*

* නොවැසෙන පාසලක් වීම ද විශේෂ ලක්ෂණයකි.

මේකේ තව වැඩසටහනක් තමයි පාසලේ නිවාඩු කාලේ දැන් මේ වෙනකම් අපි ළමයි ටිකයි ගුරු මණ්ඩලෙයි බෙදල හැමදාම ගුරු මණ්ඩලේ කවුරු හරියි ළමයි කට්ටියකුයි පාසලට එනවා අනිවාර්යෙන් තුන්සිය හැටපස් දවසෙම. ළමයි විතරක් නෙමෙයි ටීචර්ස්ලත් එනවා. දුර ඉන්නව නම් ඔය මාතලේ අරහේ මෙහෙ ඒ කට්ටිය කලින් ම දින වෙන් කර ගන්නවා. නිවාඩු දීපු ගමන් හරි ඒ කට්ටිය දින වෙන් කර ගන්නවා. හදිස්සියේ මොනවත් වුණොත් වෙන මාරුවක් කරගෙන නියමිත දිනේ තමන් එනවා. මාසෙක නිවාඩු කාලයක් තියෙන කොට ගුරුවරයකුට දවසක් දෙකක් ඔය ඇවිදින් තමන් රාජකාරි කරන තැනට කැරකිලා බලල යන්න බැරි නම් ඒ එක්කෙනාගෙන් වැඩක් නෑ.නිවාඩු කාලයෙත් ඉස්කෝලේ වහල තියන්න හොඳ නෑ. එතකොට තමයි ගමේ අය මේවා අනවශ්‍ය දේවල්වලට යොදාගන්නේ. හැම දා ම පාසල පවත්වන කොට අලංකරණ වැඩ සටහන් දිගට ම කර ගෙන ගියහැකි. මල්වලට වතුර දාන්න ඕනා. නිවාඩු කාලේ කියලා පාළුවට ඇරල අනිත් ගමන ආයේ ඒවා ගොඩ ගන්න ඕන නෑ. අපි ඒවා පොඩියක් නඩත්තු කරනවා.

* පාසල් භූමියේ සෑම තැන ම ප්‍රයෝජනයට ගෙන තිබීම ද විශේෂ ලක්ෂණයකි.

කෘෂිකර්ම පුහුණු ගුරුවරයකු වශයෙන් ලද දැනුම පාසලේ ප්‍රායෝගික ව අත්හදා බැලීමට විදුහල්පතිවරයකු වශයෙන් ගෙන ඇති උත්සාහය භූමි පරිහරණයෙන් මැනවින් පැහැදිලි වේ. පාසලේ ඉතා කුඩා ඉඩක් පවා ඵලදායි ව ප්‍රයෝජනයට ගෙන ඇත (6 වන රූපය). තමා ලද දැනුම

මෙයාකාරයෙන් නිර්මාණාත්මක ව ප්‍රායෝගික භාවිතයට ගන්නා අවස්ථා විරල බව පැවසිය යුතු ය.

දේශීය මෙන් ම විදේශීය පර්යේෂණවලින් ද තහවුරු වී ඇති පරිදි පාසලක දියුණුව සඳහා බලපාන ප්‍රධාන ම සාධකය වන්නේ එහි නායකයා ය. මහ/දෙනු/ ඊරියගම ශ්‍රී පුෂ්පදාන ආදර්ශ මහා විද්‍යාලය ශ්‍රී ලාංකික දේශීයත්වය ගැබ් වූ ඌරුවකින් මේ දැනුම සත්‍යයක් බව පෙන්වා දෙයි.

*                    *

(මේ පර්යේෂණය සඳහා මූල්‍යාධාර සැපයූ යුනිසෙෆ් ආයතනය සහ එහි පද්මිණී රණවීර මහත්මියටත්, පර්යේෂණය සඳහා අවශ්‍ය වාචික හා ලේඛන දත්ත ලබා දී අනුපමේය සහායයක් දැක්වූ විදුහල්පති, ආචාර්ය මණ්ඩලය සහ සිසුසිසුවියන් ඇතුළු ප්‍රජා සාමාජිකයන්ටත් මහනුවර ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යක්ෂ එන්. ඒ. එස්. බණ්ඩාර හා ව්‍යාපෘති සමායෝජක කේ.ජී. රණසිංහ මහතාටත් පර්යේෂක දෙපළගේ ස්තුතිය හිමි වේ)

සත්‍ය නම් ගම් ඇතුළත් කරන ලද්දේ විදුහල්පතිතුමාගේ ලිඛිත කැමැත්ත අනුවය.

# 4 RAPID MONITORING : THE KFIQ APPROACH

**Dr. Cesar M. Mercado**

## INTRODUCTION

Rapid monitoring is essential to efficient and effective project management. The key to rapid monitoring is an approach known as KFIQ. This approach was developed to simplify and speed up the monitoring of programmes and projects to catch up with the demand of management for information. KFIQ helps:

- Operationalize a project
- Separate monitoring from evaluation
- Develop a short and simple monitoring form
- Fast track data gathering, processing and reporting

## KFIQ CONCEPT

The KFIQ concept is a key to systematic programme/project operationalizattion, monitoring and evaluation. The letters:

K stands for key;
F for factor;
I for indicator;
Q for question



Thus, KFIQ means;

Key Factor (KF)
Key Indicator (KI)
Key Question (KQ)

KFIO explains that every project document is expected to have a set of interrelated elements such as:

List down opposite each KF key indicators (KIs). KIs are selected measurable words indicating the unit of measurement which maybe in terms of: :

- Number
- Amount
- Weight
- Area
- Length
- Distance

The tables on page 4 demonstrates the process in operationalizing a UNICEF-funded programme of POPCOM entitled "Strengthening the Policy, Planning. Coordination and Monitoring of the Adolescent Fertility and Youth Development Programme"(PHI/95/PO9). The same table is also useful for developing a monitoring or evaluation tool as shown in the succeeding pages. The table shows that the objectives of a project document contain key factors (KFs). Each KF has key indicators (KIs). Once the key indicators are identified, the key questions can now be formulated. These key questions are then organized into a monitoring tool.

## SEPARATE MONITORING FROM EVAUATION

Monitoring and evaluation (M & E) are extremely important functions of project management. The tell management about the progress of a programme/project an the potential and actual problematic areas before the problems get worse to unmanageable level. M & E serve as extension of the two most important senses of the manager.

- Monitoring for the eyes or sense of sight
- Evaluation for the ears or sense of hearing

M & E system and tools must be prepared during the first planning process. These help management appraise periodically the accomplishments and the problems of the programme/project during and after the implementation process. The data suggest appropriate corrective measures to ensure the efficiency and effectiveness of project implementation. M & E also serve as mechanisms to help.

- Implementing staff tell management about their needs
- Management know the needs of the implementing staff

A monitoring and evaluation system is used to assess the project, not the project staff. A performance evaluation or audit assesses staff competence using a different measuring tool from that used in M & E.

Monitoring measures project efficiency, while evaluation measures project effectiveness. The other differences between M & E are shown in the table next page.



## Definitions

Monitoring is the process of determining the implementing staffs delivery of

- Inputs
- Activities
- Outputs

Evaluation is the process of determining the project's.

- Effects
- Impacts

On the target beneficiaries and the environment around them.

**Uses**

Monitoring is useful for determining periodically whether the project staff follow timely delivery of:

- Inputs
- Activities
- Outputs

Evaluation is useful for determining if the expected:

- Effects
- Impacts

Of the project on the target beneficiaries and the environment are accomplished according to plan.
Evaluation is useful for determining if the expected:

- Effects
- Impacts

Of the project on the target beneficiaries and the environment are accomplished according to plan.

Experience shows that the monitoring and evaluation tools are also extremely important in guiding the programme/project manager and the implementing staff what priority outputs must be produced on periodic basis.

**Separation**

Management always expects fast supply of monitoring and evaluation data. Unfortunately most monitoring and evaluation could not catch up with the manager's demand.

One very important technique to hasten data generation is to separate monitoring form evaluation. One long monitoring and evaluation form should be cut into:

- One short monitoring
- One short evaluation questionnaire
-

Short monitoring form or evaluation questionnaire means rapid:
- Data gathering
- Data categorization
- Data tabulation
- Data analysis
- Data interpretation
- Data reporting



**SHORT AND SIMPLE MONITORING TOOLS**

There are two types of monitoring tools that we can develop.

- Focus Monitoring Form – based on the project objectives, outputs, activities and inputs. This useful when we want to see only the physical outputs. With targets only accomplishments can be shown.

- Project Document-based Monitoring Form – based on the project work plan, description/justification of inputs and budget requirements. This can show both planned and actual accomplishment plus the percent accomplishments (%Acc) of both the physical and the financial aspects of the programme/ project.

**The steps in developing focus monitoring tools are:**

1. Review the expected inputs, activities, and outputs of the project. An input can be the number of montivators assigned in a certain area an activity can be a group meeting; and an output can be the number of wormen's group organized.

2. Ask project management about its information needs.

3. Decide on the key elements (KF) (inputs, activities and outputs) that should be monitored considering the information needs of management. Only one, two or three elements may be monitored depending on the information needs of management.

4. Identify the key factor (KF) under the selected key element that should be monitored. For example, if the KF chosen is output, this maybe women's group organized.
5. Identify the key indicator (KI) which can be used to measure the KF. The KI maybe the number and the size of the women's groups.

6. Decide on KI which should be used in developing the monitoring tool.

7. Use the KI in formulating key questions (KQ). For example, if the KI includes number and size of women's groups, then there should be two key questions in the Monitoring Form, one on number and another on size.

8. Organize the KQs into a systematic Monitoring Form complete with identification of respondent and instructions on how complete the form shown next page is a sample table on how to develop a focus monitoring tool.

9. Check if all the questions in the Monitoring Form are valuable to planning and decision making. To do this, ask yourself about the use of data which will be gathered from each question. Delete those questions to which expected answers do not have clear utility to the project.

10. Pretest the Monitoring Form among representatives of expected users and revise according to pretest results.

11. Reproduce and distribute revised monitoring form to users.

Shown before this page is a table that illustrates the Systematic Steps in Developing Monitoring form.



Another technique in developing a monitoring form is to convert the Budget Requirement in a UN project document into a Physical and Financial Monitoring Form as shown next page. This form, which includes the planned and the actual accomplishments per output and inputs, allows computation of the percent accomplishment (%Acc) per item. The steps in developing programme/project document based monitoring form are:

1. Convey the Description of Components/Line Items into Activities.
2. Convert the columns on year into:
   - 2.1 Physical/Output. Put three sub-columns such as Planned (PLN), Actual (ACT) and Percent Accomplishment (%Acc).
   - 2.2 Financial/Input. Put three sub-columns such Planned (PIN), Actual (ACT) and Percent Accomplishment (%Acc)
3. Put all the line items under activities.
4. See Workplan and Description/Justification on Inputs and indicate all outputs and PLN in the column on Physical (outputs).
5. See Description, Work/Justification of Outputs and Project Budget and indicate all relevant budgetary allocation under PLN in the column of Financial (Inputs).
6. Test Monitoring Form if the items and the columns gather the data that the form wants to gather.
7. Revise the form according to pretest results.

## SUMMARY

Two of the most important pre-requisites to efficient and effective programme/project implementation after approval of the programme/project proposal are:

- Operationalized project document
- Standardized monitoring tool

The KFIQ approach is essential in developing short, simple and systematic

programme/project key indicators (CHI) and key questions (KQ) for developing monitoring tool. The KFIQ means:

- Key factor (KF)
- Key Indicator (KI)

The KF and KI are essential for project operationalization. The KQ, together with the KF and KI, are essential for developing the monitoring tool. KFIQ is also useful for developing the evaluation tool. The monitoring tool and the evaluation tool work better if there is a systematic monitoring and valuation system.

The key factors (KF) are derived from the programme/project:

- Elements composed of :
    - o Objectives
    - o Outputs
    - o Activities
    - o Inputs

- Policy/strategy framework composed of
    - o Principles
    - o Concepts



The best KF are those derived form the objectives, outputs, activities and/or inputs because, in the final analysis, these are the ones used as standard for judging the success or failure of the programme/project. The best monitoring form must focus on the last three elements.

The key indicators (KI) can also be derived from the workplan and the Description of Components/Line Items or Budget Requirements in the programme/project document.

The key indicators (CHI) are derived from the KF. In general KIs are outputs with units of measurements such as number, amount, weight, height, thichness, length, volume etc.

The key questions (KQs) are ways of verifying whether the key indicators are already accomplished. The KQs are organized into a monitoring tool or evaluation questionnaire.

Monitoring forms measure outputs, activities and/or inputs; while evaluation questionnaires measure effects and impacts.

The KFIQ, as mentioned earlier, is used to develop short and simple monitoring tool or evaluationquestionnaire which speed up data gathering, processing, interpretation and reporting.

To develop short and simple monitoring tool, we must always ask ourselves about the use of data that we are gathering. If the use of the data is not clear, then we must remove the question from the monitoring form.

Internalizing these points will help a lot monitoring staff deliver timely data to the manager.

# 5 සාර්ථක ගුරුවරයකු වීමට විදුහල්පතිවරයකුගේ මඟපෙන්වීමක්.

ටී. ආර්. එස්. මීටියාගොඩ

ගුරුවරයා යනු සාමජය තුළ මෙන්ම තමා තුළත් පවත්නා අගතිගාමී ආකල්ප හා පැවතුම් විවේචනාත්මක ව පසිදිනා මානව නිදර්ශනයක් විය යුතුවා මෙන්ම විවිධ මානව කොටම් කෙරේ ගෞරවාන්විතව කටයුතු කරන්නෙකු හා අන්‍යෝන්‍ය අවබෝධයකින් යුතුව අනෙකුත් සමාජමය ප්‍රපංච අතර කටයුතු කරන්නෙකු විය යුතුය.

The teacher should be an example of a person critical of prejudiced attitudes and opinions held by himself and by society at large and trying to achieve some degree of mutual understanding and respect between identifiably different human groups. (An Introduction in curriculum development Stenhouse Lawrence 1975)

ගුරුවරයා පිළිබඳ ව මෙන්ම වර්තමානයේ බහුලව කතා කරන කාර්යක්ෂමතාවය ගැන ද සිතා බැලීම මාතෘකාවට මනා ප්‍රවේශයකි.

> ` Efficiency in deed in the key to human progress. It is only when progress takes place. Yet efficiency is just one side of the coin equally important is effectiveness. But the two are symbiotic mutually beneficial`



කාර්යක්ෂමතාවයේ විවිධ පැති පිළිබඳව අවබෝධය ලබා තිබීම ගුරුවරයකුගේ භූමිකාව වඩාත් ඵලදායිවීමට හේතුවකි. ඉහත උද්ධෘතය අනුව කාර්යක්ෂමතාවය මානව සංවර්ධනයේ දොරටුව විවර කර දෙන යතුර ලෙස අවිවාදයෙන් යුතුව පැවසිය හැකිවාක් මෙන්ම යම් ස්ථානයක සංවර්ධනය දෘශ්‍යමාන වේද, කාර්යක්ෂමතාවය ද ඒ හා බැඳී පවතිනු ඇත.

එසේම මානව සංවර්ධනය හා කාර්යක්ෂමතාවය කාසියක එක් පාර්ශවයක් නම් අනෙක් පස හිමිවනුයේ ඵලදායිතාවයටය. මේ පාර්ශව ද්විත්වයම එකසේ වැදගත් වන්නාක් මෙන්ම ඵල ප්‍රයෝජනයක් ලබා ගැනීම උදෙසා අන්‍යෝන්‍ය වශයෙන් එක්ව ක්‍රියා කිරීම වැදගත් බව අවබෝධ කර ගත යුතුය.

පන්තිකාමර කළමනාකරණයට, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදවල නව තාක්ෂණයන් ආදේශයට හා මානව සම්පත නිසි ලෙස හැසිරවීමට, කාර්යක්ෂමතා සංකල්ප සාර්ථක ගුරුවරයකුට මනාව ඉවහල් කර ගත හැකිය.

කාර්යක්ෂමතාවය යනු යමක් නිවැරදිව කිරීම මෙන්ම, ඵලදායිතාවය යනු නිවැරදි දේ පමණක් කිරීමක් බව අප තේරුම් ගැනීම ගුරු කාර්යභාරය ඉතා මැනවින් ඉටු කිරීමට හේතු පාදක වේ.

ගුරුභවතාගේ අභිලාෂයන් හා කාර්යක්ෂමතාවය අතර බැඳීමක් ඇත. ගුරු භවතුන් තම වෘත්තියට ප්‍රවේශවීමේ දී,

(i) සමහර ගුරුභවතුන් ඉහළ වෘත්තික බවක් ලබා ගැනීමට ගුරු වෘත්තියට ඇතුළත්ව ඇත.

(ii) ක්ෂණික උසස්වීම සඳහා මාවතක් ලෙස ප්‍රයෝජනයට ගැනීමට ඇතුළත්වීම.

(iii) නව ලොවටම ගැලපෙන නිමවුම්කරුවෙක් ලෙස ක්‍රියා කිරීමට හොඳම රැකියාව ගුරු වෘත්තිය ලෙස සලකා මෙම වෘත්තිය තෝරා ගත් පිරිස ඇත.

(iv) තම උසස් අධ්‍යාපන කටයුතු කර ගැනීමේ ක්ෂේම භූමියක් ලෙස සලකා ද,

(v) අනාගත පරපුර යහපත් කර ගැනීමේ උදාර සැබෑ අරමුණින් යුතුව ද ගුරු වෘත්තිය තෝරා ගත් පිරිස් ඇත.

(vii) වෙනත් රැකියාවක් ලැබෙන තුරු රැඳී සිටීමේ මධ්‍යස්ථානයක් ලෙස පාසල තෝරා ගන්නා පිරිස් නැතුවාම නොවේ.

(viii) තව ද සමහරුන් ගුරුවරයෙක් ලෙස ප්‍රවේශ වුවද කිසිදු අරමුණක් නොමැතිව වෘත්තියේ රැඳී සිටින අයද දක්නට ලැබේ. ඒ ඒ අභිලාෂ මට්ටම් අනුව ගුරුවරයාගේ කාර්යක්ෂමතාවය වෙනස්වීම වැළැක්විය නොහැකිය.

ගුරු වෘත්තිය තුළ අපට ගුරුවරු සහ ගුරුතුමන්ලා මුණ ගැසෙන වාර අනන්තය. මොන්ටේන්ගේ කියූ පරිදි මැනවින් පිරුණු හිසකට වඩා පුහුණු හිසකින් ගුරු වෘත්තියට පිවිසීම වඩාත් සේවයක් සැපයිය හැකිය. ගුරුවරුන් ලෙස ප්‍රවේශවන්නාවුන් හැමවිටම ගුරුවරයෙක් ෙ ලස නොව ගුරුතුමකු ලෙස සිතා දෙමාපියන් තමා කෙරේ තබා ඇති විශ්වාසය පිළිබඳව සංවේදීව කටයුතු කරන්නේ නම් කොතරම් වටිනේද?

(i) කාර්යක්ෂම ගුරුවරයකු වීමට නම් ඒ සඳහා සැලකිලිමත් විය යුතු අංශ රාශියක් ඇත. ඒ පිළිබඳව ඉදිරි ඡේදවල දි අවධානය යොමු කරනු ලැබේ.

(ii) ගුරුවරයකුගේ ආර්ශමත් චර්යාව ඉතාමත් වටිනේය.

(iii) පාඩම් සූදානම්, ඇඳුම, කථාබහ ආදිය පවා විධිමත් හා සංවිධානශීලී වීම වැදගත් වේ.

(iv) ගුරුවරයා සැමවිටම ශිෂ්‍යයාට වඩා ඉදිරියෙන් සිටින්නට නම් වෙනස්වන දැනුමක් සමඟ අපගේ දැනුම ද ගලපා ගැනීම අතිශයින් වැදගත් වේ. පරිගනක තාක්ෂණය හරහා ලොවම විශ්ව මිදුලක් වී ඇති අවස්ථාවක දැනුම යාවත්කාලීන කර ගැනීම ද කාර්යක්ෂමතාවයට අත්‍යවශ්‍ය සාධකයකි.



3. සැබෑ ගුරුවරයා සංවේදී පර්යේෂකයෙක්වීම, අනිවාර්ය අංගයකි. තම පන්ති කාමරය ශිෂ්‍ය මනස, හැසිරීම් විලාශය, දෙමාපිය පසුබිම ආදී සැම අංගයක් පිළිබඳවම අප නිරන්තර අවබෝධයක් ලබා තිබීම ඉතා වැදගත්ය. ළමයින් සැමවිටම කුතුහලයෙන් යුක්ත බව තේරුම්ගත යුතුය. ඔවුන් යම් යම් නව දේවල් සොයා ගැනීමේ ආශාවෙන් පෙළෙන පිරිසක්බව අමතක නොකළ යුතුය.

4. කාර්යක්ෂම ගුරුවරයෙක් වීමට නම් ඔහු සැබෑ වෘත්තිකවේදියෙක් වීම අත්‍යවශ්‍ය සාධකයක්ව පවතී. ගුරු වෘත්තිකභාවය සඳහා තමාගේ දැනුමේ තරම, වෘත්තිය පුහුණුව,අධ්‍යාපනික උගත්බව, ආචාර ධර්ම, නීති සංග්‍රහ ගැන අවබෝධය හා පිළිපැදීම සන්තතික අධ්‍යාපනය (Continues development) සඳහා වන නැඹුරුව, තමාගේ වගවීමේ (Accountability) හා කැපවීමේ (Commitment) තරම ඉතා වැදගත්ය.

5. බොහෝ ගුරුභවතුන් නව ඉගෙනුම් ක්‍රමවේද පිළිබඳව දක්වන නැඹුරුව අඩුවීමද කාර්යක්ෂමතාවයට බලපා ඇත. බොහෝ විට පන්තිකාමරයට කොටුවූ දේශන ස්වරූපයේ ඉගෙනුම් ක්‍රමවේදයන් ද අද දරුවන් පිළිකුල් කර ඇත. $(Chalk and talk Method)` වෙනුවට නිර්මාණශීලී නිපුනා පාදක ඉගෙනුම් ක්‍රමවේදයක් සොයා ගැනීමට ගුරු භවතුන් උනන්දුවීම කාලෝචිතය.

* ක්‍රියාකාරකම් පාදක ශිෂ්‍ය කේන්ද්‍රිය ඉගෙනුම
* නිගාමී ක්‍රමය වෙනුවට උද්ගාමී ක්‍රමය යොදා ගැනීම
* විද්‍යාත්මක ක්‍රමවේදය භාවිත කිරීම
* අනාවරණ ක්‍රමය හා කණ්ඩායම් සාකච්ඡා ක්‍රමයට පන්තිකාමරය හසුරුවීම
* පරීක්ෂණ හා ආදර්ශක මූලික ප්‍රවේශ යොදා ගැනීම
* නව තාක්ෂණයේ මෙවලම් හැකි අවස්ථාවල යොදා ගැනීම තුළින් නව රසවත් ඉගෙනුම් ක්‍රමවේද සොයා ගැනීම අසීරු නොවේ.

* රූකඩ, අභිරූපන ක්‍රමය, භූමිකා රංගන විලාශ, නව සංගීත රටා ගැන අවබෝධය තුළින් බොහෝ නිර්මාණශීලී පාඩම් සංවිධානය කිරීම අසීරු නොවේ.

6. තව ද ශිෂ්‍ය චර්යා ගැන හා අභිලාෂ මට්ටම් ගැන අවබෝධයක් ලබා තිබීමට අතිශයින් වැදගත් වේ. සිසුන්ගේ වයසින් මුහුකුරායත්ම ඉගෙනුම් උද්‍යෝගය මුල් තත්ත්වයට සාපේක්ෂව 25% කින් පමණ අඩු වන බව පර්යේෂකයන් සොයා ගෙන ඇත. එපමණක් නොව සිසුන් ඉගෙන ගන්නන් වාලේ ඉගෙනුම ලබනු වෙනුවට විශ්වාසයන් හඳුනාගෙන ඉගෙනීමට අවස්ථා ලැබේ නම් වඩාත් ක්‍රියාශීලීව ඉගෙනුම ලබන බව සනාථ වී ඇත.

සිසුන් ඉගෙනුමට සහභාගිත්වය ඇතිකර ගනුයේ ආශාව මත පදනම්ව බැව් අප වටහා ගත යුතුය. එකී ආශාව ඔවුන්ගෙන් දුරස් නොවන ආකාරයට ගුරු භූමිකාව හැසිරවේනම් පන්ති කාමරය ඵලදායි කිරීම අසීරු නොවේ.

දැනුම සන්තෝෂය යමක් ලැබුණා යන පහන් හැඟීම දරුවන් තුළ ඇතිකළ හැකිනම් එය ඉගෙනුමට මනා පෙළඹවීමක් බව අප වටහා ගත යුතුය.

7. තවද සිසුවකු යමක් කරන්නේ සම්මානයක් ලැබීමට හෝ දඬුවමකින් බේරීමට විය හැකිය. නැතිනම් ශ්‍රේණිගත කිරීමේ දී ස්ථානයක් ලබා ගැනීමට ආදරය, කරුණාව ලබා ගැනීමට විය හැකිය. ඒ ගැන ගුරු අවධානය යොමු කිරීම තුළ කාර්යක්ෂමතාවය නංවා ගත හැකිය.

8. තවද සැබෑ ගුරුවරයා විෂයමාලාව පිළිබඳව ද නිරන්තර අවබෝධයක් අවධි මනසක් ඇත්තෙකු වීම කාර්යක්ෂමතාවයට මනා සාධකයකි. විෂයමාලාවේ කාලීන වෙනස්වීම් හා නවතාවයන් ගැන මෙන්ම ඒවා පන්ති කාමරය තුළ ආදේශ කිරීමේ නිර්මාපකයකු ලෙස ද ගුරුවරයා කටයුතු කිරීම වැදගත් වේ. මෙහිදී සිසුන් නව විචාරශීලී චින්තන රටාවකට හුරුකරවීමට, නව නිමැවුම් සඳහා යොමු කිරීමට උනන්දුවිය යුතුය. නව නිපැයුම් සමාජ, ගවේෂණ කඳවුරු තුළින්, ඉගෙනුමත් ශිෂ්‍ය නිපුණතා සංවර්ධනයත් එකවර ඉටු කර ගත හැකිය.



ගුරු කාර්යක්ෂමතාවය සඳහා සැලසුම්කරණය ඉතා වැදගත් වේ. පාඩම් සැලසුම්කරණය පමණක් නොව පාසල් ඉගෙනුම් ඉලක්ක ප්‍රතිපත්ති හා ක්‍රියාවලීන්, පන්ති කාමර පරිසරය හා ක්‍රියාකාරකම් ද සැලසුම් කිරීම අත්‍යවශ්‍ය වේ. මේ සඳහා යොමුවීම තුළින් මනා කාර්යක්ෂමතාවයක් උත්පාදනය කරගත හැකිය.

9. තව ද කොතරම් තාක්ෂණික ක්‍රමවේද අනුගමනය කළ ද මානවීය ගුණධර්ම හා පෙළඹවීම් පිළිබඳව ගුරුභවතාගේ උනන්දුව අතිශයින් වැදගත්ය. මාෂ්ලෝ න්‍යායන් පිළිබඳ අවබෝධයක් ඇත්නම් එය පන්ති කාමරයේ ඉගෙනුම් ක්‍රියාවලියට ආදේශ කර ගත නොහැකි මන්දැයි සිතිය යුතුය.

බොහෝ විට අප උත්සාහ දරනුයේ වරදට දඬුවම් කිරීමට විනා ජයග්‍රහණයට ස්ථම්හන ලබාදීමට නොවේ. ගණිත පාඩමක ගණන් 10කින් 8ක් නිවැරදිව සාදා 2ක් වැරදුනහොත් වැරදුන දෙකට අප දරුවාට මානසික හෝ ශාරීරික දඬුවම් කරනු විනා නිවැරදි 8 වෙනුවෙන් සංවලනයක් ලබාදීමට උත්සාහ නොදැරීම කණගාටුවකි.

10. ශිෂ්‍ය ලැදියාව හා අවශ්‍යතා මෙන්ම ඔවුන්ගේ රුචි අරුචිකම් ගැන ද අපගේ අවධානය නිරන්තරයෙන් යොමුවිය යුතුය. විෂයක එක් ඒකකයකට උනන්දු නොවන ශිෂ්‍යයා තවත් ඒකකයක් ඉතා උනන්දුවෙන් හදාරන අවස්ථා අප කොතෙකුත් දැක ඇත. එසේම එක් විෂයකට දක්ෂ නොවන දරුවා තවත් විෂයකට ප්‍රවීණයකු විය හැකිය. මේ පිළිබඳව ගැඹුරින් සිතන්නකුට ඉගෙනුම් කාර්යක්ෂමතාවයට එය ද ඉවහල් කර ගත හැකිය.

11. වර්තමාන සමාජ ප්‍රවාහය තුළ ශිෂ්‍ය නෙත ගැටෙන මාතෘකා ළමා මනසට අම්හිරි අගෝචර ඒවා බව වැඩිහිටි අප සැම අවිවාදයෙන් පිළිගෙන හමාරය. එවැනි අගෝචර වටපිටාවක සිට පාසලට පැමිණෙන දරුවාට ගුරුවරයා සැබෑ මනෝ උපදේශකයකු, මිත්‍රයකු වීම, කාලීනව පැහැර නොහැරිය හැකි අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. මව-පියා විදේශගත සිට ඥාතියකු ළඟ සිටින දරුවාට එකම රැකවරණය සෙනෙහස

ලැබෙනුයේ පන්තිකාමරයේ දී ගුරුවරයාගේ වදන් තුළින් විය හැකිය. එබැවින් ගුරුවරයා සැබෑ මනෝ විශ්ලේෂකයකු ලෙස කටයුතු කරන්නට තමා උගත් පුහුණුව පන්තිකාමරයට ආදේශකර උපදේශන සේවාවක් සැලසීමට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදීත් , ඉන් බැහැරදීත් කටයුතු යෙදිය යුතුය. එසේ වුවහොත් ශිෂ්‍ය ගැටලු අවමවීම හෝ විසඳුම් ලැබීම හේතු කොට ගෙන එය වෙනත් ආකාරයකින් පන්තිකාමර කාර්යක්ෂමතාවය කෙරේ බලපානු ඇත.

12. ශිෂ්‍ය චර්යා කළමනාකරණය තුළින් ඉගෙනුමට අභ්‍යන්තරික අනුගතවීමක් ලබාගත හැකිය. එහෙත් මෙහිදී ගුරුවරයාගෙන් බලාපොරොත්තු ද ධනාත්මක විය යුතු අතර පාසල පිළිබඳ දරුවාගේ විශ්වාසය ඉහළ නංවන්නක් විය යුතුය.

13. තවද ගුරුභවතා නිර්මාපකයකු පමණක් නොව ව්‍යාපාර කළමනාකාරිත්ව ප්‍රවේශ භාවිත කරමින් පන්තිකාමරයට නවතාවයන් එකතු කරන්නකු අනාගත රැකියා ව්‍යුක්තියට පිළියම් ලබාදෙන්නෙකු ද විය යුතුය. මේ සඳහා නව සන්නිවේදන ක්‍රම ඔස්සේ දැනුම අත්දැකීම් පළපුරුද්ද ලබා ගැනීමට අවස්ථා හා නව අභියෝගවලට මුහුණදීමේ ඉඩ හසර ලබා ගැනීම අතිශයින්ම වැදගත් වේ. පන්තිකාමරය පමණක් නොව ශිෂ්‍ය ප්‍රජාවේ දෙමාපියන් නිසි ලෙස කළමනාකරණය කර ගැනීමේ වගකීම ද ගුරුවරයා වෙත පැවරී ඇත.

ඉලක්කයන් නැති සිසුන්ට උදව් කළ හැක්කේ කෙසේද? ඉගෙනීම අභියෝගයක් ලෙස නොව තමාට ඉදිරියේදී ප්‍රයෝජන ලැබෙන දෙයක් ලෙස වටහා ගැනීමටත් දක්ෂතා වැඩි දියුණු කර ගැනීමටත් ගුරුවරයාට අත්වැලක් සැපයිය හැකිය.

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන සන්නිවේදන නිපුණතා, පෞරුෂ නිපුණතා, පරිසර නිපුණතා, වැඩ ලෝකයට හුරුවීමේ නිපුණතා, ආගම හා ආචාරශීලී නිපුණතා, ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා හා ඉගෙනීමට ඉගෙනුම පිළිබඳ නිපුණතා පිළිබඳව ගුරුභවතා අවබෝධයක් ලබා තිබීම වැදගත්ය.



එහි සඳහන් ආගම හා අචාර ධර්ම පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම කාලීන අවශ්‍යතාවයක්ව පවතී. දැනුමෙන් පිරිපුන් පුද්ගලයකු වෙනුවට $3H` අත (Hand) හිත (Heart) හිස (Head) යන අංශයන් සමබරව ක්‍රියාත්මක වන අධ්‍යයනයක් සඳහා පන්තිකාමරයේ දරුවා මෙහෙයවීම කාර්යක්ෂම ගුරුවරයකුගේ පරම යුතුකමකි.

පාඩමක් සඳහා යෙදෙන විනාඩි 40න් විනාඩි 5ක් ආකල්ප වර්ධනයට ධනාත්මක සිතුවිලි ජනනය කිරීමට සිසුවාගේ මනස හසුරුවන්නට උත්සාහ දැරීම අපේක්ෂිත ඉලක්ක සාධනයට වඩාත් හේතු පාදක වේ.

14. ශිෂ්‍ය සතුට පදනම් කරගත් ඉගෙනුම් රටාවක් ගොඩනැගීම කාර්යක්ෂමතාවයේ තවත් පැතිකඩකි. `Learning centred classroom` නිර්මාණය කිරීම ජපන් පස් විධි සංකල්පය යටතේ පන්තිකාමර පිළිවෙළ කිරීම Course and effect (Fish Bone) Analysis වැනි නිර්මාණශීලී ක්‍රමවේද යොදා ගැනීම පන්තිකාමර ඵලදායිකරණයට හේතුවිය හැකිය. ඒ තුළින් සිසුන්ගේ තැවුල් නැති කිරීමට වැරදුනු තැන් සොයන ඒ වෙනුවට විකල්ප මාර්ගයන් සොයා දීමට, වැදගත් කාර්යභාරයක් ගුරුවරයාට කළ හැකිය.

15. සැබෑ කාර්යක්ෂම ගුරුවරයකු අගයන් හා හර පද්ධතීන් පිළිබඳව සැලකිලිමත්ව ඒවා ප්‍රවර්ධනය කිරීමේ වැඩ පිළිවෙලක් දියත් කිරීමට ද උනන්දු විය යුතුය.

අධ්‍යාපනයේ පරමාර්ථය විය යුත්තේ නව දේවල් කළ හැකි පුද්ගලයන් නිර්මාණය කිරීම නිසා පසුගිය පරම්පරාවෙන් කළ දේම නැවත කරන පුද්ගලයන් බිහි කිරීම නොවන බව ගුරුවරයා තේරුම් ගෙන සිටීම වැදගත්ය. (ජීන් පියාජේ)

The Teacher is circulations, redirecting disciplining questioning, assessing guiding directing, fascinating, validating, moving monitoring, challenging, motivating, watching moderating, diagnosing, trouble shooting, observing, encouraging, suggesting, modeling and clarifying. (Jamie Mackenize)

ඉහත උද්ධෘතය පිළිබඳව සිත් යොමු කරන්නේ නම් කාර්යක්ෂම ගුරුවරයකු ලෙස සංවර්ධනය වීමට ගත හැක්කේ ප්‍රවේශ හඳුනා ගැනීම අසීරු නොවේ.

කීර්තිය, නාමය, ලාභය ආදි කිසිත් නොතකා ශිෂ්‍යයා කෙරෙහි නිර්මල කරුණාවෙන්ම අපට අප මෙහෙයවා ගත හැකිනම් සාර්ථක ගුරුවරයකු කාර්යක්ෂම ගුරුවරයකුවීම අසීරු නොවනු ඇත.



# 6 කළමනාකරුවා හා භාවමය බුද්ධිය

ගයාති ප්‍රින්ස්ලි

බුද්ධිය යනු කුමක් ද? යන්න සෙවීමට 19 වන සියවසේ අගභාගය වනවිට විවිධ මනෝ විද්‍යාඥයින් සෑහෙන ප්‍රයත්නයක් ගන්නා ලදි. එහි ප්‍රතිඵල සෑහෙන දුරට සාර්ථක වුවත් 21 වන සියවස වනවිටත් එය නිමාවට පත් වී නැත. තවමත් ඒ පිළිබඳ මනෝ විද්‍යාඥයින් පර්යේෂණ පවත්වන අතර අප බුද්ධිය ගැන හදාරන්නේ විවිධ මනෝ විද්‍යාඥයින්ගේ විවිධ සොයා ගැනීම් හා නිර්වචන තුළිනි.

බුද්ධිය පිළිබඳ පැරණිම ගවේෂකයා වූයේ සර් ෆැන්සිස් ගෝල්ටන්ය (1880) ඔහු පවසන පරිදි බුද්ධිය යනු ඇස හා අත සමයෝජනයයි. මූලික සංවේදනය චාලක කුසලතා, උත්තේජ සඳහා ප්‍රතිචාර දැක්වීමේ වේගය ආදිය බුද්ධිය ලෙස අර්ථ දැක්විය.

බුද්ධිය පිළිබඳව විද්‍යානුකූල පර්යේෂණ පවත්වමින් ද්වි සාධක මතය ඉදිරිපත් කරන ලද්දේ චාර්ල්ස් ස්පියර්මන් විසිනි. (1873-1945) Spermenරුs two factor theory) G හා S ලෙස සාධක දෙකක් පුද්ගලයා තුළ යම් යම් විශේෂ හැකියාවලට අදාළව පවතින බව ඔහු විසින් පෙන්වා දෙන ලදි. G- General factor සියළුම මානසික හැකියාවලට පොදු සාධනය වන අතර S - Special factor යම් යම් විශේෂ හැකියාවලට පොදු සාධකයක් වන බව ඔහු පැවසීය.

ජීන් පියාජේ (1920-1980) පුද්ගලයකුගේ බුද්ධි වර්ධන අවධි 4කින් යුක්තව සිදුවන බව අනාවරණය කළේය.

අවු. 0-2 ඉන්ද්‍රියචාලක අවධිය

අවු. 2-7 පූර්ව ක්‍රියාකාරී අවධිය

අවු. 7-11 සංයුක්ත ක්‍රියාකාරී අවධිය

අවු. 11-15 වියුක්ත ක්‍රියාකාරී අවධිය

උපතේ සිට දරුවා මෙම අවධි 4 පසු කරමින් අවු. 15 වන විට ක්‍රමයෙන් පරිසරයට අනුවර්තනය වීම සිදුවේ. මෙය බුද්ධිය ද ප්‍රජානන සංවර්ධන න්‍යාය ලෙස හැඳින්වේ.

මින් පසු මනෝ විද්‍යාඥයින් රාශියක් නොයෙක් අදහස් බුද්ධිය පිළිබඳ ඉදිරිපත් කළ ද මෑතක් වනතුරු අධ්‍යාපනඥයින් විසින් සොයා ගත්තේ හොවාඩ් ගාඩ්නර් 1983 ඉදිරිපත් කළ බහුවිධ බුද්ධි න්‍යායයි. Multiple Intelligence Theory මෙය පෙරළිකාර මතයක් විය. $ මනුෂ්‍ය බුද්ධිය අතිශයින්ම පුළුල් වූ බොහෝ සෙයින් පොදුවේ පැතිර ගිය නිපුණතා (Competencies) සමූහයකින් සමන්විතය. දැනට මම ඉන් 8ක් ගණනය කළෙමි. තව බොහෝ තිබිය හැකිය.`

1. වාචසික භාෂාමය බුද්ධිය
2. සංගීත රිද්මයානුකූල බුද්ධිය
3. තාර්කික ගණිතමය බුද්ධිය
4. දෘශ්‍ය අවකාශමය බුද්ධිය
5. කායික සංචලනමය බුද්ධිය
6. අන්තර් ඇතුළාන්ත බුද්ධිය
7. අන්තර් පුද්ගල බුද්ධිය
8. ස්වභාව ධර්ම බුද්ධිය

මෑත දශකය තුළ බුද්ධිය පිළිබඳ ඉතාම වැදගත් සංකල්පයක් ඉදිරිපත් කළේ ඩැනියල් ගෝල්මන් (1995) විසිනි. ඔහු එය භාවමය බුද්ධිය හෙවත් චිත්තවේගික බුද්ධිය ලෙස හැඳින්විය. පවතින සම්ප්‍රදායික වියුක්ත චින්තන බුද්ධියට අමතරව චිත්තවේගමය බුද්ධිය යනුවෙන් ඊට වඩා වෙනස් වූ සමාජමය බුද්ධියක් ඇති බව ඔහු පෙන්වා දෙයි.



එකිනෙකා අතර ඇති අන්තර් වෙනස හඳුනා ගැනීමටත් යමෙකුගේ චිනත්නය හා ක්‍රියාවන්වලට මඟපෙන්වීම සඳහා තොරතුරු භාවිත කිරීමත් මගින් පුද්ගලයකුට තමාගේ සහ අනුන්ගේ චිත්තවේග යෝග්‍ය පරිදි හසුරුවා ගත හැකි වීමේ බුද්ධිය චිත්තවේගමය බුද්ධිය නම් වේ.

මෙය මෑත කාලයේ ඇමරිකානු සමාජයේ අතිමහත් ලෙස ප්‍රචාරය වූවකි. ඇමරිකානු මනෝ විද්‍යාඥයකු මෙන්ම පුවත්පත් කලාවේදියකු වූ Daniel Goleman (1995) දී Emotional Intelligence කෘතිය පළ කරන ලදි. ඔහු 1998 දී Working with Emotional Intelligence කෘතිය ද එළි දක්වන ලද අතර එම කෘති පසුගිය වසර කීපය තුළ ඇමරිකානු සමාජයේ වාර්තාගත අලෙවියකට තුඩු දුන් බවද සඳහන් වේ. භාවමය බුද්ධිය වැඩ ලෝකය හා සම්බන්ධ කරමින් නිකුත් කළ මෙම කෘතිය කළමනාකරුවකුට ඉතා වැදගත් අදහස් ලබා දේ. එසේම වැඩ ලෝකයට සම්බන්ධ වන අනාගත පිරිස් අධ්‍යාපනයෙන් පරිපූර්ණ පුද්ගලයෙක් බවට පත් කිරීම සඳහා ද වැදගත් අදහස් ලබා ගැනීමට මේ (Emotional Intelligence) භාවමය බුද්ධි සංකල්පය වැදගත් වේ.

මෙය විස්තරාත්මක න්‍යායක් වශයෙන් සංවර්ධනය කර ඩැනියෙල් ගෝල්මන් ඉදිරිපත් කළ ද මෙම භාවමය බුද්ධි සංකල්පය බොහෝ ඈතට දිව යයි. ඉගෙනුමට සම්බන්ධ භාවමය පදනමක් තිබෙන බව පළමුවෙන්ම පෙන්වා දී ඇත්තේ ප්ලේටෝ විසිනි.

බුද්ධි ඵලය (IQ) යනු කවුරුන් හෝ ගොඩ නැගූ බටහිර සංකල්පයකි. සමස්ත ලෝක ප්‍රජාවම එයින් මැනීම අයෝග්‍ය වූවකි. IQ වලින් මැනෙන්නේ බුද්ධියේ ඉතා සුළු කොටසකි. පුද්ගලයකු සතු බුද්ධියේ විශාල පරාසයක් මෙවැනි බුද්ධි ඵල මැනීමේ පරීක්ෂණවලට හසු නොවේ. මෙය හානිකර බුද්ධිමාන දර්ශනයකි.

බුද්ධිය, බුද්ධි පරීක්ෂණවලින් ම නිර්ණය කළ යුතු ද? පෞරුෂ ගති ලක්ෂණ, අන්තර් පුද්ගල සම්බන්ධතා ආදිය මෙවැනි බුද්ධි පරීක්ෂණවලට හසුවේද? මෙය සිතා බැලිය යුතු කරුණකි. අධ්‍යාපනය නිමා කර සමාජයට පිවිසෙන දරුවාට අවශ්‍ය බුද්ධිය කුමක් ද? යන්න අධ්‍යාපනඥයින් විසින් හඳුනා ගෙන තිබිය යුතුය. එසේම සමාජයේ

සංවිධානවලට ඇතුළත්වන්නේ මේ සාමාජිකයන්ය. සංවිධාන තුළ මනා කළමනාකරණයක් පවත්වා ගත යුතු වන්නේද මේ සාමාජිකයන් විසින්මය. ඔවුන් ඒ සඳහා කොතරම් දුරට ගැලපේද? ඒ සඳහා අවශ්‍ය නිපුණතා ඔවුන් අධ්‍යාපනය තුළින් ලබා ගන්නේද? යන්න දෙවරක් සිතා බැලිය යුතුය. මෙහිදී භාවමය බුද්ධි සංකල්පයට අනුව අධ්‍යාපනයේ පදනම ගොඩ නැංවීම ඉදිරි දශක කිපය තුළ සිදුවිය යුතුමය. අද වන විට ඇමරිකාව ඒ පිළිබඳව පියවර ගෙන හමාරය. එහෙත් දියුණු වෙමින් පවතින රටවල මේ සංකල්පය පිළිබඳව දැනුවත්ව ඇති සංඛ්‍යාව ද අතලොස්සකි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ භාවමය බුද්ධි සංකල්පය පිළිබඳව දැනුවත් පුද්ගලයින් අල්පය. එබැවින් අධ්‍යාපනයේ පදනම සඳහා භාවය බුද්ධි සංකල්පය කොතරම් දුරට ගලපා ගත යුතුද? අධ්‍යාපන අරමුණු තීරණය කිරීම අධ්‍යාපනයෙන් ලැබිය යුතු නිපුණතා මොනවාද? යන්න හඳුනා ගැනීමට මෙය වැදගත් වේ. වැඩ ලෝකයට සම්බන්ධ වන දරුවා තුළ තිබිය යුතු බුද්ධි මට්ටම කුමක් ද? කියා තීරණය කළ යුතුය.

කළමනාකරුවකුට නිතරම සංවිධානයක් තුළ පිරිසක් සමග කටයුතු කිරීමට සිදු වේ. කණ්ඩායම් හැසිරීම, පිරිසක් සමග කටයුතු කිරීම. පොදු අරමුණක් කරා සියළු දෙනා මෙහෙයවීම සඳහා පුද්ගලයකු නිපුණතා ලබාගත යුතුය.

මේ සඳහා මෙතෙක් පැවති බුද්ධිය පිළිබඳ න්‍යායන්ට වඩා කළමනාකරණය සඳහා වැදගත් වන්නේ භාවමය බුද්ධිය පිළිබඳ න්‍යායක් බව පැහැදිලි වේ.

අධ්‍යාපනයෙන් අද බිහිවන පරපුර තුළ භාවමය බුද්ධිය පවතී ද? එසේනම් සමාජය තුළ මෙවැනි ජනවාර්ගික ප්‍රශ්න, සංවිධාන තුළ බිඳ වැටීම, සමාජ පරිහානි සිදුවිය නොහැකිය. අධ්‍යාපනයේ බොහෝ විට පියවර ගන්නේ දරුවන්ගේ දැනුම දියුණු කිරීම පමණක්ම වේ. භාවමය බුද්ධියේ දැනුමට හිමිවන්නේ ඉතාම සුළු ඉඩකි. එසේ නම් දැනුම ලබා ගැනීමට පොරකන සමාජයක පුද්ගලයන් සතුව භාවමය බුද්ධිය පවතී ද? නව පොත පත, අන්තර් ජාලය ආදිය තුළින් බොහෝ විට ලැබෙන්නේ දැනුම පමණකි. එසේනම් එය ප්‍රමාණවත්වේ ද? මේ නිසාම සමාජය තුළ ගැටලු බොහොමයක් පැන නැගී ඇති බව පිළිගත යුතුය.



භාවමය බුද්ධිය යනු කුමක් ද?

මෙය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ.

1. පුද්ගල නිපුණතා - 3
2. සමාජයීය නිපුණතා - 2

පුද්ගල නිපුණතා (Personal Competencies)

1. තමා පිළිබඳ සිහිය (Self-awareness)

හෙවත් ස්වාත්ම සතිමත්බව. තමාගේ අභ්‍යන්තර මානසික ගති ස්වභාවය, රුචි අරුචිකම්, ශක්තීන්, ඥානය පිළිබඳ දැනුවත්වීම.

2. චිත්තවේග කළමනාකරණය (Managing Emotions)

තමාගේ අභ්‍යන්තර මානසික ගති ස්වභාවයන් හැඟීම් හා මානසික ශක්තීන් හසුරුවා ගැනීම හෙවත් කළමනාකරණය කර ගැනීම.

3. අභිප්‍රේරණය (Motivation)

තම අභිමත අරමුණු ළඟා කර ගැනීමට හේතුවන ආකාරයෙන් චිත්තවේග ප්‍රවණතා ඇති කර ගැනීම හෙවත් යම් නිජ්ඨාවන් උදෙසා ස්වයං පෙළඹවීමේ හැකියාව.

සමාජයීය නිපුණතා (Social Competencies)

4. සහකම්පනය (Empathy)

හෙවත් සහානුභූතිය, අන්‍යයන්ගේ හැඟීම් අවශ්‍යතා අපේක්ෂාවන් පිළිබඳව සහකම්පනයෙන් යුක්තවීම

5. සමාජ කුසලතා

සමාජමය ක්‍රියාකාරකම්වලට මනා ලෙස ප්‍රතිචාර දක්වමින් අන්‍යයන් හා ගැලපී කටයුතු කිරීමේ හැකියාව

ඉහත දැක්වෙන්නේ භාවමය බුද්ධි න්‍යායේ මූලික පදනමයි. ඉහත එක් එක් කරුණු විස්තරාත්මකව ඉදිරිපත් කිරීමට මේ ලිපිය තුළින් බලාපොරොත්තු නොවේ.

## භාවමය බුද්ධි සහිත සංවිධාන

පුද්ගලයකු තුළ මෙන්ම කිසියම් සමාජ සංවිධානයක් හෝ ව්‍යාපෘතියක් තුළ පවා භාවමය බුද්ධිය පවත්වා ගෙන යා හැකිය. චිත්තවේගික වශයෙන් එලෙස බුද්ධිමත් සංවිධානයක පවත්නා සංස්කෘතික ලක්ෂණ කිහිපයක් මෙසේ දැක්විය හැකිය. ඔබේ සංවිධානය තුළ හෝ ව්‍යාපාරය තුළත් මේ ලක්ෂණ තිබේදැයි පරීක්ෂා කළ හැකිය. සංවිධානයක් තුළ එකිනෙකට වෙනස් ගති ලක්ෂණ දරන පුද්ගලයන් රාශියක් එකම අරමුණක් කරා මෙහෙයවීම සිදු වේ. තම තමන්ගේ භූමිකා තුළ ඔවුන්ගේ කාර්ය භාරය මෙන්ම හැසිරීම් රටාද එකිනෙකට වෙනස්වේ.

මේ තත්ත්වය තුළ ජීවන සටනේ නිරන්තර වූ ජය පරාජය ලබන අයුරු විමසා බැලීමෙන් ඔවුන් එකිනෙකට වෙනස්වීම අපූර්වත්වයකින් දැකිය හැකිය. එයට හේතුවන්නේ ඔවුන්ගේ භූමිකාව තුළ හැසිරීම් රටාව මෙහෙයවීමේ දී ඔවුන් කෙතරම් භාවමය බුද්ධියෙන් කටයුතු කරන්නේ ද? යන්න මතය. භාවමය බුද්ධිය සංවර්ධනය කර ගැනීම තුළින් පුද්ගලයාට තරඟකාරී ලෙස සමාජයේ කැපී පෙනීමට හැකියාව ලැබේ. සමාජයේ වඩා යහපත් ජීවිත ගත කරන්නේ භාවමය බුද්ධිය වැඩි අයට බව මැත කාලීන පර්යේෂණවලින් හෙළිදරව් වී ඇත.

## භාවමය බුද්ධිය අධ්‍යාපනයට යොදා ගැනීම

භාවමය බුද්ධි සංකල්පයෙන් අපට ලැබෙන සුබ ආරංචිය නම් මෙම දක්ෂතා ලාබාල අවධිය සිටම ළමයින්ට ඉගැන්විය හැකි වීම යයි ගෝල්මන් දක්වයි. මෙහිදී පළමුවෙන්ම වැදගත් වන්නේ මේ දක්ෂතාවලට අගය හා ඒවා අධ්‍යාපන ක්‍රියාවලියට එකතු කිරීම සුදුසු බව පළමුවෙන් ගුරුවරුන් හා දෙමාපියන් විසින් හඳුනා ගෙන දැනුවත්වීමයි. ළමයින්ගේ භාවමය බුද්ධිය පෝෂණය කිරීම සඳහා ඔවුන්ගේ චින්තනය මෙහෙයවා ඒ අනුව හැසිරීමේ ක්‍රියා දියුණු කිරීමට දෙමව්පියන්ට හා පාසල්වලට කළ හැකි කාර්යභාරය අතිමහත්ය.

වර්තමාන පාසල් අධ්‍යාපනයේ දී චිත්තවේග කළමනාකරණය පිළිබඳව හෝ අනුන් අවබෝධ කර ගැනීමේ කුසලතා ලබා ගැනීමේ



අවස්ථා බොහෝ අඩුය. ඒ නිසාම දරුවන් ආත්මාර්ථකාමී බව ප්‍රදර්ශනය කරයි. සංවිධාන තුළ කටයුතු කිරීමේ දී අනෙකාගේ චිත්තවේග පිළිබඳ උනන්දු නොවේ. ඒ නිසාම බොහෝ ගැටලු පැන නගී. භාවමය බුද්ධිය සංවිධානයක පැවැත්මට හා ක්‍රියාකාරීත්වය වැදගත් වන්නේ මේ නිසාය.

## භාවමය බුද්ධිය සහිත සංවිධානයක ලක්ෂණ :

### සංවිධානය පිළිබඳ සිහිය

එම සංවිධානය, ස්වකීය බාහිර හා අභ්‍යන්තර අවශ්‍යතා පිළිබඳ සංවිධාන මට්ටමින් සතිමත්ම (අවබෝධයෙන්) සිටී.

### චිත්තවේග කළමනාකරණය

සුහදශීලී නායකත්වය, ප්‍රිති උත්සව හා සුදුසු පරිසරය සැකසීම මගින් සංවිධානයේ චිත්තවේග කළමනාකරණය කරයි.

### අභිප්‍රේරණය

අර්ථවත් සුභසාධක හා ප්‍රතිලාභ දීමනා මගින් සංවිධානයේ අභිප්‍රේරණ මට්ටම ඉහළ දමයි.

### සහකම්පනය

පාරිභෝගිකයා සහ සේවකයාගේ සහභාගිත්වය සමග අර්ථවත් හා ඵලදායි සබඳතා පවත්වා ගෙන යයි.

### සමාජ කුශලතා

සේවකයින් බඳවා ගැනීම,පුහුණු කරවීම, සේවක කාර්යක්ෂමතාව ඇගයීම මගින් සංවිධානයේ සමාජ කුසලතා මනා ලෙස නියාමනය කරනු ලැබේ.

සංවිධානයක් තුළ මනා කළමනාකරණයක් පවත්වා ගැනීමට ඉහත කරුණු සැලකිල්ලට ගැනීම වැදගත් වේ. මූලික කළමනාකණ න්‍යායන් ගොඩ නැගී තිබෙන්නේ මේ පදනම මතයි. එබැවින් භාවමය බුද්ධි සංකල්පය අධ්‍යාපනයට මෙන්ම වැඩ ලෝකය තුළ කළමනාකරණ කුසලතාවන්ට වැදගත් වන බව මෙයින් පෙනී යයි.

ආශ්‍රිත ග්‍රන්ථ


1. අධ්‍යාපනය, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය, 33 සඟරාව

2. Danial Golman, Emotial Intelligence

3. Danial Golman, Working with Emotional Intelligence


**web sites**


1. File//Emotional Intelligence for parents andfamilies htm

2. File//Emotioanl and Emotional Intelligence htm

3. File//H, Daniel Goleman Emotional Intelligence review htm

# 7 සිසුන්ගේ සාරධර්ම සංවර්ධනයට විදුහල්පතිවරයකුගේ වෑයමක් ...

උපාලි ගුණසේකර

වත්මන් සමාජයේ සාරධර්මවල බිඳ වැටීමක් සිදු වී ඇතියි බොහෝ දෙනා මැසිවිලි නගති. සමජයේ වගකිවයුත්තන්ට චෝදනා කරයි. එහෙත් එම විවේචනය කරන්නන්ද ඔවුන් විසින් සඳහන් කරන එම සමාජය නම් ඒකකයේ තවත් සාමාජිකයෙක් බව සිහියට නගා නොගනියි.

* මෙයට කළ යුත්තේ තුමක් ද?

* මෙයට කළ හැක්කේ කුමක් ද?

මෙම තත්ත්වයට ප්‍රධාන හේතුව ලෙස මා දකින්නේ පාසල නම් ආයතනයෙන් අපේක්ෂිතක අරමුණුවලින් සමහරක් නිසියාකාරව ඉටු නොවීමයි. වත්මන් පාසල වැඩි අවධානයක් යොමු කර ඇත්තේ විෂයමාලා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය දෙස පමණකි. පුළුල් ලෙස පාසලෙන් ඉටු විය යුතු දැනුම, ආල්ප, කුසලතා වර්ධනය කරනු වෙනුවට සිසුන්ගේ දැනුම පමණක් වර්ධනය කිරීමට පාසල මගින් උත්සාහ දරනු පෙනේ.

* දෙමව්පියන් හා සිසුන්ගේ අවශ්‍යතාවය,

* විෂයමාලාවේ පුළුල්කම

* පාසල පවත්වන දින ගණන නොයෙකුත් හේතුන් නිසා සාපේක්ෂ ලෙස අඩු විම



* එදිනෙදා නොපැමිණෙන ගුරුවරුන් වෙනුවෙන් සහන වැඩ සඳහා යෙදවීමට විශේෂඥ ගුරුවරුන්ට අමතරව පාසල තුළ අතිරේක ගුරුවරුන් නොසිටීම.

* සේවාස්ථ සැසි හා වෙනත් විෂය සමගාමී කටයුතු වෙනුවෙන් යෙදීමට සිදුවන ඉගැන්වීමට යෝජිත කාලය.

* පාසල් පාදක ඇගයීම්වලට වැය කරන අමතර කාලය

ආදිය නිසා මෙලෙස ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සඳහාම පමණක් අදාළ විනාඩි 40 ක හෝ විනාඩි 35ක කාල පරිච්ඡේදය මුළුමනින්ම යොදා ගැනීමට පාසලට සිදු වී ඇති බව පාසලේ පිළිතුර වනු ඇත.

එහෙත් සිසුන් තුළ වටිනාකම් සාරධර්ම හොඳින් වගා කර තිබුණේ නම් මෙම ඉගෙනුම් ඉගැන්වීම් කාර්යාවලිය වඩාත් සාර්ථක වන බව අවබෝධ කර ගැනීමට බොහෝ පාසල් ඒවායේ විදුහල්පති ගුරු මණ්ඩලය සැලකිල්ලක් දක්වන බවත් නොපෙනේ.

ගුරු කේන්ද්‍රිය අධ්‍යාපනය නොව සිසු කේන්ද්‍රිය අධ්‍යාපනය ලෙස හෝ ඉගැන්වීම නොව ඉගෙන ගැනීම ලෙස හෝ පන්තිකාමර අධ්‍යයන කටයුතු පිළිබඳව නව ඇසකින් බැලීමට නව අර්ථ කථනයක් දීමට යථා කාලයේ දී උත්සාහ ගත්තද තවමත් බොහෝ විට අපට දක්නට ලැබෙන්නේ පන්ති කාමරයේ ගුරවරයා මූලික වී සිදු කරන ඉගැන්වීම් රටාවටමය. අති දක්ෂ ගුරුවරයකුට පන්තියේ සියලුම සිසුන්ගේ බහුතරයකගේ අවධානය තමා කෙරෙහි රඳවා ගෙන කටයුතු කළ හැකි වුවද සාමාන්‍ය ගුරුවරයකුට පන්ති කාමරයේ සිටින 40කට එහා මෙහා වන ශිෂ්‍ය සංඛ්‍යාවේ අවධානය විනාඩි 40 තුළම ඒකාකාරී ලෙස යොමු කරවා ගැනීම විශාල ගැටලුවක් බව පැහැදිලිව දැක ගත හැකිය.

යමක් සිතට පැහැදිලිව ධාරණය කර ගැනීමට නම් ඒ සඳහා අඩුම තරමින් එම කාර්යයේ නිරත වන මොහොතේවත් නිශ්චල මනසකින් යුතුව මනා අවධානයකින් ශිෂ්‍යයා සිටිය යුතුය.

එහෙත් පන්තිකාමරවල වැඩිපුරම දක්නට ලැබෙන්නේ කිසිදු ආකාරයකින් මනස එක් අරමුණක් වෙත රඳවා ගැනීමට නොහැකි වූ සිසුන් බහුතරයකි. මේ නිසා යම් ආකාරයක සිසුන්ට ද එමෙන්ම ඉගෙනුම් ඉගැන්වීම් කාර්යාවලියේ ප්‍රමුඛයා වූ ගුරුවරයාට ද තම කාර්යය ක්‍රමවත් ව සිදු කිරීමට හැකියාවක් නොමැති වී ඇත.

එසේ නම් බහුතරයක් වූ පාසල් සන්සුන් මනසකින් යුතුව කටයුතු නොකරන්නේ ඇයි ද? යන ප්‍රශ්නයට අප පිළිතුරු සෙවිය යුතුව තිබේ. තාක්ෂණික දියුණුවත් සමඟ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මගින් සිදු වන බලපෑම,

* ආර්ථිකය හපත් කර ගැනීම පමණක්ම අරමුණු කොට ගෙන මව හෝ පියා මුදල් ඉපයීමට ප්‍රමුඛස්ථානය දෙමින් මවගෙන් හා පියාගෙන් දරුවන්ට අයිති විය යුතු කාලය, සෙනෙහස, බැඳීම පිළිබඳව ඉතා අඩු ප්‍රමුඛත්වයක් ලබා දීම,
* මේ නිසා මව, පියා වෙනුවෙන් ආදර්ශ ලබා ගැනීම සඳහා නිවැරදි නොවන පුද්ගලයන් වෙත දරුවන් යොමු වීම,
* තරඟකාරී ජීවන රටාව, තරඟකාරී විභාග ආදිය නිසා තරඟකාරී ලෝකයේ අනෙකා පරයා කටයුතු කිරීමට නිරන්තරයෙන් සිදු වීම.

ආදී නොයෙකුත් හේතූන් ගෙන හැර දැක්විය හැකිය.

එම නිසාම අනුන් ගැන ඉවසීමට, සංවේදී වීමට පුරුද්දක් ඇති නොවීම, තම පෞද්ගලික සුඛ විහරණය, තම පෙද්ගලික අභිවෘද්ධිය අනෙක් සියලු ගුණ දම් පරයා ප්‍රමුඛත්වයට පත්වීම ආදියට කුඩා කල සිටම දරුවන් යොමු වීම, පුරුදු පුහුණු වීම හා අත්දැකීම් ලැබීම වර්තමානයේ විද්‍යමාන වෙයි.

ලොවේ ජීවත් වීමේ මූඛ පරමාර්ථ සියලුදෙනාහට යහපතක් කිරීම නොව මමය, මාගේය, මටය, යන දැනුම පාසලට පැමිණෙන්නටත් පෙර සිටම දරුවන්ට අත්දැකීම් ලැබීම වර්තමානයේ විද්‍යමාන වෙයි.

කාට හෝ පින් සිදු වන්නට තවමත් පාසල නම් සංස්ථාව සමාජයට



සුවිශේෂ බලපෑමක් සිදු කළ හැකි බවට සමාජයේ හැම කෙනෙක්ගේම පිළිගැනීමක් ඇති නිසා මෙම සත් කාර්යයේ ප්‍රමුඛත්වය ගත හැක්කේ ද පාසලටමය.

මතු සඳහන් කළ පරිදිම සමාජයේ වටිනාකම් බිඳ වැටීම පිළිබඳව එකිනෙකාට දොස් පැවරීම වෙනුවට පාසල තුළින් මේ සඳහා යෙදිය හැකි පිළියම් ගැන රාජකීය විද්‍යාලයේ ගුරුවරුන් දක්වන ලද විශිෂ්ඨ කැප කිරීම තුළින් මේ වන විට ශිෂ්‍යයන්ගේ සිත් සතන් තුළ බොහෝ ගුණ දම් වැඩෙමින් කුසලතා පිරිපුන් සිසුන් බිහිවෙනු දැක ගැනීම එම ගුරුවරුන්ට ලැබුණු තුටු පඬුරු ලෙස සඳහන් කළ හැකිය. එමෙන්ම මේ වන විට පන්තිකාමරය තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මෙන්ම සමස්ත පාසලේ විනය පවත්වා ගෙන යාම සඳහා ද මෙම වැඩ සටහන මනා පිටුවහලක් වී ඇති බව වෙසෙසින්ම සඳහන් කළ හැකිය.

මේ සඳහා මේ වන විට කාල සටහනේම විනාඩි 5ක් වෙන් කර ඇති අතර දිනපතා උදේ 8.05 සිට 8.10 දක්වා වූ කාලය තුළ පන්ති භාර ගුරුවරයා සහ සිසුන් අතර යම් සාරධර්මයක් පිළිබඳ කෙටි සාකච්ඡාවක් සිදු කිරීමට සංවිධානය කර ඇත. මෙය සමහර විට ගුරුවරයා විසින් කරනු ලබන කරුණු පැහැදිලි කිරීමක් ලෙස ද පන්තියේ ශිෂ්‍යයකු විසින් තම සහෝදර සිසුන් වෙත කරනු ලබන පැහැදිලි කිරීමක් ලෙස ද එසේත් නැතිනම් පන්තියම සහභාගි වන කෙටි සංවාදයක් ලෙස හෝ ඒවායේ සංකලනයක් ලෙස ද සිදුවන අතර ඒ දිනයට නියමිත තේමාව හා සිදු කරන ආකාරය ඔවුන්ම තීරණය කරනු ලබයි. මේ සඳහා යොදා ගත් තේමා කිහිපයකට උදාහරණ මෙලෙස දැක්විය හැකිය.

* පොදු දේපළ සුරකිමු.
* පිසිදුකම අගයමු
* හොඳ වචන කථා කරමු
* එක කටක් කන් දෙකක්

* ඉවසීමෙන් සැනසීම ලැබේ
* Smart Worker and Hard Worker
* බල්ලා බලූ කමට කැවට මගෙ කකුල මා කනවද බල්ලාගේ බලූ කකුල

පාසලට / පාසල් පද්ධතියට අලුත් වැඩ සටහනක් වූ නිසාම ප්‍රමිතියකින් හා ක්‍රමවත් බවකින් පවත්වාගෙන යාමේ අදහසින් මෙම සංවාදය කෙටියෙන් වාර්තා කිරීමට පන්ති භාර ගුරුවරයා මගින් පන්තියේ සිසුන් තිදෙනකුට වගකීම භාරදීමට කටයුතු කරන ලද අතර මෙම සියලු වාර්තා සති අන්තයේ දී මා පෞද්ගලිකවම කියවා මගේ නිරීක්ෂණ සටහන් කිරීමට ද කටයුතු කරන ලදි. මේ නිසා වැඩ සටහනේ අඩු ලුහුඬුකම් මග හැරවීමට හා මනා පාලනයක් ඇති කිරීමට හැකියාව ලැබූ අතර ගුරු සිසු කණ්ඩායම් දෙකම උනන්දු කරවීමක් ද නිරායාසයෙන් ම සිදු විය.

කුඩා සභාවක් ඉදිරියට පැමිණ තමාගේ අදහස් ඉදිරිපත් කිරීමට උකටලී බවක් දැක්වූ සිසුන්ට මේ නිසා අනිවාර්යයෙන්ම ඒ සඳහා යොමුවීමක් සිදු වූ අතර පන්තියේ ඉදිරියට පැමිණ කරනු ලබන ඉදිරිපත් කිරීමක දී සුළු අතපසුවීමක් තම මිතුරකුගෙන් සිදු වූ විට එය උපහාසයට ලක් කරන්නට උත්සාහ කළ සිසුන්ට එම අත්දැකීම් තමන්ටම විඳීමට ද අවස්ථාව ලැබුණුවිට කාර්යයේ බැරෑරුම්කම අවබෝධ කර ගත හැකි විය.

ගුරුවරයෙක් හෝ වෙනත් වැඩිහිටියෙක් ලබා දෙන උපදෙසකට වඩා තම සම වයස් කණ්ඩායමේ සාමාජිකයකු විසින්ම ලබා දෙනු ලබන උපදෙසක් වඩාත් හොඳින් සිතට කාවැදීම මෙහි දී දැක ගත හැකි වූ අතර ගුරුවරයාට පන්තිය මෙහෙයවීමේ දී අත් දකින්නට සිදු වන ගැහැට පිළිබඳව පෞද්ගලිකව ම අත්දැකීමක් ලබා ගැනීමට පන්තිය ඉදිරියට එන ශිෂ්‍යයාට ද නිතැතින්ම ඉඩකඩ ලැබේ. මේ නිසා ගුරුවරයා ඉගැන්වීම් කාර්යයේ යෙදෙනවිට අන් අයට බාධා නොකර සිටීමේ වැදගත්කම හොඳින් අවබෝධ කර ගත හැකි විය.

එම සාරධර්ම පිළිබඳව අඩුම තරමේ සිසුන් කිහිප දෙනෙකුගේ හෝ සිතට තදින් කා වැදී ඇති අයුරු මෙයින් හොඳින් විද්‍යමාන වේ.



# 8 පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමාව

## පර්යේෂණ මාතෘකා RESEARCH TOPICS (PGDEM) 1994/1995

විල්ෆ්‍රඩ් ජේ පෙරේරා

ජාතික අධ්‍යාපන ආයතනය මගින් මෙහෙයවනු ලබන පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවේ පර්යේෂණ ව්‍යාපෘතීන්හි මාතෘකා මෙහි පළ වේ. 2005 වර්ෂයේ සිට සති අන්ත පාඨමාලාවක් වශයෙන් ද සංවිධානය කොට ක්‍රියාත්මක වෙයි.

මෙම පාඨමාලා කෙකෙහිම කාලසීමාව වසරක් වන අතර පූර්ණ කාලීන පාඨමාලාවේ පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා මාස හතරක කාලයක් ද සති අන්ත පාඨමාලාව සඳහා මාස හයක කාලයක් තුළ මෙම පර්යේෂණ අභිමත භාෂාවකින් ඉදිරිපත් කළ හැකි අතර එය පදනම් කොට ගෙන මෙම නාමාවලිය සකස් කර ඇත.

මෙම ලිපිය කලින් පළ වූ ලිපි මාලාවක තෙවැන්නයි. ජාතික අද්‍යාපන ආයතනය විසින් මෙහෙයවනු ලබන පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවේ පර්යේෂණ ව්‍යාපෘතීන්හි මාතෘකා මෙහි පළ වේ. කාල සීමාව වසරක් වන මෙම පාඨමාලාවේ පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා ඩිප්ලෝමාධාරීන්ට අභිමත භාෂාවකින් මාස හතරක කාලයක් තුළ මෙම පර්යේෂණය ඉදිරිපත් කළ හැකි අතර එය පදනම් කොට ගෙන මෙම නාමාවලිය සකස් කොට ඇත. 1987-88 හා 1988-89 වසරවල පර්යේෂණ නාමාවලිය අධ්‍යාපන කළමනා, 11 වන කලාපයේ (1996 ජූනි), පළ වූ අතර 1990 හා 1991 වසරවල පර්යේෂණ නාමාවලිය 12 වන කලාපයේ (1996 දෙසැම්බර්) පළ විය. 1992 වර්ෂයේ පර්යේෂණ නාමාවලිය 13 වන කලාපයේ (1999) පළ විය. 1993 වර්ෂයේ පර්යේෂණ මාතෘකා 14 වන කලාපයේ

(2004, ජුනි-දෙසැම්බර්) පළ විය.  1994 -1995 වර්ෂවල පර්යේෂණ මාතෘකා මෙහි පළ වෙයි.  මෙය සකස් කිරීමේ දී පර්යේෂණ මාතෘකාව, පර්යේෂකයාගේ නම හා එමගින් ආවරණය වන තේමාව/තේමා දක්වා ඇත.

| | | |
|---|---|---|
| Accountablility | වගවීම | (01) |
| Classroom Management | පන්ති කාමර කළමනාකරණය | (02) |
| Cluster System | පර්ෂද ක්‍රමය | (03) |
| Curriculum Managmenet | විෂයමාලා කළමනාකරණය | (04) |
| Communication | සන්නිවේදනය | (05) |
| Community Relations | ප්‍රජා සබඳතා | (06) |
| Computer Education | පරිගණක අධ්‍යාපනය | (07) |
| Continues Assessment | අඛණ්ඩ තක්සේරංව | (08) |
| Counselling | උපදේශනය | (09) |
| Curriculum Managemenet | විෂයමාලා කළමනාකරණය | (10) |
| Decntralization | විමධ්‍යගතකරණය | (11) |
| Decision - Making | තීරණ ගැනීම | (12) |
| Deputy Principalship | නියෝජ්‍ය විදුහල්පතිත්වය | (13) |
| Directorship | අධ්‍යක්ෂත්වය | (14) |
| Role of Divisional Office | කොට්ඨාස කාර්යාලයේ භූමිකාව | (15) |
| Drop outs | පාසලෙන් ඇදහැලෙන්නන් | (16) |
| Educational costs | අධ්‍යාපනික වියදම් | (17) |
| Education law | අධ්‍යාපන නීතිය | (18) |
| E M I S | අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය | (19) |
| G. C. E. (O/L) | අ.පො.ස. (සා.පෙළ) | (20) |
| G. C. E. (A/L) | අ.පො.ස. (උසස් පෙළ) | (21) |
| Home-School Relations | ගෘහ - පාසල් සබඳතා | (22) |
| Human Relations Managment | මානව සම්පත් කළමනාකරණය | (23) |
| Instructional Programme | උපදේශාත්මක වැඩ සටහන | (24) |
| Interviews as a Methodology (Selection) | සම්මුඛ පරීක්ෂණ ක්‍රමයක් වශයෙන් (තෝරා ගැනීමේ) | (25) |
| Master Teachers | ගුරු උපදේශකවරු | (26) |
| Mathematics Education | ගණිත අධ්‍යාපනය | (27) |
| Muslim Schools | මුස්ලිම් පාසල් | (28) |
| National Schools | ජාතික පාසල් | (29) |
| Non-Formal Education | නොවිධිමත් අධ්‍යාපනය | (30) |



| | | |
|---|---|---|
| Parental Perceptions | දෙමාපිය සංජානනය | (31) |
| Participatory Management | සහභාගිත්ව කළමනාකරණය | (32) |
| Physical Education | ශාරීරික අධ්‍යාපනය | (33) |
| Planning | සැලසුම්කරණය | (34) |
| Plantation Sector | වතුකරය | (35) |
| Pre-Schools | පෙර පාසල් | (36) |
| Primary Schools | ප්‍රාථමික පාසල් | (37) |
| Private Education | පෞද්ගලික අධ්‍යාපනය | (38) |
| Project Implementation | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | (39) |
| Reforms | ප්‍රතිසංස්කරණ | (40) |
| Rural Schools | ග්‍රාමීය පාසල් | (41) |
| Scholarship Examination - Grade 5 | 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය | (42) |
| Science | විද්‍යාව | (43) |
| Sectional Heads | අංශ ප්‍රධානීන් | (44) |
| Small Schools | කුඩා පාසල් | (45) |
| Social-economic Factors | සමාජ-ආර්ථික සාධක | (46) |
| Special Education | විශේෂ අධ්‍යාපනය | (47) |
| Staff Development | කාර්ය මණ්ඩල සංවර්ධනය | (48) |
| Student Admission | ශිෂ්‍ය ඇතුලත්වීම | (49) |
| Student Attendance | ශිෂ්‍ය පැමිණීම | (50) |
| Student management | ශිෂ්‍ය කළමනාකරණය | (51) |
| Supervision | අධීක්ෂණය | (52) |
| Teacher absenteeism | ගුරු නොපැමිණීම | (53) |
| Teacher Appraisal | ගුරු ඇගයීම | (54) |
| Teacher Attitudes | ගුරු ආකල්ප | (55) |
| Teacher Behaviour | ගුරු චර්යාව | (56) |
| Teacher Colleges | ගුරු විද්‍යාල | (57) |
| National Colleges of Education | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | (58) |
| Teacher Motivation | ගුරු අභිප්‍රේරණය | (59) |
| Teacher performance | ගුරු කාර්ය සාධනය | (60) |
| Teaching as a profession | ඉගැන්වීම වෘත්තියක් ලෙස | (61) |
| Training | පුහුණුව | (62) |

.

## පර්යේෂණ මාතෘකා (Research Topics) - 1994

| කර්තෘ | පර්යේෂණ මාතෘකාව | තේමා |
|---|---|---|
| ඩී. පී. අමරකෝන් | ගම්පහ දිස්ත්‍රික් මීනුවන්ගොඩ අධ්‍යාපන කොට්ඨාසයේ ග්‍රාමීය මට්ටමේ පාසල් 7ක ශිෂ්‍ය සංඛ්‍යාව අඩුවී යාමේ ගැටලුව හා එයට හේතු වන කළමනාකරණ හා සමාජ ආර්ථික සාධක පිළිබඳ අධ්‍යයනයක්. | (41) (50) (16) (46) |
| එන්. ආරියරත්න | බේරුවල නගර සීමාව තුළ ධීවර පරිසරයක් පිහිටි පාසල්වල පළමු වසරට පිවිසෙන ළමුන්ගේ ප්‍රවේශ දක්ෂතා 1 වසරේ විෂයමාලාව කළමනාකරණයට බලපාන ආකාරය පිළිබඳ විමර්ශනයක් | (44) (41) (49) (50) |
| බී. එම්. සී. බාලසූරිය | අධ්‍යාපන කළමනාකරණ විග්‍රහයක් | (19) (23) (48) |
| කේ. එච්. පී. ධනපාල | සිසුන්ගේ සාධන මට්ටම පහළ වැටීම කෙරෙහි බලපාන සාධකයක් වශයෙන් ගුරුවරුන්ගේ නොපැමිණීම නාගරික/නොදියුණු පාසල් කෙරෙහි වෙසෙසී බලපෑමක් කෙරේ ද? | (44) (47) (53) |
| එම්. ග්‍රේස් ප්‍රනාන්දු කන්‍යා සොහොයුරිය | කුරුණෑගල හා කුලියාපිටිය අධ්‍යාපන කලාපවල තෝරා ගත් ජාතික පාසල් 4ක 13 වසර ජීව විද්‍යා සිසුන් උපකාරක පන්ති සඳහා යොමු වීමට ඉවහල්වන සම්පත් කළමනාකරණ දුර්වලතා පිළිබඳ විග්‍රහයක් | (29) (43) (19) 32) (04) |
| එච්. එම්. ඩබ්ලිව්. ගුණවර්ධන | ගුරු නොපැමිණීම ආවරණය කරන කළමනාකරණ පිවිසුම් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් | (53) (48) (02) (32) |
| එස්.කේ. ජයකොඩි | දුර ප්‍රදේශවල සිට පැමිණෙන ශිෂ්‍යයින් නිසා මතුවන කළමනාකරණ ගැටලු (සැ. 15කට වැඩි දුරක් දිනපතා පාසල් එන ශිෂ්‍යයින් මුහුණ දෙන ගැටලු) | (02) (46) (49) |
| ආර්. එම්. ජයසේකර | විදුහල්පතිවරයාගේ නායකත්වය උප ගුරුවරුන් සංජානනය කරන ආකාරය විමසා බැලීමක් | (01) (18) (23) (05) (48) |



| කර්තෘ | පර්යේෂණ මාතෘකාව | තේමා |
|---|---|---|
| බී. එච්. එස්. ජයවර්ධන | මැද කොළඹ මාළිගාවත්ත කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයට අයත් තෝරා ගත් පාසලක ඉගෙනුම් කාලය නාස්තිය කෙරෙහි බලපාන සාධක පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් | (16) (41) (45) (49) (50) |
| එස්. අප්පුතන්ත්‍රී කංකානම්ගේ | කොළඹ දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල් 5ක් ඇසුරින් පාසල් ශිෂ්‍ය උපදේශන මාර්ගෝපදේශ ව්‍යවහාරයන් පිළිබඳ අධ්‍යයනයක් | (24) (09) |
| ජේ. එන්. කත්‍රිආරච්චි | ශ්‍රී ලංකාවේ ජාතික පාසල්හි ක්‍රියාත්මක වන ප්‍රධාන භූමිකාවේ ඵලදායකත්වය සම්බන්ධයෙන් කරනු ලබන විමර්ශනාත්මක අධ්‍යයනයක් | (29) (13) (44) (60) |
| ටී. එම්. එස්. කාරියවසම් | ශ්‍රී ලංකාවේ හික්කඩුව කොට්ඨාසයේ නව යෞවනයන්ගේ අවදානම් චර්යා රටාවන් පාසල් විනය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ තෝරා ගත් පාසල් 5 ඇසුරෙන් කරනු ලබන අධ්‍යයනයක්. | (24) (22) (09) (51) |
| ඩබ්ලිව්. ඩබ්ලිව්. කුලරත්න | සීඩා ආධාර ලබන දුෂ්කර පාසල්හි ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය පිළිබඳ අධ්‍යයනයක් | (02) (06) (37) (41) (45) |
| ඒ. කුලසේකර | පාසල්වලට 1 සහ 2 වසර පන්ති භාර ගුරු භවතුන් එම පන්ති නිමවීමෙන් පසු පාසලේ ගත කරන කාලය ඵලදායිව යොදා ගැනීම පිළිබඳ අධ්‍යයනයක් | (37) (45) (02) |
| ඒ. ඒ. කුමාරසිංහ | ශ්‍රී ලංකාවේ ග්‍රාමීය රජයේ පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව අඩුවීම කෙරෙහි බලපා ඇති හේතු සාධක පිළිබඳ අධ්‍යයනයක් | (29) (43) (19) (32) (04) |
| කේ. කුමාරසිං හ | 3 වර්ගයේ පාසල්වල සිසුන් තුළ ඉගෙනීමට ඇති පෙළඹවීමේ ස්වභාවය සඳහා නිවසින් හා පාසලින් කෙරෙන බලපෑම පිළිබඳ විමර්ශනයක් | (45) (61) (52) (59) |

| කර්තෘ | පර්යේෂණ මාතෘකාව | තේමා |
|---|---|---|
| ජ්. කුසුමා | ගණිතය විෂය ඉගැන්වීමේ දී පාසල්වල භාවිත කරන පන්ති කාමර කළමනාකරණ උපක්‍රමයන් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්. | (27) (02) (04) |
| එස්. ලියනගේ | 1991 තරග විභාග මත පත්වීම් ලැබූ විදුහල්පති ශ්‍රේණිධාරීන් විධිමත් ලෙස සේවයේ යොදා ගන්නේ කෙසේ ද? යන්න පිළිබඳ අධ්‍යයනයක්. | (27) (02) |
| කේ. ජී. කේ. ආර්. එස්. මැණිකේ | පාසල් අධ්‍යාපනය අතරමග දී හැරයාම අවම කිරීම සඳහා කළමනාකරණය ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ අධ්‍යයනයක් | (16) (02) (04) (06) (31) |
| කේ. එච්. ඒ. නන්දනී | කෘෂිකර්ම විෂයයේ ප්‍රායෝගික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමේ දී අධ්‍යාපන කළමනාකරුවන්ට දායක විය හැකි ආකාරය පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක් | (10) (19) (34) |
| එච්. එස්. එස්. පෙරේරා | පාසල්වල ද්විතියික අධ්‍යාපන තලයේ විෂයමාලා සංවර්ධන ක්‍රියාවලියෙහි විෂය සමගාමී ඉගෙනුම් අවස්ථා සම්පාදනය පිළිබඳ විමර්ශනයක් | (04) (02) |
| එච්. එල්. රණසිංහ | අවාසි සහගත විදුහල්වල ප්‍රාථමික සිසුන්ගේ අධ්‍යාපනික සහභාගිත්වය වැඩි දියුණු කිරීමෙහිලා විදුහල්පතිවරුන්ගේ මැදිහත්වීමේ කාර්යභාරය | (45) (41) (37) (50) |
| එච්. එම්. පෙරේරා | පන්ති කාමර වාතාවරණය යටතේ ශිෂ්‍ය අභිප්‍රේරණය කෙරෙහි ගුරුවරයා හා සමවයස් කණ්ඩායම් බලපෑම පිළිබඳ සමීක්ෂණ අධ්‍යයනයක් | (02) (56) (62) |



| කර්තෘ | පර්යේෂණ මාතෘකාව | තේමා |
|---|---|---|
| පී.පී. එස්. පෙරේරා | ගුරුවරුන්ගේ වෘත්තිය සංවර්ධන සඳහා රත්මලාන කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය ගෙන ඇති ක්‍රියා මාර්ග පිළිබඳ අධ්‍යයනයක් | (19) (23) (15) |
| ඩබ්.ඩී. ප්‍රේමතිලක | ප්‍රාථමික පාසල්වල සිදු වන භෞතික සම්පත් නාස්තිය කළමනාකරණය තුළින් වළක්වා ගැනීම | (37) (45) (02) |
| එන්. කේ. සමරසිංහ | පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී පාඩම් සඳහා පෙර සූදානම වැඩි කිරීමට ශ්‍රී ලංකාවේ 6-11 වසරට අදාළ ගුරුවරුන් පෙළඹවීම පිළිබඳ අධ්‍යයනයක් | (02) (59) (55) (56) (54) (52) (04) |
| ජී. එස්. සේනානායක | ශ්‍රී ලංකාවේ පාසල්වල ගුරු මණ්ඩල තුළ පවතින අවිධිමත් කණ්ඩායම් මගින් පාසල් කළමනාකරණය කෙරෙහි බලපෑම | (55) (56) (53) (26) |
| එම්. සී. පී. සේනානායක | ප්‍රාථමික පන්තිවල ශිෂ්‍යයන්ගේ සාක්ෂර දුර්වලතා කෙරෙහි පාසල් විෂයමාලා කළමනාකරණය බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනයක් | (37) (02) (04) |
| එන්. එම්. සේනානායක | ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දරිද්‍රතාව පාසල් කළමනාකරණයේ බලපෑම | (46) (35) (41) (16) (32) |
| බර්නදෙත් සිල්වා කන්‍යා සොහොයුරි | ශ්‍රී ලංකාවේ පාසල් සංවර්ධනය සඳහා ප්‍රජා සහභාගිත්වයේ දායකත්වය හීනවීමට තුඩු දී ඇති සාධක පිළිබඳ ව සොයා බැලීම | (06) (46) (31) (22) |

| කර්තෘ | පර්යේෂණ මාතෘකාව | තේමා |
|---|---|---|
| පී.ආර්. සිල්වා | පාසල කාර්යක්ෂම හා ඵලදායි ආයතනයක් ලෙස සංවර්ධන කිරීමේ දී පාසල් සංවර්ධන සමිති යොදා ගත හැකි ආකාරය පිළිබඳ අධ්‍යයනයක | (01) (12) |
| ජී. එම්. එස්. කේ. ද සිල්වා | කොළඹ දිස්ත්‍රික්කයේ තෝරා ගත් පෙර පාසල් තුනක් ආශ්‍රිතව තොරතුරු විමසීමෙන් ශ්‍රී ලංකාවේ පෙර පාසල්හි කළමනාකරණය පිළිබඳ ගැටලු අධ්‍යයනයක් | (19) (31) (36) |
| එම්. ටී. අයි. ද සිල්වා | ශාරීරික අධ්‍යාපන විෂය, පාසල් විෂයමාලාව තුළ ක්‍රියාත්මක කිරීමේ දී ඇති වන ගැටලු පිළිබඳ අධ්‍යයනයක් | (04) (10) (33) |
| ආර්. ජී. සිරිමා | පාසල් පිරිස් සඳහා සේවා අවශ්‍යතා ඉටු කිරීමේ දී වඩා සතුටුදායක සේවාවක් ලබාදීම පිණිස කොට්ඨාස අධ්‍යාපන කාර්යාල සකස් විය යුතු ආකාරය පිළිබඳ අධ්‍යයනයක්. | (15) (14) (48) (39) |
| ආර්. සූරවීර | ශ්‍රී ලංකාවේ පාසල්වල කාල නාස්තිය අවම කිරීම සඳහා කාලය කළමනාකරණය කිරීම පිළිබඳ අධ්‍යයනයක් | (02) (04) (11) |
| වැලිපිටියේ සුමේධ හිමි | ශ්‍රී ලංකාවේ පාසල්වල 10 වසර සිසුන්ගේ සදාචාර විනිශ්චය හැකියාව සහ ඒ සඳහා පාසල් කළමනාකරණ දායකත්වය විමසීම | (20) (02) (23) |
| ඒ. එල්. ජී. උපසේන | ශ්‍රී ලංකාවේ පාසල්වල සනීපාරක්ෂාව පිළිබඳව ඇති අවධානය හා කළමනාකරණ ක්‍රියාවලිය තුළ ඒ කෙරෙහි වූ බලපෑම පිළිබඳ අධ්‍යයනයක් | (04) (10) (33) |
| ඩබ්. ආර්. එල්. එම්.වීරක්කොඩි | විද්‍යා ගුරුවරුන්ගේ 6-11 වසර විද්‍යා විෂයමාලාව කළමනාකරණ කුශලතාව පිළිබඳ විමර්ශනයක් (ගම්පහ දිස්ත්‍රික් පාසල්) | |



| කර්තෘ | පර්යේෂණ මාතෘකාව | තේමා |
|---|---|---|
| පී. ජී. අයි. විජේවර්ධන | තෝරා ගත් නාගරික පාසලක ජ්‍යෙෂ්ඨ ද්විතියික මට්ටමේ දී සමාජ අධ්‍යයනවිෂයයේ සාධන මට්ටම කෙරෙහි පන්ති කාමර ඉගැන්වීමේ ක්‍රම බලපාන ආකාරය | (20) (04) (56) |
| M. Azhar | Development of Education Information System. (Tamil) | (05) |
| N Chandraganthan | Curriculum Management in G.C.E (A/L) Classes of Tamil Medium Schools in Gampaha District | (04) (21) |
| J.M.K.B. Hajarjhan | A Study on the Impact of Annual Implementation Planning in Systematic Administration and School Development | (34) |
| S. Joseph | The Study of the Management Factors that Effect the Achievement Level of G.C.E. (A/L) Students in 1ABC Tamil Medium Schools in Nuwara Eliya District. | (21) (29) (02) (32) |
| H. W. Samoo | A Study on the Nature and Levels of School Community Relations on School Development in Six Selected 1AB, Type II and Type III Schools in Gampola Region | (37) (29) (06) (05) |
| K. Sivagnanam | A Competitive Study of the Roles of Principals in Relation to the Performance in Mathematics in the G.C.E (O/L) Classes in Nuwara Eliya Division | (37) (29) (06) (05) |
| A. Suntharalingam | The Impact of Internal Supervision on the Effecftiveness of Teaching and Learning Process in Selected Type 1 and II Tamil Medium Schools in the Alapone Education Division. | (52) (56) (60) (62) (41) (29) |

| කර්තෘ | පර්යේෂණ මාතෘකාව | තේමා |
|---|---|---|
| S. Sethrajale | The Impact of Managment of Human Resource on the Results of Maths and Science at G.C.E (O/L) Examinations in the Tamil Medium Schools of Kotmale Education division | (23) (43) (27) (20) |

## පර්යේෂණ මාතෘකා (Research Topics) - 1995

| කර්තෘ | පර්යේෂණ මාතෘකාව | තේමා |
|---|---|---|
| ඒ. ඒ. ආර්. අතපත්තු | ඇලහැර ප්‍රාදේශීය අධ්‍යාපන කොට්ඨාසය තුළ පාසල්වල ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය හා බැඳුනු අභ්‍යන්තර අධීක්ෂණය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් | (15) (52) (61) |
| ඒ. සී. අතුකෝරාල | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 3 වන පන්තියට විවෘත තරග විභාගයෙන් පත් වූ නිලධාරීන්ගේ අපේක්ෂිත හා සැබෑ කළමනාකරණ කාර්ය සාධනය සම්බන්ධයෙන් එම නිලධාරීන්ගේ සංජානනයන් පිළිබඳව කරනු ලබන විමර්ශනාත්මක අධ්‍යයනයක් | (19) 13) |
| කේ. ඒ. අමරසිංහ | ශ්‍රීලංකාවේ පාසල්වල භෞතික සම්පත් නාස්තිය (හෝ/කළපළුවාව සිද්ධාර්ථ මහා විද්‍යාලය ඇසුරෙන් කෙරෙන අධ්‍යයනයක්. | (23) (17) (18) |
| ජී. ආරියසේන | ගුරුවරුන් නිතර නිවාඩු ගැනීම, ප්‍රමාද වී පැමිණීම, වේලාසනින් බැහැර යාම යන කරුණු නිසා විදුහල්පතිට මුහුණපෑමට සිදුවන ගැටළු සහ ඒවා විසඳා ගැනීමට ගනු ලබන උපාය මාර්ග | (53) (55) (60) |
| ඩී. අබේවික්‍රම | විෂය සමගාමී කටයුතු ඵලදායි ලෙස සංවිධානය කිරීම සඳහා පාසල් කළමනාකරණය කෙතෙක් දුරට ඉවහල් කර ගන්නේද ? (කෑගල්ල දිස්ත්‍රික්කයේ 1ඒබී වර්ගයේ පාසල් 5ක් ඇසුරෙන් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්) | (29) (02) (19) |



| කර්තෘ | පර්යේෂණ මාතෘකාව | තේමා |
|---|---|---|
| එස්. ජී. අබේකෝන් | කුඩා පාසල්වල විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (වැල්ලවාය අධ්‍යාපන කලාපය ඇසුරෙන්) | (37) (45) (10) |
| පී. එම්. චන්ද්‍රලතා | පාසල් මානව සම්පත් කළමනාකරණය වඩාත් සාර්ථක කර ගැනීම සඳහා විධිමත් සන්නිවේදන ක්‍රියාවලිය කොතරම් දුරට ඉවහල්වේ ද? | (05) (02) (04) (23) (32) |
| කේ. ධම්මසිරි හිමි | පාසල් කළමනාකරණයෙහි ලා ශිෂ්‍ය නායක ඒකකයේ ක්‍රියාකාරිත්වය සහ පාසලේ අභ්‍යන්තර පිරිස් එය සංජානනය කිරීම පිළිබඳ ව විමසුම් අධ්‍යයනයක් | 02) (32) (51) |
| පී. ධම්මවංශ හිමි | පාසල් තුළ භෞතික සම්පත් බෙදා හැරීම පිළිබඳ කළමනාකරණය ශිෂ්‍ය අවශ්‍යතා අනුව සිදුවී තිබේ ද? යන්න පිළිබඳ මහනුවර දිස්ත්‍රික්කයේ පාසල් ඇසුරින් කෙරෙන විමර්ශනයක්. | (32) (39) |
| කේ. හෙට්ටිආරච්චි | තෝරාගත් පාසලක 11 වසර සිසුන් ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි විෂයයන් සඳහා පෞද්ගලික අධ්‍යාපන ආයතනවලට සහභාගිවීමේ ප්‍රවනතාවයන් පිළිබඳ අධ්‍යයනයක්. | 43) (27) (20) |
| ඩබ්. හේවාවිතාරණ | උසස් පෙළ විද්‍යා අධ්‍යාපන අවස්ථා සැලසීමේ විධිමත් පාසල් ක්‍රමයෙහි ශක්තීන් හා දුබලතා පිළිබඳ අධ්‍යයනයක් | (21) (43) |
| බී. එන්. හේරත් | පාසල් විෂය සමගාමී කටයුතු කළමනාකරණයේ දී ගුරු සහභාගිත්වය ලබා ගැනීමට බලපාන සාධක පිළිබඳ අධ්‍යයනයක් | (56) (32) |
| එච්. එල්. එන්. ලක්ෂමන් | ශ්‍රී ලංකාවේ විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයේ කළමනාකණ සංවර්ධනය සඳහා පත් කරන ලද සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ අපේක්ෂිත හා සැබෑ කාර්ය සාධනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්. | (47) |

| කර්තෘ | පර්යේෂණ මාතෘකාව | තේමා |
|---|---|---|
| එම්. ඩී. එෆ්. මාකස් | ශ්‍රී ලංකාවේ කණිෂ්ඨ ද්විතියක පාසල්වල තාක්ෂණ කුසලතා විෂයයන්හි ඉගෙනුම් ක්‍රියාවලිය සංවර්ධනය සඳහා අධීක්ෂණ භූමිකාවන්ගේ කාර්ය භාරය පිළිබඳ අධ්‍යයනයක් | (52) (10) (04) |
| බී. ජ්. මුතුබණ්ඩා | කණිෂ්ඨ ද්විතියික විෂය මාලාවේ සමාජ අධ්‍යයන විෂය තුළින් මානව හිමිකම් පිළිබඳ සංකල්පය සාධනය කෙරෙහි ඉගැන්වීම් කළමනාකරණ ක්‍රම ශිල්පවල බලපෑම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් | (37) (04) (23) (61) |
| එන්. ඩී. ජ්. පේමලතා | ශ්‍රී ලංකාවේ පාසල්වලින් ශිෂ්‍යයන් ගිලිහී යාමට පාසල බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනයක් | (16) (22) (06) (53) (56) |
| එම්. ඊ. එම්. ප්‍රනාන්දු | අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියේ තොරතුරුවල නිවැරදිතාවයට බලපාන ගැටලු පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් | (19) (05) |
| ඕ. එම්. පියශීලි | උතුරු කොළඹ කොට්ඨාසයේ පාසල්වල දරුවන්ගේ අධ්‍යාපන සාධන මට්ටම දියුණු කිරීම සඳහා කළමනාකරණ ක්‍රියාවලිය සංවර්ධනය කිරීමෙන් ලද හැකි දායකත්වය පිළිබඳ අධ්‍යයනයක්. | (51) (32) (10) (02) (23) |
| බී.වී.ඩී.ජී.ජී රවීන්ද්‍රනාත් | කොළඹ දිස්ත්‍රික්කයේ පාසල් 5ක් පාදක කොට ගෙන ශිෂ්‍යභට කටයුතුවල ක්‍රියාකාරිත්වය පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් | (30) (06) (33) |
| බී. එම්. රත්නායක | ගුරු භූමිකාවේ ඵලදායිතාවය සඳහා විදුහල්පතිවරුන් විසින් යොදා ගන්නා අභිප්‍රේරණ ක්‍රම පිළිබඳ විමසුමක්. (කොළඹ, රත්මලාන අධ්‍යාපන කොට්ඨාසයට අයත් සහේතුක ලෙස තෝරා ගන්නා ලද පාසල් 5ක් ඇසුරෙන්) | (59) (56) (54) (60) (13) |
| වී. රාජපක්ෂ | අ.පො.ස (සා.පෙ) විභාගයේ ගණිතය විෂයයේ සාධන මට්ටම හා එහි ඵලදායිතාවය කෙරෙහි බලපාන විවිධ සාධක කළමනාකරණ ක්‍රියාලිය තුළින් විමර්ශනාත්මක අධ්‍යයනයක් | (27) (20) (10) |



| කර්තෘ | පර්යේෂණ මාතෘකාව | තේමා |
|---|---|---|
| එච්.ඩී.ඩී. සීලවති | ජනප්‍රිය පාසල්වල 1 වසරට ළමුන් ඇතුළත් කර ගැනීම හා විදුහල්පති ගැටලු පිළිබඳ අධ්‍යයනයක් | (29) (49) |
| කේ. ඩී. සුමනාවතී | ප්‍රජා සහභාගිත්වය පාසල් කළමනාකරණයට කොතෙක් දුරට ඉවහල් කර ගෙන ඇත්දැයි බැලීම අධ්‍යයනයක් | (06) (02) (04) (51) |
| පී. ජී. සිරිසේන | ප්‍රාථමික පන්තිවල විවිධ සාධන මට්ටම් දක්වන සිසුන් පිළිබඳව පන්ති කාමර කළමනාකරණයේ ගුරුවරුන් අනුමනය කරන උපාය මාර්ග පිළිබඳ ව අධ්‍යයනයක් | (37) (02) (56) |
| එල්. කේ. පී. විජේරත්න | ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය කෙරෙහි ජාත්‍යන්තර පාසල්වල බලපෑම (තෝරාගත් ජාත්‍යන්තර පාසලක් ඇසුරෙන් කෙරෙන අධ්‍යයනයකි) | (38) (18) |
| ජී. බී. විජේසුන්දර | පාසල් කළමනාකරණය සඳහා නව පරිපාලන ව්‍යූහ සැලසුම් කිරීමේ දී පර්ෂද පාසල් ක්‍රමයෙන් ලබාගත හැකි පූර්වාදර්ශයන් පිළිබඳ අධ්‍යයනයක් (මාතලේ අධ්‍යාපන දිස්ත්‍රික්කය) | (03) (02) (10) |
| එස්. එම්. වැලිවිට | ප්‍රාථමික සිසුන්ගේ ජීවන පරිපෝෂණ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට අදාළ වන්නාවූ අධ්‍යාපනික සම්පත්වලින් පහළ ප්‍රාථමික සිසුන්ගේ ජීවන පරිපෝෂණ අවශ්‍යතා කොතෙක්දුරට සම්පූර්ණ වී තිබේදැයි තෝරාගත් පාසල් කීපයක් අශ්‍රයෙන් කෙරෙන විමසීමක්. | (37) (17) |
| C.Arulmoly | The effects of Teacher Absenteeism on Teaching-learning Process and Management of the School Nuwara-eliya | (53) (02) (23) |
| G. Jaganathan | The Role of the Principals in Classroom Supervision a Survey. | (52) (13) |
| K. Kathiresu | ◦A study on the Influence of Internal Supervision on the Achievement level in selected Subjects in Tamil Medium Schools in the Hatton Division.ර් | (52) (04) |

| කර්තෘ | පර්යේෂණ මාතෘකාව | තේමා |
| --- | --- | --- |
| M. Meerabiba | A Study on the influencing Factors in the Formation of Information groups in Schools Management in Some Selected Schools in the Kalmunai Education Zoneග | (02) (04) |
| L.A. Mubarack | A Study of School Mapping in Nintavur Education Division. | (11) (34) |